

# විසුංගාමසීමා විනිච්ඡයං

# Visungama Seema Vinichchhaya

BY

PARIYATTISASANAHITA DHAMMACHARIYA

AGGADHAMMABHIWANSA MAHATHERO

*Chief High Priest*

OF THE

MAHAVISUDDHARAMA

MANDALAY, BURMA.

---

PRINTED & PUBLISHED BY

J. D. DHARMASENA

AT THE

GRANTHAPRAKASA PRESS, COLOMBO.

---

B. E. 2470

C. E. 1926



බුරුම රට මන්තලේ නුවර මහාවිශුද්ධාරාමයෙහි
ප්‍රධාන ගණවාචකාචාර්‍ය්‍ය පදප්‍රාප්ත පරියත්ති සාසනහිත ධම්මාචරිය
**අග්ගධම්මාභිවංස මහාස්ථවිරයන්වහන්සේ.**

# ග්‍රන්ථප්‍රස්තාවනා.

ශ්‍රී සද්ධර්මවර චක්‍රවර්තිවූ අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ තිකඞ්ගුත්තරපාළියෙහි "තීණිමානි භික්ඛවෙ විව ටානි විරොචන්ති නොපටිච්ඡන්නානි"යි චන්ද්‍රසූර්‍ය්‍යමණ්ඩලය හා තථාගතප්‍රවෙදිත ධර්මවිනයත් නිරාවරණව බබලනබැව් හා සියලුකල්හි පිළිසන්ව නොපවත්නා බවද දක්වා වදාළසේක.

ඔවුනතුරෙන් චන්ද්‍රසූර්‍ය්‍යදෙදෙන අභ්‍ර, මහිකා, ධූම, රජස්, රාහු යන පඤ්චොපක්ලේශයන් විසින් කලින් කල ආවරණය කරනලද්දෝ නොබබලන්නාහු නමුදු ඔවුන්ගේ විගමයෙන් නැවත නැවතත් දිලියෙන්නාහු ලොවඳුරු නසා හැමසතුන් සිත්සතන් පිනවන්නාහු වෙද්ද, එසේම සත්වසන්තානයෙහි මොහඳුරු නැසීමෙහි දිවාකරායමානවූ තථාගතප්‍රවෙදිතධර්ම විනයසඞ්ඛ්‍යාත මේ ශාසනරත්නයද අධර්මමිථ්‍යාවාද ග්‍රහණය කළාවූ ප්‍රබලවූ ගිහිපැවිද්දන්ගේ පැළඹීමෙන් හෝ අපර්‍ය්‍යාප්ත අඥාන මොහපටලයෙන් හෝ කලින්කල උපක්ලිෂ්ටවන්නේ, වැසීයන්නේ නමුදු සත්වසන්තානයන් ධර්මවිනයාලොකයෙන් ආලොකවත්කිරීමෙහි නියැලි පර්‍ය්‍යාප්තිප්‍රතිපත්ති පරායනවූ ධර්මවාදී සුධීවරයන්ගේ උත්සාහයෙන් ඒ දූෂට දූර්ත දූර්වාද නමැති උපක්ලේශයන් බැහැරලීමෙන් විවෘතකරනලද මේ තථාගත ශාසනයතෙම ස්වකීය සද්ධර්මරශ්මිසහස්‍රයෙන් පුන පුනා දෙව්මිනිසුන්සහිත ලොකයාගේ මොහඳුරු නසා සද්ධර්මා ලොකයෙන් ලොකය ආලොකකරන්ට සමර්ථවන්නේමැයි. එහෙයින් වදාළහ. "තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවින යො විවටො විරොචති නොපටිච්ඡන්නො"යි.

මෙසේ සිවුවණක් පිරිස කෙරෙහි සියලු ආකාරයෙන් බැබළියයුතුවූ මේ ධර්මවිනයෙහි එකම ධර්මස්කන්ධයකුදු එකම විනයපදයකුදු ග්‍රන්ථවශයෙන් විනාශවන්ට හෝ අර්ථවශයෙන් විපරීතවන්ට යටපත්වන්ට වරදවාගන්ට හෝ ප්‍රතිපත්තිවශ යෙන් හැරදමන්ට නොපුරාහරින්ට හෝ අවකාශතැබීම සද්ධර්ම යාගේ චිරස්ථිතිය පතන්නාවූ ධර්මවිනයධරයාගේ ශාසනානු ලොමික පැවැත්මෙක් නොවේ. උපනුපන් පරවාදයන් හෙතු යුක්තිසහිතව ධර්මයෙන් විනයෙන් මැඩපවත්වා ශාසනය

නගාසිටුවීමම ශාසනහිතාර්ථීන්ගේ සිරිත වේ. "විනයො හි සාසනස්ස ආයු"යී වියූහෙයින් සෙසු සූත්‍රාභිධර්මයට වඩා විනය ධර්මයම බුද්ධශාසනයාගේ ආයුෂය හෙවත් ජීවිතේන්ද්‍රියය වේ. එසිනුදු මේ විනයධර්මයෙහි අර්ථසාරය හා ප්‍රතිපත්තිසාරයවූ භික්ෂුධර්මය හෙවත් උපසම්පදාශීලය ප්‍රතිපත්තිශාසනයාගේ පැවැත්මෙහි අසහාය හෙතු වන්නේමය. ඥප්තිචතුර්ථ උපසම්පදා කර්මසඞ්ඛ්‍යාතවූ අද පවත්නා උපසම්පදාව වනාහි වස්තු, ඥප්ති, අනුශ්‍රාවණ, පර්ෂත්, සීමාසඞ්ඛ්‍යාත පඤ්චසම්පත්තියෙන් සමන්විතකොටම සිද්ධකරනලද්දේ සම්පත්ති යුක්තවන්නීය. මෙයින් සීමාසම්පත්ති විනිශ්චය වනාහි ශාසනපරම්පරානුයාත ගැඹුරු විනයනයෙහි බැසගත් තීක්ෂණ බුද්ධිමතුන්ටම විෂයවූයේ වෙයි. එහෙයින් උපනුපන් සීමාවාදයෝ තත් තත්කාලීන විනයනයෙහි හසල උසස් පඬිවරයන් විසින් සිය ගණින් ග්‍රන්ථ නිපදවා විශෙෂයෙන් ශාසනයෙන් බැහැර කරන ලදහ.

ආචාර්යොපනිශ්‍රයෙන් පරම්පරානුයාත වාචනාමාර්ගීය නොහැර ධර්මවිනය උගත් ශාසනභාරධාරී උතුමන්ගේ පරම්පරායෙහි කර්මාකර්මවිනිශ්චය දැන විපත්ති විශොධනයකොට සීමාබන්ධන උපසම්පදාදී ගරු විනයකර්මයෝ ගරු ස්ථානයෙහි තබා මේතාක් පවත්වාගෙන එනු ලැබෙත්. මේ සියලු තන්හි උපනුපන් අධර්මවාදයන් ශාසනයෙන් බැහැරලා ශාසනවිශොධනය කොට සසුන් බැබලවීම හා විනයානුරූපවූ ශාසනික කර්තව්‍ය නිෂ්පාදනයද **උපාලිදාසකාදි** සිව්පිළිසිඹියාපත් මහාක්ෂීණාශ්‍රවයන්වහන්සේලාගේ අඛණ්ඩ අසම්භින්න (අමිශ්‍ර) ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාසඞ්ඛ්‍යාත නියම ශාසනවංශික විනයධරයන් කෙරෙහිම පිහිටියේ වෙයි.

ඒ මේ ශාසනවංශික නියම විනයධරයා විනයධරම්මන්‍යවූ නොවියතුන් කෙරෙන් හා පරවාදී නිකායාන්තරිකයන් කෙරෙන් විශෙෂකොට හැඳිනීමට ලක්ෂණත්‍රයක් ඔහු කෙරෙහි පිහිටියේ වියයුතුය. "විනයධරෙන පුග්ගලෙන තිලක්ඛණ සමන්නාගතෙන භවිතබ්බං, තීණි හි විනයධරස්ස ලක්ඛණානි ඉච්ඡිතබ්බානි, කතමානිතීණි? සුත්තඤ්චස්ස ස්වාගතං හොති සුප්පවත්ති, සුවිනිච්ඡිතං, සුත්තසො අනුව්‍යඤ්ජනසොති ඉදමෙකං ලක්ඛණං–විනයෙ ඛො පන ඨිතො හොති අසංහීරොති ඉදං දුතියං–ආචරියපරම්පරා ඛො පනස්ස සුග්ගහිතා හොති සුමනසිකතා සූපධාරිතාති ඉදං තතියං" විනයධරයා විසින් මේ

මතු අක්වන් ලක්ෂණත්‍රයෙන් සමන්විත වියයුතුයි. විනයධරයා හට ලක්ෂණත්‍රයක්ම කැමැතිවියයුතුයි. ඒ කවර තුනක්ද? සූත්‍රසඞ්ඛ්‍යාත සියලු විනයපිටකය පෙළවශයෙන්ද අට්ඨකථා වශයෙන්ද සැකපසිඳ මනා විනිශ්චය ඇතිව ආචාර්යෝපදෙශයෙන් උගන්නාලද්දේ ප්‍රගුණකරනලද්දේ වාචොද්ගමනය ඇත්තේ වන්නේය යනු එහි එක් ලක්ෂණයකි. ලජ්ජීභාවයෙන් විනයෙහි පිහිටියාවූ විනයරක්නාවූ (අලජ්ජීයා විනය උගත් බහුශ්‍රැතයකු වූවත් ලාභසත්කාරාදිය නිසා අලජ්ජීන්ට බලයදී සස්න පෙළා සස්නෙහි මහත් ව්‍යසන උපදවන හෙයිනි)

විසාරදභාවයෙන් සුසපිරවූ පෙළ හෝ අටුවාව උඩු යටිකුරු නොකොට විචාළ පැණට මගනොහැර නොනතනමින් පිළිතුරු දෙන්නාවූ කෙනෙක් වීමය මේ දෙවෙනි ලක්ෂණයයි. ස්වකීය විනයාචාර්ය පරම්පරාව පිළිවෙළින් දැනගත් සිහිකිරිමෙහි සමත් සිතින් දරාගත් කෙනෙක්වීම හෙවත් මාගේ ආචාර්යතෙමේ අසුවල් ආචාර්යයන් කෙරෙන් විනය උගත්තේය, උන්වහන්සේ අසුවල් ආචාර්යයන් කෙරෙන්යයි මෙසේ ගොස් උපාලිමහාස්ථවිරයන්වහන්සේ සම්‍යක්සම්බුද්ධයන්වහන්සේ කෙරෙන් විනය උගත්තේයයි තථාගතයන්වහන්සේ දක්වා ඈඳුරු පරපුරගලපා කියන්ට හා උපාලිස්ථවිරයන්වහන්සේ සම්‍යක් සම්බුද්ධයන්වහන්සේ කෙරෙන් විනය උගත්සේක. උපාලිස්ථවිරයන්වහන්සේ කෙරෙන් දාසකස්ථවිරයන්වහන්සේද උන්වහන්සේ කෙරෙන් සොණකස්ථවිරයන්වහන්සේදැයි මෙසේ ස්වකීය ආචාර්යයන්වහන්සේ දක්වා අනුලොම ප්‍රතිලොම වශයෙන් ආචාර්ය පරම්පරාව දැනීම ඇති කෙනෙක් වීමය යනු තුන්වෙනි ලක්ෂණයයි. ශාසන පරම්පරානුයායී විනයධරයා මේ අඞ්ගත්‍රයයෙන් සමන්විතවූ කෙනෙකැයි දතයුතු. සංශයස්ථාන විසඳා සැක දුරු කොට ගුරුමුඛයෙන් පෙළහා අටුවාවත් හොඳින් උගනෙක්වීම විනයධරයෙක් වීමට කාරණයක් වූවත් තමා උගත් විනයධර්මයෙහි නොපිහිටි ප්‍රතිපත්ති ගරුකනොවූ අලජ්ජියෙක් හෝ ආමිෂලොලයෙක් හෝ චපලගති ඇති බියසුල්ලෙක් හෝ වීමෙන් තමා ලත් ප්‍රතිබලභාවයෙන් සතරඅගතියට බැඳී ශාසනය විනාශකරන්නෙක් වනහෙයින් දෙවෙනි අඞ්ගයවූ විනයෙහි පිහිටීම හා විසාරදයෙක්වීම අවශ්‍ය වන්නේය. යථොක්ත අඞ්ගවයෙන් යුක්තවූයේනමුදු විනයධරයා අවිච්ඡි

න්න ආචාර්‍ය්‍ය පරම්පරාවෙන් විනය උගනුවෙක් නොවූයේ නම් ඔහු ථෙරියපරම්පරාවෙන් බැහැරගියා වජ්ජිපුත්‍රක, වජ්‍රගිරි, අභයගිරි ආදි නිකායාන්තරිකයෙක් හෝ ඔවුන්ගේ ලබ්ධි ඇත්තෙක් හෝ වියහැකිසි. කුමක්හෙයින්දයත්? බහිර්නිකායික පරවාදීවූ විනයධරතෙමේද පූර්වෝක්ත ලක්‍ෂණවයෙන් සමන්විත විය හැකි හෙයිනි. තදඞ්ගවයෙන් සමන්විතවූයේනමුදු විනයධර තෙමේ ථෙරියපරම්පරානුයාත නොවී නම් විභජ්ජවාදියෙකු ලෙස පිළිගනු නොලැබේ.

## ආචාර්‍ය්‍ය පරම්පරා විවේචනය.

සම්‍යක් සම්බුද්ධයන්වහන්සේ ප්‍රභවකොට ඇති ශාසන රත්නය වනාහි **උපාලිආදී** මහාක්ෂීණාශ්‍රවයන් ප්‍රධානකොට ඇති යටදැක්වූ ත්‍රිලක්‍ෂණසම්පන්න විනයධරයන් විසින් අවිච්ඡින්න අසම්භින්න ආචාර්‍ය්‍යපරම්පරානුගත වාචනාමාර්ගයෙන් උගන්වා ප්‍රතිපත්තිවශයෙන් ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරායෙහි පුරුදු පුහුණුකොට ගෙනඑනු ලබන්නේ ශාසනවංශයයි කියනු ලැබේ. මේ වනාහි **උපාලිආදී** මහාස්ථවිරයන්ගේ අන්වය හෙයින්ම ථෙරියපරම්පරායයිද කියනුලැබේ.

ලක්දිව මහාවිහාරික සංඝයා හා සුවණ්ණභූමිරට **සොණුත්තර** මහරහත් පරම්පරාවද මේ ථෙරියනාමයෙන් ප්‍රකටයහ. විභජ්ජවාදී, සකවාදී යනුද මුන්වහන්සේලාටම නම් වෙති. මේ ථෙරියනිකායික සංඝයා **දහම්සෝ** රජුදවස නවරටක පැතිර ගියාහු චිරකාලයක් බුදුසසුන් නිරුපද්‍රැතව ගෙනාවාහුය. දෙවෙනි තෙවෙනි සඞ්ගායනා කාලයෙහි ශාසනයෙන් නෙරපනුලැබූ වෛතුල්‍යනම් ප්‍රතිරූපධර්ම ඉපදවූ ශ්‍රමණපාශයන්ගේ පරම්පරාවත් හා මේ ථෙරියපරම්පරාවෙහි අත්‍යන්තයෙන්ම සම්බන්ධයක් නැත්තේමය. ථෙරියපරම්පරාවට විෂමවූ විනය පැවතුම් හා මතාන්තරලබ්ධි ඇති යථෝක්ත ශ්‍රමණපරම්පරාවෝ වෛතුල්‍යවාදී, විතණ්ඩවාදී, පරවාදී, නිකායාන්තරික යන නාමයන්ගෙන් විභජ්ජවාදී ථෙරියනිකායිකයන් විසින් ව්‍යවහාර කරනුලැබෙත්. යථෝක්ත ථෙරියභික්‍ෂූහු සමූහ හෙයින් දේශවිශේෂාදියෙන් නාමාන්තරයන්ගෙන් ප්‍රකටවූවත් බුද්ධවචනයෙහි පෙළවශයෙන් හා අර්ථඅදහස් ප්‍රතිපත්තිවශයෙන් ඔවුනොවුන් හා සමාන දෘෂ්ටිඇත්තෝව පර්‍ය්‍යාප්තිප්‍රතිපත්තිවශයෙන් ධර්මවිනය දරන්නෝ දානප්‍රතිදානවශයෙන් ඔවුනොවුන් ශාසනධර්මය ගනුදෙනු කළෝද වෙති. මේ අර්ථය හා ආචාර්‍ය්‍යපරම්පරාදී ශාසනකථා මාර්ගයෝ ශාසනවංශයෙන් සවිස්තරව දතයුතු වෙත්.

කාලවිපරිණාමයෙන් ඇතිවූ ලෝකශාසන් විපත් කරණ
කොටගෙන සෙසු රටවල පැතිරතුබූ සම්බුද්ධශාසනය හා
යථෝක්ත ස්ථවිරවාදී පරම්පරාවද ශාසනික කර්මමාර්ගයෝ
කාෂායවස්ත්‍රධාරීයකු පමණක් ශේෂනොව මූලොච්ඡින්නවගිය
නමුත් බෞද්ධ රජුන්ගෙන් හිස්නොවූ ලංකා, සියම්, බුරුම
යන තුන්රටෙහි සම්බුද්ධශාසනය කලින්කල නගිමින් හා
බසිමින්ද පැවත අවුත් තිබේ. ලංකා ශාසනයට ජීවයක්සේ
පැවති **මහාමහින්ද** ස්ථවිර පරම්පරාව හෙවත් මහාවිහාරවංශය
1345 වර්ෂයක් නිරුපද්‍රැතව ශාසනාභිවෘද්ධිය සිද්ධකෙරෙමින්
අවුත් බෙලහීනවූ සතරවෙනි මිහිඳු රජුගේ රාජ්‍යය විනාශ
යෙන් සීමාවී ගියේය. මෙතැන්සිට 64 සිව්සැට වර්ෂයක් පමණවූ
දීර්ඝකාලයතුළ මිසදිටු දෙමළ බලසෙනාවන්ගේ පැළඹීමෙන්
ඇතිවූ ජාතික විප්‍රකාර, රාජ්‍යවිපර්යාස, භීෂණසංග්‍රාමාදීය
නිසා භික්ෂුණීශාසනයද මූලොච්ඡින්න විය. බුද්ධවර්ෂ 1609 දී
පරසතුරන් සාධා ලංකාභිෂේකය ලැබූ මහාවිජයබාහු මහ
රජුදවස මේ මහාවිහාරීය ස්ථවිරවාදී පරම්පරාව ලක්දිව
පිරිස්වශයෙන් පමණක් නොව සීලාදී ගුණමහිමයෙනුත්
කොපමණ පිරිහී පැවතියේදැයි යතහොත් උපසම්පදාදී සංඝකර්ම
යකට ගතහැකි සිල්වත් භික්ෂූන් දෙනුන්නමක්වත් සොයාගත
නොහැකිවූ බව කියනුලැබේ. එහෙයින් විජයබාහු නරේන්ද්‍රයා
බුරුමරට **අරිමර්දන** පුරයේ අනුරුද්ධ මහරජහුගේ සහායත්ව
යෙන් **සොණුත්තර** වංශික ශාසනභාරධාරී සිල්වත් සංඝයා
ලබාගෙන උපසම්පදාදිය කරවා ලක්දිව සසුන් බැබලවූබව
දක්නාලැබේ. මේ රාමඤ්ඤවංශික සඞ්ඝ පරම්පරාවට පැරණි
මහාවිහාරීය සංඝයාට අයත්වතුබූ විහාරාරාමයෝ පාවාදෙන
ලද්දෝය. එහෙයින් මේ සංඝපරම්පරාවද මහාවිහාර නාම
යෙන් ප්‍රකටවූහ. නමුත් ජේතවන අභයගිරිවාසීන් සමග
අසම්භාව්‍යයට පැමිණි පැරණි මහාවිහාරික භික්ෂුකොටසක්ද
මේතාක් සිටිබව අමතක නොකළහැකිවේ. මහාපැරකුම්බා
මහරජුගේ ශාසනවිශෝධනයෙහිදී බගිරිනක දෙනානක
වාසීන් සමග මේ මහාවිහාරීය මලිනපක්ෂයද ලුප්තවගියහයි
දතයුතු.

යථෝක්ත රාමඤ්ඤවංශික මහාවිහාරීය සංඝපරම්පරාව
දිඹුලාගල මහාකාශ්‍යප සංඝරාජයන්වහන්සේ, දිඹුලාගල
මෙධඞ්කර, ශ්‍රී ශාරිපුත්‍ර සංඝරාජාදී මහාග්‍රන්ථකාර ත්‍රිපිටකධර
මහාස්ථවිරයන්වහන්සේලාගේ පටන් තොටගමු කාලයද

ඉක්මවා සීතාවක් පුර පිතෘඝාතක දුෂ්ට රාජසිංහ රාජයාගේ ශාසනවිනාශය කෙළවරකොට පැවතායේය. මේ කාලයතුළ බුරුමරටින් ලඞ්කාශාසන ප්‍රතිසංස්කරණාදිය සඳහාද ලක්දිවින් බුරුමරට ශාසන ප්‍රතිසංස්කරණය සඳහාද නොයෙක් විට උපකාර ලැබීතිබෙන බව පොතපතින් පෙනේ. මෙසේ මහින්ද ස්ථවිරීයවංශය පොළොන්නරු කාලය දක්වාද පොළොන්නරු කාලයෙහි ආරබ්ධවූ **සොණුත්තර** වංශික රාමඤ්ඤ සංඝපරම්පරාව සීතාවක රාජධානි කාලය දක්වාද පැවත අවුත් ස්වකීය ආචාර්‍ය පරම්පරා කථාවන් සමග අභාවයට ගියහයි දතයුතු.

උක්තප්‍රකාරයෙන් ගතවූ 2469 වර්‍ෂයක් තුළ නානාවිධ රාජ්‍යවිපර්‍යාස රාෂ්ට්‍රවිලෝපාදි අනේක විපත්ශතයෙන් ගහන වූද මේ ලෝකයෙහි **සොණුත්තර** මහරහතුන්ගේ පටන් බුරුම රාමඤ්ඤ දෙරටෙහි අඛණ්ඩව අසම්භින්නව සසුන් රකිමින් මෙම ස්ථවිරීය ආචාර්‍ය පරම්පරාව පැවත ඊම දෙවියන් සහිත ලෝකයාගේ හෘදයඞ්ගමවූ අමන්දානන්දයට ඒකාන්ත හෙතුවේමැයි. **උපාලිදසකාදි** මහාක්ෂීණාශ්‍රවයන්ගේ ශිෂ්‍යානු ශිෂ්‍ය වංශයවූ පූජ්‍යතරවූ මෙම ස්ථවිරාචාර්‍ය පරම්පරාවෙහි බොහෝ ශාඛා ඇතිවියයුතු නමුත් **ජාගර** (ශ්වෙජින්) **සුධර්ම** යන නාමයන්ගෙන් ප්‍රචලිතවූ සංඝපරම්පරා දෙකක්ම රාමඤ්ඤ බුරුම දෙරටෙහි ප්‍රසිද්ධව පවතිත්. වාරවාදීහුද ශ්වෙජින් ශාඛාවක් ලෙස සලකනු ලැබෙත්. රාමඤ්ඤදෙශික **මහාජපසවා**චාර්‍යයන්ගේම ශිෂ්‍යානුශිෂ්‍ය ශාඛා දෙකින් එකත්වූ ජාගර සංඝ පරම්පරාව අවිච්ඡින්න ආචාර්‍ය පරම්පරායෙන් පැවත අවුත් ජාගර මහාස්ථවිරයන්වහන්සේගෙන් පසු ශ්වෙජින් නිකාය නමින් බුරුම රාමඤ්ඤ දෙරටම පැතිර ගියේය. තදන්‍ය ශාඛාවද **ඤෙය්‍යධම්ම** සංඝරාජයන්වහන්සේගේ කාලය දක් වාද මෙකල්හිද සුධර්ම හෝ මහාගණ්ඩි නාමයෙන් ප්‍රකටවූයේ පවති.

මෙසේ අප විසින් සැකෙවින් දක්වනලද්දාවූ **උපාලකාදි** මහාක්ෂීණාශ්‍රවයන්වහන්සේලාගෙන් ආරබ්ධවූ විභජ්ජවාදී සඞ්ඛ්‍යාතවූ මේ ස්ථවිරාචාර්‍ය වංශය තෙම සස්නෙහි උපදනා කාෂ්ට දුෂ්ට දුර්මත හා මිථ්‍යාග්‍රාහ දුෂ්ප්‍රතිපත්ති කිලිටිමල සොධනය කෙරෙමින් මහමුහුදු වැද රළපතර බිඳිමින් දිවෙන ගඞ්ගා ජලප්‍රවාහයක්සේ නිකායන්තරික අශෙෂ පරවාදයන් විශෙෂයෙන් බිඳිමින් අසම්මිශ්‍ර ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙන් සසුන්

පිරිසිදුකොට රකිමින් චිරස්ථායීව පවත්නේයි. මෙසේ දීර්ඝ කාලානුගතවූද මේ බුද්ධශාසනය මහරහතුන්ගේ පටන් පිළිවෙළින් අක්නාලද ආචාර්‍ය්‍යවරයන් ඇති නිසැකවූ සංඝපරම්පරාවෙන් නොසිස්ව පැවතීම විභජ්ජවාදසඞ්ඛ්‍යාත සම්බුද්ධශාසනයාගේ චිරස්ථිතියට ඒකාන්ත කාරුණ්‍ය වෙත්මැයි.

## ථෙරීය වංශයෙහි ලඞ්කා සියම් දෙශීය ශාඛාවෙ‍ෝ.

ලක්දිව පවත්නා අමරපුර රාමඤ්ඤ දෙනිකාය වනාහි මතු කියවෙන විනීය ථෙර පරම්පරාගත **ඤාණාභිවංස, ඥෙය්‍ය ධම්මාභි මුනිවර** යන සඞ්ඝරාජයන්වහන්සේලා ප්‍රමුඛ තත්කාලීන තත්පරම්පරායාගත මහාස්ථවිරයන්වහන්සේලාගෙන් ප්‍රව්‍රජ්‍යාපසම්පදා ලබාගත පැමිණි ස්ථවිරාචාර්‍ය්‍ය පරම්පරාව වේ. එසේම රාමඤ්ඤ රටින් ථෙරීය වංශික සඞ්ඝයා වැඩමවා ගෙනගොස් සියම්රට පිහිටුවාගත් ධම්මයුක්තික නිකායද මේ ථෙරීය වංශයෙහි ශාඛාවකි. මෙම ආචාර්‍ය්‍ය පරම්පරාවෙහි ශාසන චාරිත්‍ර හා විනය පැවතුම්ද බ්‍රහ්මදෙශික සඞ්ඝයාගේ පැවතුම් හා අතිශයින් සමාන බවත් රාජ සම්බන්ධයෙන් සංවර්ධිතවූ බැවින් එතන් නිකායිකයන්ගේ නිර්මල පැවැත්ම රාජනීතියෙන්ම ගෞරවස්ථානයෙහිම තබා රක්නා බවත් දක්නා ලැබේ. වජිරඤාණ සඞ්ඝරාජයන්වහන්සේගේ පටන් රාජකීය නිකායක්ව ක්ෂත්‍රිය වංශිකයන්ගේ ආරක්ෂාවෙහි හා ආධිපත්‍යයෙහි පවත්නා මේ භික්ඛුසංහතිය අද ථෙරීය සඞ්ඝ රත්නාවලියෙහි හාරයක්සේ පූජ්‍ය පදවිය උසුලයි.

ප්‍රාප්තාවසරයෙහි දැක්වියයුතු අනික් භික්ෂු පරම්පරාව නම් සියම්රට මහානිකායයි. පූරුෂයුග ශතයෙනුදු අතීතයෙහි සිට ඉතිහාසයෙහි අඳුරුවූ දැක්වියහැකි ආචාර්‍ය්‍ය පරම්පරාවක්ද නැත්තාවූ යථෝක්ත නිකායිකයන්ගේ අශාසනික පැවතුම් හා ක්‍රියාත් සලකනවිට මේ භික්ෂු පරම්පරාව මහාසංඝික ථෙරීය පරම්පරා දෙකින් මිශ්‍රවූ හෝ ඒ දෙකට අතර සිට පිරිනීගිය පරම්පරාවකින් පැවතෙන බව වැටහේ. එහෙයින්ම "ආචිණ්ණකප්පිකනිකාය ගණ්ණං ජිගුච්ඡං" යනාදිය කියමින් වජිරඤාණ සඞ්ඝරාජාදි මහා පඬිවරයන් මේ මහානිකාය බැහැරකොට ධම්මයුත්තික නිකාය රාජකුලයෙහි ගෞරවයට හිමිකළ බව සැළකිය යුතුයි. විදෙශීය තොරතුරු දැනීමට දුෂ්කර නොවූ මේ කාලයෙහි මෙය විස්තර කිරීම අනවශ්‍යයි.

## ලක්දිව හා බුරුමරට ශාසනික තත්ත්වය.

විනයාචාර්ය පරම්පරාව හා මහණ උපසම්පදා පරම්පරාව දැයි ආචාර්ය පරම්පරා දෙකක් ශාසනයෙහි පැවත එන බව වියතුන්ට රහසක් නොවේ. මහණ උපසම්පදා පරම්පරාව ගරුතන්හි තබමින්ම විනයඅටුවාවෙහි එනලෙස විනයාචාර්ය පරම්පරාව ව්‍යවහාරයෙහි නගා ශාසනවංශයෙහි සඳහන් කරනුලැබේ. ඒ වනාහි “මය්හං ආචරියො අසුකස්සාචරියස්ස සන්තිකෙ උග්ගණ්හි, සො අසුකස්සාති” යන මේ ආචාර්ය වංශය දක්වන ක්‍රමය අනුවයි. අද ලක්දිව පවත්නා ථෛරීය වංශික දෙනිකායට බුරුමරටින් මහණ උපසම්පදා පරම්පරාව මිස මුඛ්‍යවශයෙන් විනය පරම්පරාවක් ලැබී නැතිබව කියන්ට ලැබීම බලවත් මනස්තාපයක්වා සේම නොකියා හැරීමත් බලවත් අයුක්තකි. මීට හේතු කවරේද? අවිච්ඡින්න ආචාර්ය පරම්පරාවෙන් අවුරුදු දෙදහසකටත් වඩා පෙර සිට ධර්මවිනය උගන්වාගෙන එන බුරුමරටෙහි දේශීය භාෂාව පාළිභාෂාවටත් වඩා පහසු ලෙස ධර්මවිනයාගත අදහස් ප්‍රකාශකිරීමට පුරුදුව සමත්වී තිබීමයි. සියලුම දේශනාදී පාළි ග්‍රන්ථ කිසිවකුත් නොහැර බුරුම බසින් විවරණය කරතිබීම හා උගතුන් විසින් ලියා තිබෙන දහස් ගණන් පොත්පත් ම්‍රම්මභාෂාමය වීමත් නිසා බුරුම භාෂාව හොඳින් ඉගෙනීම බුරුමරට ධර්මවිනයාචාර්ය පරම්පරාව ලබාගැනීමට මහෝපකාරී වේ.

තවද මේ ම්‍රම්මවංශික භික්ෂූහු නානා ගුරුවරයන් සමීපයෙහි බොහෝ වාරගණනක් විනයපිටකය අටුවා ටීකා ප්‍රකරණාදිය නොහැර දහපහළොස් වසක් උගෙනීම කරති. සාකච්ඡාවෙන් හා පොතපත පරීක්ෂාවෙන්ද උද්ග්‍රහණ ධාරණාදියෙන්ද අනේකවාරයක් ප්‍රතිපෘච්ඡා වශයෙන් ගුරුමුඛයෙන්ම අසා සැක හැර විනය ඉගෙනීම මේ රටේ සිරිත වේ. මේ භික්ෂූන් විසින් විසඳූ විනිශ්චයට නොබටු සැකහැරනොගත් එකද පැණයක් මුළු විනයපිටකයෙහිම නොලැබේ. ඒ ඒ විනයධර මහා පඬිවරයන් විසින් පශ්චිම ජනතාව සඳහා විනය ග්‍රන්ථස්ථානයන් විසඳූ ලියා තබනලද විනිශ්චය ග්‍රන්ථයෝද බොහෝ ගණනක් ඇත්තාහ. මෙසේ පසළොස් වසකට හෝ විසි වසකට අඩුනොවූ කාලයක් ලෞකිකාමිෂයෙහි නොඇලී පර්‍යාප්ති පරායණව ගුරු මුඛොද්ගත වාචනා මාර්ගයෙන් ධර්මවිනය පුහුණුකොට ත්‍රිවිධ ලක්ෂණයෙහි පිහිටි විනයධරයෝව මේ ථෛරීය භික්ෂූහු ආචාර්ය වංශයට බැස ගනිති.

මෙසේ නොකඩව පවත්නා ආචාර්ය පරම්පරාවකින් නිර්මලාකාර යෙන් ධර්මවිනය උගන්වාගෙන එන බුරුම දේශයට මින් විසි තිස් වසකින් පෙර අප රටින් සසුන් සොයා ගිය සැදැහැවතුන් අතර දීර්ඝකාලයක් නැවති දේශීය භාෂාව ඉගෙන ගුරුවරුන් ඇසුරුකොට සැක පසිඳගනිමින් පිළිවෙළට ධර්මවිනය පුහුණු කොට ගෙන අවුත් මේ රටේ ශාසනාචාර්ය පරම්පරාව දියුණු කළ කිසිවෙක් නැතිවීම ලඞ්කා ශාසනයට අපමණ අලාභයකි. මෙසේ ආචාර්ය පරම්පරාවෙන් තොරව පොතපතින්ම යමක් දැනගත් විනයධරම්මන්‍යයන්ගේ හා අනාචාර්ය පරම්පරාවන් ගෙන් විනය උගතුන්ගේත් විනය විනිශ්චය වනාහි ථෛරිය වංශික නියම විනයධරයන් ඉදිරියෙහි "වැඳුවත් ඉදිරියේ කොලොම්බුකැට ලන්නා" වැනි පරිහාසජනක කථාවෝ වෙති. ලඞ්කා ශාසනික ථෛරිය පරම්පරාවෙහි පවත්නා මේ දුර්වල ස්ථානය අපි මෙසේ පෙන්වා දෙමින් බුරුම රටින් ලක්දිවට මහණ උපසම්පදා සංඛ්‍යාත ප්‍රතිපත්ති මූලය මිස සකල ශාසන මූලිකවූ පර්යාප්ති පරම්පරාව නියත වශයෙන් පැමිණ මුල් බැස නොගත් බව හඟවා දෙනු කැමැත්තෙමු. ලක්දිව වර්තමානික ථෛරිය වංශයාගේ ආරම්භයෙහි වැඩ සිටි ශික්ෂාකාමීන් වහන්සේලාගේ කාලයෙහි මේ අතින් සැනසෙන්ට ස්වල්ප අවකාශයක් තිබී ගිය නමුත් තිස් හතළිස් වර්ෂයකින් මෙපිට උගත් සම්මතයන් හා ඉගෙනීම ලබන්නෝත් කුමක් උගනිත්ද?–

එය කවර ආචාර්ය පරම්පරාගත ඉගෙනීමක්ද යන කරුණු ථෛරිය වංශමානී කුලපුත්‍රයෝ සිහිනුවණින් මෙනෙහි කෙරෙත්වා– ලඞ්කා ශාසනයාගේ දුර්භාග්‍යය දියුණුවීමට හා විඥයන්ගේ බලවත් මනස්තාපයටත් කාරණවූ මේ ශාසනික පරිහානිය වලකාලීමට හා ස්වාචාර්ය පරම්පරා ගෞරවය යථාස්ථානයට ගෙනයාමටත් වහා ප්‍රෝත්සාහී වෙත්වා.

## විසුංගාමසීමා විවාදය.

අද ලක්දිව මේ ප්‍රසිද්ධ විවාදය ගැන යම්පමණක දැනීමක් නැති විඥජනයෙක් සොයාගැනීම අපහසු වේ. **කෝදාගොඩ උපසෙන** මහාස්ථවිරයන්වහන්සේ විසින් අකාල මෙඝධ්වනිය කින් මෙන් ලඞ්කා ශාසනිකයන් උත්‍රස්ථ කරවමින් සිය වියත් බවට අනුරූපවූ ප්‍රචණ්ඩ විතණ්ඩ භාෂාවෙන් 1923 අගෝස්තු මාසයෙහි බෞද්ධ පත්‍ර මාර්ගයෙන් මේ විවාදය ආරම්භ කරන ලද්දේය. පර්යාප්ති ධර්මාචාර්යයයි පණ්ඩිත ජන සම්භාවිත

වූද ශාසනාකාශයෙහි දීප්‍යමාන **ජාගරාභිධජ මහාධම්මරාජාධි රාජගුරු** මාහිමියන්වහන්සේගේ නප්තෘ ශිෂ්‍යවූද **විසුද්ධාචාර ධජාධිපති කවිධජ මහාධම්මරාජාධි රාජගුරු** මාහිමියාණන් ගේ සමීපාවචර උසස් ශිෂ්‍ය රත්නයක්වූද අද දින යථෝක්ත මාහිමියන්වහන්සේලාගේ ආචාර්‍ය්‍ය පීඨයෙහි සිට මහාවිසුද්ධා රාමික ගණවාචකාචාර්‍ය්‍යව සහස්‍රසංඛ්‍යාත ශිෂ්‍යයන්ට ධර්‍මවිනය හදාරවන්නාවූද පූර්වෝක්ත මහාස්ථවිරීය පරම්පරානුයාත **අග්ගධම්මාභිවංස** නම් ම්‍රම්මදෙශික ආචාර්‍ය්‍යපාදයන් විසින් උපසෙන ස්ථවිරයන්වහන්සේගේ (අර්ථශූන්‍ය) ශුෂ්ක ඝොෂාවට විඥජන මනොඥ ප්‍රබොධයෙහි නිසාකර සමානවූ විචිත්‍ර ප්‍රත්‍යුත්තරයෝ පරිශුද්ධ ථෙරවාදයන් අලලා ඇඳුරු උගහා නොවිහිද විචිත්‍රාකාරයෙන් ප්‍රකාශ කරන ලදහ. මේ විචිත්‍ර ප්‍රතිභාණයන් ඇසූ අපක්ෂපාතී ලක්වැසි විඥජනතාව අවිච්ඡින්න වාචනා මාර්ගානුගතවූ බුරුමරට ආචාර්‍ය්‍ය පරම්පරාවෙහි සුවිසද නිපුණ විනය විජානනයෙහි අත්‍යුත්කෘෂ්ට ගම්භීර නිර්මල භාවය හා සම්‍යක් සම්බුද්ධයන්වහන්සේ ප්‍රභවකොට ඇති නිර්මල ශාසනාචාර්‍ය්‍ය පරම්පරාව අදත් ලෝතුළ නිරොගීව පවතිමින් සසුන් බබුළුවනායුරු සහර්ෂ රොමොද්ගත ප්‍රීතියෙන් ප්‍රකාශ කළාය. උල්ලූක ඝොෂාවක් දිවාකරොද්ගමයෙහි අසත වන්නාසේ ථෙරිය පරම්පරාගත මේ ආචාර්‍ය්‍යයන්වහන්සේගේ නිර්මල ප්‍රතිභාණයන් වඩ වඩා උදාවත්ම උපසෙන ස්ථවිරයෝ උන්වහන්සේට මුවපාන්ට නොපොහොසත්ව සගෞරවයෙන් පසුබැස සැඟවී ස්වශිෂ්‍යාදීන්ගේ නාම වෙසාරුඪව කතිපය බසක් කියා මන්දස්මිතයෙන් විකසිත ලෝදනන් මුහුණ බලා ව්‍රීඩා පරවශව මෙන් විවාදයෙන් නිරස්ත විය.

මහත් වර්ෂාවකට පූර්වයෙන් ඇතිවූ නිශ්චලතාවයක් වැනි චරිතානුකූල නොවූ මේ නැවතීම විඥයන්ගේ විනොදයට නොව අනාගතභාවී සිද්ධියකට පූර්ව නිමිත්ත විය. තදර්ථය ප්‍රකාශ කරමින්ම 1925 මාර්තු 30 දාතමින් ස්වමතය තහවුරු කරගනු පිණිස ‘අබද්ධසීමා විනිශ්චය’ යන නාමාරූඪ ග්‍රන්ථයකින් **උපසෙන** ස්ථවිරයන්වහන්සේ විසුංගාමසීමා විවාදයට නැවතත් බද්ධකක්ෂව බැසගත්තේය. පෙර විවාදයෙහිදී කී දේට අතිශයින් වෙනස්වූද නානාවිධ පරස්පරාහත දුර්මතවලින් ව්‍යාකුලවූද අනාර්‍ය්‍ය භාෂාවෙන් අනුන්ට කරනලද දුෂ්ට දොෂාරොපන ගර්හාපවාද ශතයෙන් දූෂිතවූද විතණ්ඩවාදීන්ගේ තාණ්ඩව භූමියක් වැනිවූ මේ විනිශ්චය පොත

ස්ථවිරාචාර්‍ය පරම්පරාව මතුයෙහි ඔසවනලද තියුණු කෙවේ රියක්සේ භයඞකරවූ ශාසන ප්‍රහාරයකි. මන්‍දබුඩිකයන්ගේ විමෝහයට මී තවරා දෙනලද ක්‍ෂුර (දැලිපිහි) යක් වැනිවූ මේ ග්‍රන්ථයෙන් අනාගත ජනතාව හා සම්බුඩ මතයත් ආරක්‍ෂා කිරීම පිණිස විතණ්ඩවාද විවෙචනය ආරම්භ කරනු ලැබේ.

**විසුංගාම විනිශ්චයාකාරය.**

මේ වනාහි බුඩඝොෂාචාර්‍ය පාදයන්වහන්සේ විනය අටුවාහි බුඩමතානුකූලව ප්‍රථම පාරාජිකා විනිශ්චය විස්තර කලාසේ මේ විවාදකාරක උභය පක්‍ෂයෙහි ආචාර්‍ය පරම්පරාවන්ගේ සිට විවෙචනය කොට දක්වනු ලැබේ.
කියනලදමැයි.

"ආචරිය පරම්පරතො නිදාන වත්‍ථුප්පභෙද දීපනතො
පරසමය විවජ්ජනතො සකසමය විසුඩිතො චෙව."
(සමන්තපාසාදිකා)

මේ විවෙචනයෙහිදී උභය පක්‍ෂයෙහි ආචාර්‍ය පරම්පරාවන්ගේ වශයෙන්ද නිදානය හෙවත් මේ විවාදයට හෙතුවූ අභ්‍යන්තර බාහිර නිමිති වශයෙන්ද, එසේම විවාද මූලවස්තු වශයෙන්ද, පරවාද දුරලීමෙන්ද, සකවාදයාගේ පරිශුඩ භාවය දැක්වීම් වශයෙන්ද කරුණු දක්වනු ලැබෙත්. මෙහි උපාලි දසකාදි මහරහතන්වහන්සේලාගෙන් ප්‍රභවයවූ පරිශුඩ විනයාචාර්‍ය පරම්පරා කථාව රාමඤ්ඤ බුරුම දෙරටෙහි අඛණ්ඩව පැවති ආ පරිදි හා අදත් එම ස්ථවිරාචාර්‍ය වංශය තද්දෙශයන්හි නිරෝගීව පවතිමින් බුදුසසුන් හොබවන අයුරුත් අප විසින් යට ප්‍රකාශ කරන ලදී.

දැන් මේ විවාදයෙහි විතණ්ඩ පක්‍ෂය ගෙන යථොක්ත ස්ථවිරාචාර්‍ය පරම්පරාවට හා ශාසනයටත් පටහැණිව විවාද කරන්නාවූ **උපසෙන** ස්ථවිරයන්වහන්සේගේ විනයාචාර්‍ය පරම්පරාව විනය උගත් **ඇදුරු පරපුර** ප්‍රකාශකොට දක්වනු ලැබේ. මේ උපසෙන ස්ථවිරයන්වහන්සේ වනාහි පූර්වෝක්ත මුම්මදෙශීය ආචාර්‍ය පරම්පරාව සොයා පරීක්‍ෂාකොට ගෙන **ඤෙය්‍යධම්මාභිමුනිවර ඤාණකිත්ති සිරිපවර මහාධම්මරාජාදිරාජගුරු** සඞ්ඝරාජයන්වහන්සේ උපාධ්‍යායකොට යථොක්ත සඞ්ඝරාජයන්වහන්සේ වැඩසිටි **මහාවිසුතාරාමස්ථ විසුංගාම** ඛණ්ඩසීමාවෙහිදී පරිශුඩොපසම්පදාව ලැබ ලක්දිව් පැමිණ බුදුසසුන් හෙලිකොට නගාසිටුවාලූ රාමඤ්ඤ නිකාය සමුට්ඨාපක අඹගහවත්තේ **ඉන්‍දාසභ වරඤාණසාමි මහානායක ස්ථවිර**

පාදයන්වහන්සේ උපධ්‍යායකොට ගෙන උපසම්පන්නවූයේකි. මෙසේ ථෙරිය පරම්පරාවෙන් ලැබූ මහණ උපසම්පදා සීලය ඇතත් මේ උපසෙන ස්ථවිරතුමා යථොක්ත ස්ථවිරාචාර්ය පරම්පරාවට විරුඬවූ **නිකායාන්තරීය** පරම්පරාවකින් ලත් විනයධරත්වයක් ඇති යථොක්ත පරවාදීන් හා ඔවුන්ගේ ලබ්ධි රුචි කරන්නාවූ උගතෙකි. ඒ නිකායාන්තරීය ආචාර්ය පරම්පරාව මෙසේයි. උපසෙන ස්ථවිරයන්වහන්සේ වනාහි ස්‍යාමනිකායෙන් නික්ම අවුත් රාමඤ්ඤනිකායික සංඝයා කෙරෙහි වුසූ ආචාර්ය **සුවණ්ණජෝති** මහා ශ්‍රාමණේරයන්ගේ සමීපයෙහි විනය උගත් කෙනෙකි. ඒ සුවණ්ණජෝති ආචාර්ය තෙමේ රාමඤ්ඤනිකායික සංඝයාට ඇතුළත්ව විසූ ඉළුක් වත්තේ **මෙධඞ්කරාසභ** ස්ථවිරයන්වහන්සේගෙන් හා සියාම නිකාය ගණවාචක හෙය්යන්තුඩුවේ **දෙවමිත්ත** ස්ථවිරයන් වහන්සේ වෙත විනය උගත් කෙනෙකි. ·යථොක්ත මෙධඞ්කරාසභ ස්ථවිරයන්වහන්සේ හා දෙවමිත්ත ස්ථවිරයන්වහන්සේත් ස්‍යාමනිකාය ගණවාචක ගණාධිපති හික්කඩුවේ **සිරිසුමඞ්ගලාභිධාන** මහානායකස්ථවිරයන් සමීපයෙහි විනය උගත්තාහු වෙති. ඒ සිරිසුමඞ්ගල නායක ස්ථවිරයන්වහන්සේ වලානේ **සිධාර්ථ** ස්ථවිරයන්වහන්සේ වෙතින් විනය උගත් සේක. සිධාර්ථ ස්ථවිරයන්වහන්සේ ගාල්ලේ ස්ථවිරයන්වහන්සේ වෙතින් විනය උගත් සේක. ගාල්ලේ ස්ථවිරයන්වහන්සේ **කරතොට නායක** ස්ථවිරයන් සමීපයෙහි විනය උගත් සේක. ඒ කරතොට ස්ථවිරයන්වහන්සේ වනාහි **වැලිවිට පිණ්ඩපාතික සරණඞ්කරාභිධාන** සියාමනිකායේ ආදි පුරුෂොත්තමභූත මහාස්ථවිරයන්වහන්සේගෙන් විනය උගත් සේක. ලක්දිව බුදුසසුන් පිරිහී එකද උපසපන් නමක් හෝ ධර්මවිනය උගත් කෙනෙකුන් නැති ධර්මශාස්ත්‍රාලොකයෙන් මුළු ලක්දිව අඳුරුව පැවති කාලයක සමණික පැවිද්දෙනී පැවිදිවූ මේ මහාවීර සාණින් ආචාර්ය පරම්පරාවක් තබා නියම ආචාර්ය කෙනෙකුන් නොලැබ යම්තම් ගුරූපදෙශයකින් පොතපත ඇසුරුකොට බොහෝ දුකසේ තන්හි තන්හි තිබූ ධර්මශාස්ත්‍රයන් රැස්කොට සොත්සාහයෙන් සියසතන්හි නගා වියත් සමම නව සියම් රටින් සංඝයා වැඩමවීමටද පෙර ග්‍රන්ථකාරකව විසූ ගණාචාර්ය ගණවාචක කෙනෙකි. උපසම්පදා ප්‍රදානය පිණිස සියම් රටින් වැඩමවූ ආචාර්යයෝ මූන්වහන්සේට විනයාචාර්යවූවෝ හෝ නුවූවෝ වෙත්වා. එහිදු සම්භාව්‍ය භාවයක් නොපෙනේ. සියම් රටින් ලක්දිව පැමිණි උපසම්ප

දැව පිහිටෙව් උපාල්‍යාදි මහාස්ථවිරයන්ගේ ආචාර්ය පරම්පරා
වෙහි තත්ත්වය හා විනයධරත්වය විනය පිළිපැදුම් ආදිය මෙහි
යට දක්වා තිබෙන අයුරු උපසෙන ස්ථවිරයන්වහන්සේගේ
උපාධ්‍යායවරයන්ගේ මතයටද අවිරුද්ධ බැව් පිළිගන්නවා ඇත.
දැන් ඉතින් මේ **නිකායාන්තරීය ආචාර්ය පරම්පරාව** මෙසේයි.
ස්‍යාමනිකායික උපාලි ස්ථවිරයන්වහන්සේගේ ශිෂ්‍යවූ සරණ
ඞ්කර සඞ්ඝරාජයෝය, උන්වහන්සේගේ ශිෂ්‍ය කරතොට
ස්ථවිරයෝය, කරතොට ස්ථවිරයන්ගේ ශිෂ්‍ය ගාල්ලේ
ස්ථවිරයෝය, ගාල්ලේ ස්ථවිරයන්ගේ ශිෂ්‍ය වලානේ සිද්ධාර්ථ
ස්ථවිරයෝය, සිද්ධාර්ථ ස්ථවිරයන්ගේ ශිෂ්‍ය හික්කඩුවේ සිරි
සුමඞ්ගල නායක ස්ථවිරයෝය, සිරි සුමඞ්ගල නායක ස්ථවිර
යන්ගේ ශිෂ්‍ය මේධඞ්කර දේවමිත්ත දෙදෙනාවහන්සේය, ඒ
දෙදෙනාවහන්සේගේ ශිෂ්‍ය සුවණ්ණජෝති ආචාර්යතෙමේය,
සුවණ්ණජෝති ආචාරීන්ගේ ශිෂ්‍ය කෝදාගොඩ උපසෙන ස්ථවිර
යන්වහන්සේය (අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි
කරනු.) ශක වර්ෂ 1748 වැන්නෙහි උපාලි මහාස්ථවිරයන්
වහන්සේලාගේ අනුශිෂ්‍ය පක්ෂයක් විසින් ග්‍රාමශුද්ධිය නො
කොට, අස්ගිරි ගම්හි කරනලද උපසම්පදා කර්මයන් ගැන
දෝෂාරෝපණය කොට මල්වත්තේ "ධර්මවිනයධර" පක්ෂය
විසින් සාදා ප්‍රසිද්ධ කරනලද සීමාසඞ්කරච්ඡේදනී නම් ග්‍රන්ථ
යෙන් හා අස්ගිරි පක්ෂය විසින් ඊට පිළිතුරු වශයෙන් ප්‍රසිද්ධ
කරනලද ලියුමෙහි–"සීමා විපත්තියක් ගැන උපසම්පදාව
නොපිහිටන වග මෙතුවක් කලකට අහන්ට සම්භ උනේ නැත–
ඒ කුමක්නිසාද? සර්වප්‍රකාරයෙන් අසීමාවූ ආකාශයෙහිදීත්
ඤත්තිය සතරවෙනිවූ මේ උපසම්පදා කර්මය මනාකොට සිද්ධ
වෙන බව සූත්‍ර වශයෙන් බුද්ධදේශනාවේ පෙණී තිබෙන
හෙයිනි." යනාදී මතාන්තර සහිතවූ නානාවිධ දුරාචීර්ණ විනය
පිළිපැදුම් දක්නාවූ විනය ධර්මය හා විනයානුලෝමික ප්‍රතිපත්ති
යත් දන්නා කවරෙකුට වුවත් ථෙරිය ආචරිය පරම්පරාව හා
සසඳා බලා මෙය නිකායාන්තරයකැයි නිර්ණයට බැසගැනීම
නොවෙහෙසින්ම වන්නේය. මෙබඳු නිකායාන්තරික පක්ෂය
කින් ධර්මවිනය උගත් ඒ ඇඳුරු පරපුරෙහි ශිෂ්‍යයෙක්වූ කෝදා
ගොඩ උපසෙන ස්ථවිරයන්වහන්සේ විසුංගාමසීමාවිනිශ්ච
යෙහිදී පරවාදය පිළිගැනීම ආශ්චර්යයට කාරණයක් නොවේ.
මේ පක්ෂයෙහිලා උපසෙන ස්ථවිරයන්වහන්සේගේ ආචාර්ය
ගෞරවය හා හෘද්ගත විශ්වාස භක්තිවත් භාවයත් අබද්ධසීමා
විනිශ්චය නම් ග්‍රන්ථයෙහි 30 වෙනි පිට හා 31 වෙනි පිට කියවා
තේරුම් ගත යුතුයි. මෙසේ උභය ආචාර්ය පරම්පරාවශයෙන්

විනිශ්චය කිරීමෙන් අග්ගධම්මාභිවංශ ස්ථවිරයන්වහන්සේගේ වාදය ස්ථවිරාචාර්ය පරම්පරාගත හෙයින් පරිශුද්ධ බුද්ධමතයයිද කෝදාගොඩ උපසෙන ස්ථවිරයන්වහන්සේගේ මතය නිකායාන්තරික පරවාදයකැයිද තීරණයට යන්නේය.

## දූෂිත නිරාකරණයක්.

බුරුම දේශයෙහි භික්ෂූන් ලක්ෂසංඛ්‍යාවක් හා විහාරාරාම දහස්ගණනක්ද නිකාය වශයෙන් භික්ෂූන් කතිපය කොටසක්ද වාසය කෙරෙති. මේ සියලුදෙනා වහන්සේම පූර්වෝක්ත ස්ථවිරාචාර්ය පරම්පරා දෙකට අන්තර්ගතවූවෝම වෙති. මෙයින් පිටත් නිකායාන්තරීය භික්ෂුනමක් බුරුම රාමඤ්ඤ ජාතික භික්ෂූන් අතර නැත්තේමය. මේ විවාද වස්තුකවූ විසුංග්‍රාම ක්‍රමය පූර්වයෙහි අභිමත නොකළාවූ හෝ දැන් අභිමත නොකරන්නාවූ භික්ෂුනමක් තබා උපසෙන ස්ථවිරයන්ට පක්ෂපාතවූ සාමණේර නමක්වත් බුරුමරට අවිද්‍යමානය. ඒ බව මතු දක්වන විසුංග්‍රාමසීමා ප්‍රතිපාදන ලිපිවලින් ප්‍රකාශ කරනු ලැබේ. එසේ ඇති කල්හි "එහෙයින් බුරුම දේශයෙහි ධර්මවිනයවාදී (විසුංග්‍රාම පක්ෂයෙහිලා උපසේන මතය අවලම්බනය කළ) ලජ්ජී පක්ෂයක් විසින් ශාසන ධර්මය යෙහෙන් ආරක්ෂා කරගෙන ආබව මනාකොට හැඟියයි" (අ–වි–22–පිට) යන වාක්‍යය උපසේන ස්ථවිරයන්වහන්සේ කුමට කීයේද? ඒ දුරාලාපය වනාහි ආත්මගර්භ සඤ්ජනිත සම්මෝහ විකාරයක් මුත් කිසිවිටෙකත් කරුණු සහිතව ඔප්පුකළහැකි කරුණක් නොවේ. අන්ධයා අතින් ගත් සැරයටිය ඔහුට පරම ප්‍රතිෂ්ඨාව වීනමුත් පියවි ඇස් ඇතියනට එය එසේ ගරු වස්තුවක් නොවේ. කල්‍යාණි ශිලාලිපිවල එන ධර්ම චෛත්‍ය රාජ මතය ආචාර්ය පරපුරක් නැති විනය නූගතුන්ට මහා හසතසාර විනිශ්චයක් වුවත් අවිච්ඡින්න විනයාචාර්ය පරම්පරාවක් ඇති බුරුමරට විනයධරයන්ට ඒ විවේක කාලයට පරිහාස කථාවක් වූයේ අද ඊයේ නොවේ. ශාසනයෙහි උපදනා සියලු මතාන්තරයන් චතුර්විධ විනයෙහි ලා තුලනයකර බැලීමට සමත් උසස් විනයධරයෝ තුලාව කිසිල්ලේ රුවාගෙන අතින් කිරා දුන්ද පිළිගන්නා අඥානයන්සේ නොවිමසා පරමතයක් කුමට පිළිගනිත්ද? කල්‍යාණි ප්‍රකරණයෙහි සඳහන්වන සීමාසංකර ශාසනාර්බුද පිළිකා රාශිය ඇතිඋනේ රාමඤ්ඤරටේ නමුත් ඉන් බොහෝ අතීතයෙහි සිට නිර්මලව පැවත එන බුරුමරට ශාසනයට එයින් උවදුරක් ඇතිවූ බව ශාසනවංස කල්‍යාණි

ප්‍රකරණ රාජවංශාදී කිසිම ශාසනික ඉතිහාසයෙක්හි දක්නු නොලැබේ. මේ දෙරට රජුන්ගේද සවභාවයෙන් අන්‍යොන්‍ය මිත්‍රධර්මයක් නොපැවැති බවත් ඔවුනොවුන්ගේ විජාතිය අසමගිය ආගම සම්බන්ධයෙන් පමණක් වැසී තිබුණු බවත් සැලකිය යුතුයි. ධර්ම චෛත්‍යරාජයාගේ ශාසනශුද්ධිය බුරුමරට වැසි සඞ්ඝයාද පිළිගත් නමුත් කල්‍යාණී ශිලාලිපිවල කොටවනලද ඇතැම් ආගම විරෝධි අතිබාධිත අවිනය කථාවන් එදත් අදත් එරට වැසි උසස් පහත් කිසිම ශාසනික උගතෙක් පිළිගෙන නැති බව සක්සුදක්සේ ප්‍රකටව පැණේ. කල්‍යාණී සීමාවද ආරාමයක් පාසා පවතින විසුංගාමසීමාව කට වඩා ලක්දිව ප්‍රකට තරම් විශෙෂ ගෞරවයක් අද උසුලන බවක් නොදක්නා ලැබේ. යථොක්ත විසුංග්‍රාමසීමාවක උපසම්පදා වීමට වඩා කල්‍යාණී සීමාවෙහි උපසම්පදා වීමේ විශෙෂ ගුණ ලාභයක් ඇති බවක්ද බුරමරට වාසීහු සම්භාවනය නොකරත්. මේ වනාහි කල්‍යාණී සීමාව කෙරේ අනාදර දැක්වීමක් නොව මේ ශාසනික උසස් පඬිවරයන් සවකීය විසුංග්‍රාමසීමාව කල්‍යාණී සීමාව හා සමාන ගෞරවයෙන් සැලකීමේ ශාසන ශුනානුගත පූරුද්දයි. කරුණු මෙසේ හෙයින් කෝදගොඩ උපසෙන සථවිරයන්වහන්සේ තම පක්ෂය ගෙන විසුංගාමසීමාවන්ට පටහැණිව ක්‍රියාකරන කොටසක් බුරුම රට සිටියයි ප්‍රකාශකළේ අවිද්‍යා ප්‍රලම්බනයකින් නොවේ නම් ලොව මුළාකරන මායා අදහසින් බව සැලකිය යුතුයි.

## කල්‍යාණී ශිලාලිපි හා විසුංග්‍රාම වාදය.

කල්‍යාණී ශිලාලිපි හෙවත් (කල්‍යාණී ප්‍රකරණ) යෙහි එන සීමාවිනිශ්චය කථාවෝ උපසෙන සථවිරයන්වහන්සේගේ විසුංගාම විමොහයට නිල් කන්නාඩියක් වැනි විය. මෙයින් රාශියක්ම සූත්‍ර, සූත්‍රානුලොම ආචාර්‍ය්‍යවාදයන්හි බහා විනිශ්චය කටයුතු අතනනොමත මිස සුවිනිශ්චිත සිද්ධාන්තධර්ම නොවෙති. උපසෙන සථවිරයන්වහන්සේගේ හසකසාර රත්නයක්වූද නිරවද්‍ය විසුංගාමයන්ට අබභාචිකඛණය කරමින් උපන් ප්‍රථම විතණ්ඩ මතයවූද "යෙච පන ථෙරා ගාමලක්ඛණ රහිතං" යනාදී දුර්ව්‍යාක්‍යයට විසුංගාමසීමාවිනිශ්චය ග්‍රන්ථයෙහි සියලු තැනින්ම පිළිතුරු ලැබෙන බැවින් මෙහි ඒ ගැන කිසිවක් සඳහන් නොකරමු. නමුත් උපසෙන සථවිරයන්වහන්සේලාගේ අනවස්ථිත අගතිගාමී තාවය පෙන්වීමට එක් කරුණක් කල්‍යාණී ප්‍රකරණයෙන් ගෙනහැර දක්වන්නෙමු. "අපෙප

කෙච්ච ථෙරා යස්මිං ගාමක්ඛෙත්තෙ සීමං බන්ධිතුං ඉච්ඡන්ති තස්සඤ්ඤෙහි ගාමක්ඛෙත්තෙහි රුක්ඛසාඛාදි සම්බන්ධං අච්ඡින්දිත්වා තස්මිං ගාමක්ඛෙත්තෙ අන්තොනිමිත්ත ගතානඤ්ච බහිනිමිත්ත ගතානඤ්ච සබ්බෙසංපි භික්ඛූනං හත්ථපාසානය නාදිං කත්වා සීමං බන්ධන්ති, තස්සං සීමායං උපසම්පදාදිකම්ම කරණ කාලෙ පන තස්සාච ගාමසීමාය රුක්ඛසාඛාදි සම්බන්ධං අවියොජෙත්වා උපසම්පදාදි කම්මං කරොන්ති තෙසං උපසම්ප දාදි කම්මං පරිස විපත්තිතො කුප්පති.”

**භාවය—** ඇතැම් තෙරුන්වහන්සේලා යම් ගම් කෙතෙක්හි සීමා බඳින්ට කැමති වෙද්ද? ඒ ගම හා යාව පිහිටි ගම්වල රුක් අතු වැල් මුල් ආදියෙහි සම්බන්ධය (හෙවත් ගම් දෙක එකට සම්බන්ධවී තිබෙන රුක් වැල් ආදිය කපා වෙන් නො කොට ඒ ගම් කෙත්හී ගම් සීමා ඇතුලත හා පිටත වසන භික්ෂූන් අත්පසට පමුණුවා ගැනීමාදි පූර්වකෘත්‍යයන් කොට සීමාබන්ධනය කෙරෙත්. ඒ බැඳගත් සීමාවෙහි උපසම්පදාදි විනයකර්මයන් කරන කාලයෙහිද ඒ බද්ධසීමාව පිහිටි ගමෙහි අවට ගම් හා සම්බන්ධය ඇති රුක් වැල් අතු ආදිය ඉවත් නොකොට උපසම්පදාදිය කෙරෙත්. ඔවුන්ගේ ඒ උපසම්පදා දිය පිරිස වශයෙන් කොප්‍ය වෙයි. මේ කියන පරිස විපත්තිය සත්‍යයක් නම් අද ලක්දිව තබා ලොකයේම සුද්ධ සීමාවක්වත් උපසපන් භික්ෂු නමක්වත් ලැබේද? උපසෙන ස්ථවිරයන් වහන්සේලා සීමාබන්ධනය කරන ගම් වටේට පිටතින් වැටී තිබෙන අතු වැල් ආදිය කපා සුද්ධකරවන බවක්වත් පොළොව සාරවා ගැඹුරු අගලක් කොට මුල් අරන්දමන දමවන සිරිතක් වත් කිසිවෙකුට අසන්ට දකින්ට ලැබී තිබේද? උපසෙන ස්ථවිරයන්වහන්සේලා මේ විනයට පිළිනොපදින බැවින් තමන් කරන සීමාබන්ධනවලට කුමක්වෙලා ඇද්ද? නොහොත් නොපිළිපදින්නේ මේවා ආගමවිරොධ බොරු නිසා නොවේද? තමන් නොපිළිපදින පොතකින් තමන්ට වාසි ඇති ඒවා තෝරාගෙන අනුන්ට නිගාකරන්ට ඊම ලොකපාලක ධර්ම හීන කමකි. මේ පොතෙන් උගත් බණින් විසුංගාමයට කළ නිගාවත් මෙවැන්නක් බව දතයුතු. ශාසන සම්මත බද්ධ සීමාවන්ට බුදුන් වදාළ සමෙහද දොෂය ලොකසම්මත ග්‍රාම සීමාවන්ටත් ආරොපනය කොට ග්‍රන්ථාරූඪකර තැබීමෙන් හා ඒවා පිළිගැනීමෙන්ම විනයධරත්වයේ ප්‍රමාණය වැටහේ. මේවා ගැන අගති රහිතව ක්‍රියාකෙරෙත් නම් උපසේන ස්ථවිර යන්වහන්සේලා **භික්ෂු ප්‍රතිඥාව අත්හැරීම** හෝ මේ පොත පිළිනොගෙන හැරීම කටයුතු බව කාහටත් තේරුම් යායුතුයි.

## විනයාලඞ්කාර ටීකාව හා විසුංගාම විවාදය.

ඇතැම් තෙරුන්වහන්සේලා ගාමසුද්ධිය කොට සීමා බැඳ ගැනීම දුෂ්කර නිසා උපදවනලද ක්‍රියා පිළිවෙළක් විනයාලඞ්කාර ටීකායෙහි සඳහන්ව තිබේ.

එනම් "මයං සීමං බන්ධිතුකාමා තස්මා – පෙ – රාජිනං ආපුච්ඡිත්වා තෙන ඔකාසෙ කතෙ – පෙ – අඤ්ඤෙ පණ්ඩිතා නසම්පටිච්ඡන්ති" යනුයි. "මහරජ අපි සීමාවක් බඳිනු කැමැත්තෙමු අසවල් තැනින් මෙපමණ බිම් කොටසක් විසුංග්‍රාමය කෙරේවායි රජහු අතින් විචාරා රජ මැනවයි ගිවිස කල්හි එපමණකින් ඒ බිම්පෙදෙස විසුංග්‍රාමයයි සිතා එහි ග්‍රාමසුද්ධිය කොට සීමාබන්ධනාදිය කොළෝය. එය අනික් ආචාර්ය්‍යකෙනෙක් නොපිළිගනිත්" යන ආදි වශයෙන් ආ ඒ පිළිවෙළ මතාන්තරයක් බව විනයාලඞ්කාර කතුතුමෝම පැහැදිළි කළෝය. අපිදු එය විනයාලඞ්කාරයෙන් බලා දැන සිටිමු. කටවෙනි වචනයෙන් ඒ වේලාවට ඉඩදුන්නා මිස රාජපණ්ණ සඞ්ඛ්‍යාත බිම් ලේඛණයෙහි ලියා පදිංචිකිරීමක්වත් බදු අයකරන්නෙකුට හෝ වෙනයම් කෙනෙකුට දීමක්වත් නැති බැවින් ඒ බිම් පෙදෙස විසුංග්‍රාමයක් නොවේයයි කියහැකි නමුත් දෙමටගොඩ **මහාවිසුද්ධාරාමයේ** විසුංග්‍රාමයට දොස් නැගීමට එය සාධකකරගැනීම හා රජුන්ට අයැදීමෙන් බිම්කොටස් විසුංග්‍රාම කරවාගැනීම වරද බව ප්‍රකාශකිරීමට එය උපායක් කොට ලොව මුළාකරන්ට තැත්කිරීම මහත් අපරාධයකි. විනය නීත්‍යනුකූලව ආරෝපණය කරනලද දොෂයන්ට ඉඩ නොතබා ශාසනභාරධාරී ලජ්ජී පරම්පරානුයාත ශික්ෂාකාමී මහාස්ථවිරයන්වහන්සේලාගේ හා ධර්මවිනය උගත් මහරජ දරුවන්ගේත් සම්බන්ධයෙන් ඇතිකර තිබෙන ශාසනානුලොමික විසුංග්‍රාමයන් කිළිටිකිරීමට එය උපායක් කොට යෙදීම යමෙකු විසින් කරනලද අපරාධයක් තමහට අප්‍රියවූ නිරපරාධියකුට ආරෝපණය කොට ඔහු වැනසීමට උපාය යෙදීමක් වැනි දුෂ්ට කපටි ක්‍රියාවකි. (අ. සි. වි 16 පිට සිට 20 පිට) දක්වා විනයාලඞ්කාරාචාර්ය්‍යයන්ගේ අදහස් විපරීතකොට ලියා තිබෙන බොරු රාශිය සිහිනුවණ ඇති අයට පුදුම එළවයි. විනයාලඞ්කාර කර්තෘන්වහන්සේ උපසෙන ස්ථවිරයන්ලාගේ අන්ධ මතය නොව ථෙරිය පරම්පරාවට අයත් විසුංගාම මතයෙහි පිහිටියෙක් බව **මන්ලීෂෙෂ්‍යාඩෝ** ආචාර්ය්‍යයන්ගේ ලිපිය කියවීමෙන් දතහැකි වේ. චෛත්‍යයට පුදනලද භූමිය විසුංගාමයයි

සලකා එහි සීමාසම්මත කිරීමෙන්ම විනයාලඞ්කාර කර්තෘ ආචාර්‍යතුමෝ උපසෙන ස්ථවිරයන්වහන්සේලාගේ අඞ්වෙණ්යෙහි එල්බගත්තෙකු නොවන බව සැකහැර දතයුතු.

**විසුංගාමසීමාවාදය ලක්දිව පහළවීම.**

විසුංගාම වාදයෙන් ජය ප්‍රාර්ථනා කරන උපසෙන තෙරණුවෝ මෙහි සහභාගිකයන් ලෙස නිකායනතරිකයන්ද පොළඹවාගනු පිණිස හික්කඩුවේ සිරි සුමඞ්ගලාභිධාන නායක ස්ථවිරයන්වහන්සේ සම්බන්ධ පුවතක්ද ගෙනහැර දක්වයි. තමන් අසා යවන ඉතා සුළු කරුණුවලට පවා ඉතා ඉක්මණින් පිළිතුරු එවන බුරුම මහාස්ථවිරයන් වහන්සේලාගෙන් යථෝක්ත නායක ස්ථවිරපාදයන්වහන්සේට උපන් සැකය විසඳා ගැනීමට බුරුමරට යැව් ලියුම් වලට පිළිතුරු නොලැබීමට හේතු කවරේදැයි දන්වත් විවේකව කල්පනා කරනු. තම ප්‍රාචාර්‍යයාගේ "නායක" තත්ත්වයම බොහෝ උසස්කොට සැලකීමෙන් එය හාස්කමක් කොට ගෙන මුළාවීම නුවණට හුරු නොවේ. **වජිරාරාම** මහානායක ස්ථවිරයන්වහන්සේද පුද්ගලානුරූප තත්ත්වය සලකා **සුසීම** ප්‍රශ්නයෙහි බුදුන් රහතුන්ගේ පිළිපැදීම මෙන් උපසෙන ස්ථවිරයන්වහන්සේගේ ප්‍රශ්නයන්ට නිශ්ශබ්දවූ බව පෙනේ. මේ කථා කෙතරම් දුර සත්‍ය වේදැයි නොකියහැකි වෙතත් "නායක මාහිමියන් වහන්සේ" විසින් "බුරුම තෙරුන්වහන්සේලා" ගෙන් කරුණු විචාරීමට පත්කිරීමෙන් ලැබූ අභිෂෙකය ස්වල්ප සංග්‍රහයක් නොවේ. ස්වකීය විනයාචාර්‍ය පරම්පරාවෙන් ලත් මේ දායාදයෙන් අභිමානයට පැමිණි උපසෙන ස්ථවිරයන්වහන්සේට ථෙරිය පරම්පරාගත තම උපසම්පදාව පවා අමතකවීම පුදුමයකි. යථෝක්ත පක්ෂයේ ආචාර්‍ය පරම්පරා සීමාබන්ධන උපසම්පදාදී සියලු ශාසනික කටයුතු **ආචිණ්ණ කල්පික අවිනය ක්‍රියාවන් ලෙස** පරම්පරාවෙන්ම කියාගෙන එන මේ උපසෙන ස්ථවිරයන්වහන්සේලා තම පක්ෂයෙහි එන දළහිකර්මාදි කුදු මහත් නොයෙක් ශාසනික සිරිත් අවිනය ලෙස ප්‍රකාශකරන සිරිසුමඞ්ගල පක්ෂයට වැදී එම පක්ෂය හිසින් බුහුමන් කරමින් ස්වකීය මහණ උපසම්පදා පරම්පරාවට වාදාරොපණය කරන්ට ඊම අකෘතඥ කමක් නොවෙතොත් අහස දුටු අභිමානයෙන් තමන් සිටි භූමිය අමතකවී මුහුනට කෙලගසාගැනීමවැනි හීන කමකි. ස්වකීය නිකායාන්තරීය පරම්පරා ලබ්ධිය නිසා නොදැනී මෙය සිදුවූ බව නිශ්චය කටයුතු වේ. තවද **විසුඩාචාර**

**රාජගුරු** මහානායක ස්ථවිරපාදයන්වහන්සේ ජීවත්ව සිටින්
තුරුම උන්වහන්සේගෙන් නොයෙක් ධර්ම විනිශ්චය ලබාගනි
මින් ඒ සියල්ල තම උගත්කම ලෙස ප්‍රකාශකරමින් මේ උප
සෙන තෙරණුවෝ ජයකොඩි නැගුවෝය. ඉතා ලඟදී මුද්‍රණ
යෙන් ප්‍රසිද්ධ කර තිබෙන විසුද්ධාචාර මාහිමියන්ගේ **ධර්මවිනිශ්චය
ප්‍රකරණයෙහි** උපසෙන ස්ථවිරයන්ගේ ප්‍රශ්නවලට දුන් පිළි
තුරුම බොහෝ රාශියක් දක්නා ලැබෙත්. මේ අබද්ධසීමා
විනිශ්චය ග්‍රන්ථයෙහි 46 වෙනි පිටේ අරඤ්ඤසීමාවිනිච්ඡයද
උන්වහන්සේගෙන් ලබාගන තිබෙන බව පෙනේ. වෙනත්
විසුංගාමාදි විනිච්ඡයන් එහි ඇති බැවින් උපසෙන ස්ථවිරයන්
විසින් විසුංගාම ප්‍රශ්නයක් උන්වහන්සේට යැව්වා නම් එහි
විනිශ්චයද යථොක්ත ග්‍රන්ථයේම සඳහන් නොවෙන්ට කරුණු
නැති බැවින් උපසෙනස්ථවිරයන්වහන්සේගේ මේ ප්‍රකාශය
ලොව රවටන මුසාවාදයකැයි නොකීමට කරුණු නොපෙනේ.
මෙසේ ලක්දිවට පෙර නොතිබුණ විසුංගාමසීමාවාදය පහළ
කළේ මේ නිකායාන්තරීය ප්‍රාචාර්ය ශිෂ්‍ය දෙපොල විසින් බව
ස්වකීය ග්‍රන්ථයෙන්ම ප්‍රකාශ කරන ලදී.

## නිෂ්ඵල ව්‍යාපාරයක්.

උපසෙන ස්ථවිරයන්ගේ විසුංගාම දෝෂාරොපණය සත්‍ය
යක් වූවහොත් බුරුමරට පමණක් නොව ලක්දිව බුරුම නිකා
යට හා තමන්ගේම රාමඤ්ඤනිකායටත් මහණ උපසම්පදාව
උගහට වේයයි මේ විවාදයෙහි තතු දත් සුධීවරයෝ පැහැදිලි
ලෙසම එකල කීවාහුය. එය තමන් නැති දොස් පවරා ගැනී
මක්යයි උපසෙන ස්ථවිරයන්ගේ ප්‍රකාශය වූවත් මේ අවිචාර
කෝලාහලයෙන් තමා හිසපිට එන මහමුගුරක් එයින් දක්වන
ලද්දේය. “මෙහිදී තිපවරක් බුරුමදේශයට ගොස්.........
අමරපුර නිකාය පිහිටුවාළු. ඒ ඒ තෙරුන්වහන්සේලාගේ පර
පුරෙන් පැවතෙන්නෝ ඒ ගැන සාධක දක්වා සිය නිදොස්කම්
ආරක්ෂාකර ගනිත්වා”යි කියා ඝොෂාවක් කොට තමන්ගේ
කොටස රැකගන්ට ගොස් කරතිබෙන්නේ ඉඳුරුවේ ආචාරි
යාගේ කඩතොළු මැකීමට දෙවෙනි නොවන වැඩකි. රාමඤ්ඤ
නිකාය පිහිටුවීමේ මූලික මහාස්වාමීන්වහන්සේලා උපසම්පදා
වූ විසුංගාමසීමාවටත් තමන් අඹරාපු ගුළියෙන්ම පහර වැදුන
බව දුටු උපසෙන ස්ථවිරයෝ ඒ දෝෂ පරිහාරය පිණිස
(අ. සී. වි 36 – 37 පිටුවල) කියා තිබෙන හැලිවලින් කිසි පිහිටක්
නොලැබෙන බව හා රාමඤ්ඤනිකායට උපසම්පදාවක් ඇත

හොත් එය උපසෙන ස්ථවිරයන්ගේ දෝෂාරෝපනවලින් පහර ලැබූ ථෙරිය පරම්පරායාත විසුංගාම ක්‍රමයේ සීමාශුද්ධියකින්ම බවත්, තමන් හා තමන්ගේ සියලු දුර්ජිාද බිඳී යාමට මේ ලියා තිබෙන හැලිම තමන්ගේ අවාසිය ලබාදෙන හැටිත් මෙසේ අවබොධ කරගත යුතුයි.

## උපසෙනස්ථවිර මතයේ විසුංග්‍රාමයෝ.

විසුංගාමය යටත් පිරිසයෙන් සතරමුණ (කිරිය) කට වඩා විශාල බිම්පෙදෙසක් වියයුතු බව –(1)– එය කිසිවෙකුගේ ඉල්ලීමක් නැතුව එම්ප්‍රදෝරු මහරජකෙනෙක්ම (රාජකාරිය පිණිස) සිය කැමැත්තෙන්ම පියවි ගමින් වෙන්කොට යමෙකුට බූතානිවිඳිම පිණිස දුන් එකක් බව (2) කඳු හෙල් මිටියාවත් වැව් පොකුණු සොහොන් කෙත් වත් ආදියෙන් එය යුක්තවිය යුතු බව (3) ගැණු පිරිමින් වසන ගේ දොර ඇති කෑම් පීම් කථාබස් කරන පෙදෙසක් වියයුතු බව (4) වැසියන් සතු ඉඩමක් නොව රාජසන්තක භූමියක් වියයුතු බව යනාදිය උපසෙනස්ථවිර මතයේ විසුංග්‍රාම ලක්‍ෂණයෝය. (මණ්ඩලේ) හෙවත් රතන පූර්ණ නුවර පිහිටි රාමඤ්ඤනිකාය මූලිකස්ථවිරයන් වහන්සේලා උපසම්පදාව ලැබූ ‘මහාවිසුතාරාම’ නම්වූ සංඝරාජාරාමයෙහි පිහිටි විසුංගාමය යථොක්ත අඞ්ගයන්ගෙන් යුක්තදැයි පරීක්‍ෂාකර බැලීම මෙකල එතරම් දුෂ්කර වැඩක් නොවේ. මේ ආරාම පිහිටුවීමේ පිළිවෙළ කථාව බුරුම රාජවංශයේ විස්තරයෙන්ම කියා තිබේ. සෙසු කරුණු අතුරෙන් මෙහි භූමිප්‍රමාණය ඤෙයයධම්ම සඞ්ඝරාජයන්වහන්සේගේම කනිෂ්ඨ ශිෂ්‍යනමක්වූ දැන් එම සඞ්ඝරාජාරාමයෙහි අධිපති ධූරය උසුලන **වෞපණ්ඩෞං ශෙෂාඩෝ** නමින් ප්‍රසිද්ධවූ “ගුණාලඞ්කාර මහාධම්ම රාජගුරු”—“ගුණාභිලඞ්කාර කවිධජ මහාධම්මරාජාධිරාජගුරු” යන අක්ත දෙකකින් මහරජවරුන්ගෙන් පිදුම් ලැබූවාවූ මහාස්ථවිරපාදයන්වහන්සේ විසින් සහතිකකොට අප වෙත එවනලද බුරුම ලිපියෙහි මෙසේ සඳහන්වී තිබේ. **“මණ්ඩලේනුවර නැඟෙනහිරින් පිහිටි සඞ්ඝරාජයන්වහනසේ වැඩසිටියාවූ මහාවිසුතාරාම නම් විසුංගාමයේ ප්‍රමාණය නැඟෙනහිර සිට බටහිරට අඞ් 488 කුත් අඟල් පහක් හා, දකුණේ සිට උතුරට අඞ් 390 ක්ද වේ. මේ මෙකල මිනින්දෝරුවන් පාවිච්චිකරන චේන් පටියෙන් මැණ බැලීමෙන් ලැබුණ ගණනයි”.** මෙය දැන් ව්‍යවහාර ගණනෙන් **රූ. 3. පාර්. 36. ශා. 26. අඞ්. 3. අඟ. 54 කි.** මෙහි වැපිරිය හැක්කේ

වී තුරුණි අමක් පමණකි. මේ මෙසේ තිබියදී (අ. සී. වි 37 පිට) "කිසිවෙකුගේ ආයාචනාවක් නොමැතිව මහරජතුමාගේම කැමැත්තෙන් දශකිරියකටත් වඩා අධික භූමිප්‍රදෙශයක් භූමි ශාස්ත්‍රඥයන් ලවා වෙන්කරවා" යනාදියෙන් මේ සඞ්ඝරාජා රාමසථ විසුංග්‍රාමය දශකිරියකටත් එනම් අමුණු හතළිහකට වඩා වපසරියැති භූමිප්‍රදෙශයක්යයි උපසෙනසථවිරයෝ මෙසින් කියා තිබේ. අමුණක වපසරිය අක්කර හතර බැවින් අක්කර 40 ක් ඇති බිම්පෙදෙසක් විය යුතුයි. එක අක්කරය කුත් නැති සඞ්ඝරාජාරාමසථ විසුංග්‍රාමය අක්කර 40 ක් විශාල කරමින් ප්‍රකාශකළ මේ විනයධරයාට මුසාවාදයෙහි හිරිඔතප් තිබේදැයි සලකා බලත්වා. ළදරුවෙකුට පවා ප්‍රත්‍යක්ෂ කර ගතහැකි ලොකප්‍රකට මෙතරම් සුළු කරුණක් ගැන ලොව මුළාකිරීමට මෙතරම් විශාල බොරු ප්‍රකාශකරන අය සාමාන්‍ය ජනයාට නොතේරෙන ධර්මවිනය විනිශ්චයක් සත්‍යයෙහි පිහිටා ප්‍රකාශකරතොත් එය ගින්නෙන් දිය සෙවෙල් නැගීමක් මෙන් විය යුතුයි. මෙසේ මේ සඞ්ඝාරාජාරාමසථ විසුංගාමසීමාව අඩි ගණනක් ඇති කුඩා පෙදෙසක්ම බව ඔප්පුවීමෙන් උපසෙන සථවිරයන් අසත්‍යවාදියෙක් වීම, රාමඤ්ඤනිකායේ මහණ උපසම්පදා තත්වය හා, බුරුමරට විසුංගාමසීමාවන් උපසෙන සථවිරයන් විසින් නොකැමැත්තෙන්ම පිළිගන්ට සිදුවීම යන කරුණු එකවිටම ප්‍රකාශ වූහ. (2) මේ භූමිය යම් ග්‍රාමභොජක යෙකුට අයබඳු බුත්තිවිඳීමට දුන් එකක් නොවන බැවින් දෙවෙනි අඞ්ගයෙන්ද අසම්පූර්ණයි. (3) මේ රූඩ් තුනේ භූමියේ කඳු හෙල් මිටියාවත් ඇල දොළ පව්ත සොහොන් කොයින් ලැබේද?—ඒ නිසා මේ අඞ්ගයෙන්ද හීනය. (4) මේ සුළු විහාර භූමිය තුළ තාප්පයෙන් ඇතුළත (එකල්හි තිබුණේ උණ පැලලි තාප්පයකි.) ගිහි ජනයා පදිංචි එකම ගෙයක් වත් නොමැති බැවින් මේ අඞ්ගයද විකලයි. මේ කියනලද අවයවයන්ගෙන් හීනවූ මේ සීමාව අසීමාවක් බව උපසෙන මතයෙන් තහවුරුවන බව හා උපසෙනසථවිරයන් රාමඤ්ඤ නිකායට මහණ උපසම්පදාව නැතැයි මෙසේ තමන් පර්‍යාය යෙන් ප්‍රකාශකරන බවත් දැන් කාටත් නොපෙනේද? තවද අචිරවති? නදියක උදකුක්ඛෙප සීමාවක හා කල්‍යාණී සීමා වේත් දළ්හීකර්මය ලැබූ බව කියමින් පිරිමහන්ට ගොස් තිබේ. සීමා සම්පත් තබා පරිස සම්පත් ආදියත් උපසම්පදාවට අඞ්ග ලෙස උපසෙනයන්වහන්සේ නොසලකන බව දැන් රටේ ප්‍රසිද්ධයි. මේ දළ්හීකර්මය කළ පිරිස බුරුමරට හැමතැනම

තිබේන විසුංගාමසීමාවල උපසම්පදා ලද්දවුන් බව සැලකෙන් විට මේ පිළියමත් අනිසාරයට අමුඩය වැනි එකක් බව පෙනේ. මෙසේ උපසෙනසථ්විරයන්වහන්සේගේ විනයේ හැටියට රාමඤ්ඤනිකායට උපසම්පදාව නොමැතිවිය යුතුයයි කී සුධී වරයන්ගේ විතර්කණය සථිරතරම විය. දැන් ඉතින් ඊශ්‍යා පිශාචියගේ ආවේශයෙන් අනුන් නසන්ට ඇටවූ උගුලේ තමන්ගේ වැලවරිගේම තමන්ගේ අතින් වැටී ගිය බව නො පෙනේද?—"මකසං වධිස්සාමීති එළමූගො, පුත්තො පිතු අබ්භිදා උත්තමඞ්ගං." දැන් ඉතින් රාමඤ්ඤනිකායට මහණ උපසම්පදාව ඇතැයි ප්‍රකාශකරන්නන් හා රාමඤ්ඤනිකායට මහණ උපසම්පදාව ඇතැයි පිළිගන්නෝත් මේ විසුංගාමසීමා ක්‍රමය පිළිගත් අය විය යුතුය. බටගාල පටලවන අලියෙක් මෙන් උපසෙනසථ්විරයන් රට පටලවා පෙන්නූ ඖදාරික ගම් කථා නොව **"රාජපණ්ණයෙහි ආරොපණය කොට රජුන් විසින් වෙන් වශයෙන් ගමක් ලෙස පිළිගැනීමෙන් විසුංගාමය වේ"** යන ථෙරිය පරම්පරායාත සූත්‍රානුලොමික විනිශ්චය පරිද්දෙන් යථොක්ත සඞ්ඝරාජාරාම විසුංග්‍රාමය හා බුරුමරට පවත්නා සියලු විසුංග්‍රාමයෝද දෙමටගොඩ මහාවිසුද්ධාරාමසථ විසුංග්‍රාමයද සාසනානුලොමික උතුම් සීමාවෝ වන්නාහ. එහි උපසම්පදාදි විනය කර්මයෝ අත්‍යන්ත නිරෝගී හෙයින් බුරුම රාමඤ්ඤ සියම් ලඞ්කා යන සියළු රටවල විභජ්ජවාදී පරපුරට අයත් භික්ෂූන්ගේ උපසම්පදාව නිර්මලය" යනු ශාසනානුගත විනිශ්චයයි.

## විනය ගරුකයන්ගේ සුවිනිශ්චයක්.

විසුංග්‍රාම ක්‍රමය හෙවත් එක ගමක් දෙකට බෙදා වෙන් කිරීම රාජකාරියට ඇතුළත් ආණ්ඩුවේ මූලාදැනින්ට අයිති වැඩකි. ගමක් කොටස්වලට කඩා වෙනම ගම් කිරීම පමණක් නොව පළාත් රටවල් ඉම් ලකුණු දක්වා වෙන්කිරීම හා එක් කිරීමත් වෙනත් කෙළවරක් නැති දණ්ඩන සංග්‍රහ හා රට දියුණුකිරීම් අයබදු ගැනීම් ආදිවූ කසළ බැහැරලීම නගර ශොධනය කෙළවරකොට ඇති ආණ්ඩුවේ රාජකාර්‍ය්‍ය ඒ ඒ කටයුත්තට ආණ්ඩුවෙන් හෙවත් රාජනියොගයෙන් බලය ලත් නිලධාරීන් විසින් සිද්ධකිරීමත් ඒවා රාජකාර්‍ය්‍ය හෙවත් රජ්ජුරුවන්ටම අයිති රජුන් සන්තක වැඩ ලෙස පිළිගැනීමත් මහා සම්මතයේ සිට පැවත එන ළදරුවන්ට පවා ප්‍රකට කාරුණකි. මීට ආණ්ඩුකාරයන්ගේ දෘෂ්ටි භෙදයෙන් කාරණයක් නැති බව

හා නැවත පැණවීමක් රාජනියෝගයකින් කරනතුරු පමණක් මුල් පැණවීම පවත්නා බවත් ලෝකශාසනවයේම උගත් සිහි බුඞ් ඇතියවුන්ගේ පිළිගැනීම වේ. අද ලක්දිව ලොකු ගම් හා පළාත් කොටස්වලට බෙදා නිලධාරින් මූලාදෑනින් පත් කරන්නේ ජෝර්ජ් මහරජතුමන් මෙහි අවුත්ද? ඒතුමාගේ බලය ලත් මූලාදෑනීන් විසින්ද? ඒ බෙදීම් පැනවීම් වලංගු නැද්ද? එසේ වෙන්කළ විසුංග්‍රාමවල භික්ෂූහු විනයකර්ම නො කරද්ද? ඒ විනයකර්ම වැරදිද? — යනාදිය නුවණැති ජනයා විමසත්වා — ආණ්ඩුවක නිලධාරීන් විසින් නීතියට අනුකූලව සිඞකරනුලබන සියළු කටයුතුවලටම රාජකාර්යයයි කියනු ලබන්නේ ඒවා රජුන්ගේ හෝ රජුන්ට අයිති කටයුතු නිසාම වේ. විසුංග්‍රාමය යනු ලොකසම්මතය හා රාජසම්මතය බවත් ලොකයා ආණ්ඩුවෙන් (රාජසම්මතයෙන්) කළ නියමය පිළි ගන්නා බවත් මේ විසුංග්‍රාම විනිශ්චයද එසේ ලෝකසම්මත යෙන් හා රාජසම්මතයෙන් පිළිගතයුතු බවත් දතයුතු වේ. එහෙයින් පඨවිස්සර මහරජුන් යටත් රාජකාර්ය කරන රාජ පුරුෂයා හෙවත් නිලධාරියා තමන්ගේ බලානුරූපව කරනලද ඉඩම් ගම්බිම් බෙදීම හෝ වෙන්කිරීම එක්කිරීම රජුන් විසින් කරනලද්දක් ලෙසම ලොකයද ශාසනයද පිළිගනී. මෙය මෙසේ නොවේයයි නිලධාරින් ප්‍රතික්ෂෙපකොට ඉඩම් ගම් පෙදෙස් මැන බෙදා වෙන්කිරීමාදි කටයුතු හෙවත් රාජකාරි සියල්ල රජ විසින්ම කටයුතුය. නිලධාරින්ගේ නියමය නො පිළිගන්නෙමුයි කියන්නෙක් ඇතහොත් ඔහු උම්මත්තකාගාර යෙහි පමණක් සිටියයුතු නමුත් මේ මතය දරන උපසෙන සථවිරයන් සිහිඇති මිනිසුන් අතර විසීම පුදුමයට පමණක් නොව බොහෝ දෙනාට අනර්ථ පිණිසද පවතිමය. (රාජ කාර්‍යසච් දෙති) රජතෙම කිසිවෙකුට දෙයි කියනලද්දේ ප්‍රධාන න්‍යායයෙන් බැවින් ඒ ඒ කටයුතුවලට බලය ලැබූ නිලධාරි රාජපුරුෂයන් විසින් දෙනලද්ද රජහුගේ දීමනාවමයයි දත යුතුයි. විසුඞාරාම්ක විසුංග්‍රාමසීමාව කෙරෙහි ඉපදවූ ඊර්ෂ්‍යා වෙන් මූලාව උපසෙනසථවිරයන් විසින් ලඞ්ඝනය කරන්ට ගියේ කෙතරම් උස් ප්‍රාකාරයක්ද කියා තෙමේ නොදනිතත් මධ්‍යස්ථ නැණවත් ලොකයාට මෙහි බරපතල කම වැටහේ. "රාජාදීහි පරිච්ජින්නභූමිභාගො" රජ ආදීන් විසින් පිරිසිඳිනා ලද භූමිභාගය යන තන්හි ආදි ශබ්දයෙන් බිම් බෙදා වෙන් කිරීමාදියට බලය ඇති අමාත්‍ය ඒජන්ත නාගරාධිපති ආණ්ඩු

කාරාදීන් ගැනෙණ බව දතයුතු වේ. ඒ බව "හෙට්ඨා වුත්ත නයෙන තාදිසානං අමච්චානං පරිච්ඡින්දිතපදෙසොපි රඤ්ඤෝව ආණාය පරිච්ඡින්නත්තා රාජායෙව පරිච්ඡින්නන්ති වුච්චති" (යට කියනලද නයින් එබඳු ගම්බිම් බෙදා වෙන්කිරීමට බලය ඇති අමාත්‍යාදීන් විසින් පිරිසිඳිනලද හෙයින් රජම පිරිසිඳියේයයි කියනු ලැබේ) යනු කෝදාගොඩ උපසේනස්ථවිරයන් වහන්සේ විසින්ම ත්‍රිපිටකධරත්වයෙහි හා පුරාණත්වයෙහි දත්තාභිෂේක ඇති (අ. සි. වි 21 පිට) **මෝඩාශෂාඩෝ** යයි ප්‍රසිද්ධ මේ නොබෝදා පරලෝ ගිය ධෙත්ත පබ්බතාචාරීන් විසින්ම ප්‍රකාශකර තිබීම බුරුම පැවිද්දන් කෙසේ වෙතත් නවීන විනයධරම්මන්‍ය නූගතුන් හිස රුජාවෙන් පීඩිතවීමට කාරණයකි. "පණ්ඩිත ධජ සිරිපවර මහාධම්මරාජාධිරාජගුරු නාමොපලක්ඛිත **මෙමං ඩයිං ශෂාඩෝ**" මහාස්ථවිරයන් වහන්සේ විසින් ලියනලද තෙපිටක විනිශ්චය නම් විශාල විනිශ්චය ග්‍රන්ථයේ 207 වෙනි පිට පිටපත්කොටගෙන පහත දක්වන සිංහල ලිපියෙන් බුරුම මහාස්ථවිරයන්වහන්සේලා කෙතරම් මේ ගැන සොයා බලා විනිශ්චයට පත්ව සිටිත්ද යනු තේරුම් ගත යුතුයි.

මණ්ඩලේ ශගයින් ආදී ඒ ඒ නගරයන්හි ගම් කොටස් බෙදීමට සහ එක්කිරීමටත් බලය ලත් ඒජනතාදී ආණ්ඩුවේ මූලාදෑනීන්ට දනුම්දී ලබාගන්නාලද බිම්පෙදෙස් බුරුම රජුන් මෙන් රාජපණ්ණයයි කියනලද බිම්ලෙඛණයට ආරොපණය කොට දෙනලද බැවින් විසුංගාම ලක්ඛණයෙන් සමන්විතව සීමාසම්මතයට කැපවූ බව අළුගවෙෂී ප්‍රාඥවූ ප්‍රියශීලි ශාසනාර්ථීන් විසින් නිසැකවම දතයුතු. ආණ්ඩුවේ ඒජනතාදී මූලාදෑනීන්ට ගම් කොටස් බෙදා වෙන්කරන්ට බලය ඇති බවත් ඇතැම් පළාත්වලින් ගම් විසුංකරවාගනු පිණිස එංගලන්තයේ වික්ටෝරියා මහාරැජිනිය කරා පැමිණි බුරුම බෞද්ධ දූතයන්ට "සුළු කටයුත්තක් සඳහා මහත් වියදම් දරා මේසා දුරකතර කුමකට ආවාහුද? ඒජනතාදීහු ගම් කොටස් බෙදා වෙන්කිරීමට සහ එක්කිරීමටත් බලය ලත් මූලාදෑනීහු නොවෙද්ද? නැවත මෙසේ වෙහෙස මහන්සි ගෙන නොඇවිත් ඒජනතාදී නිලධාරීන්ට දන්වා වුවමනාවූ විටක ගම් වෙන් කරවාගත යුතු"යයි වික්ටෝරියා මහාරැජිනියගෙන්ම පණිවුඩවූ බව "ඩාවේ" නගරයෙහි "මයංචෞං" විහාරාධිවාසී "සාගර" ස්ථවිරයන්ගෙන් දැනගනිමු.

තවද බුරුම ශක වර්ෂ 1248 දී මණ්ඩලේනුවර ආණ්ඩුවේ මහ ඒජනතතැන මහාජෝතිකාරාමයට පමුණුවාගෙන බුරුම රජුන් විසින් දෙනලද විසුංගාම ආඥාපත්‍රයක් පෙන්වා එංගලන්තයේ වික්ටෝරියා මහාරාජිනියගෙන්ද එයාකාර විසුංගාම ආඥාපත්‍රයක් ලබාදෙන ලෙස ජෝතිකාරාමාධිපති රාජගුරු මහාස්ථවිරයන් විසින් දැන්වූවිට ඒජනතතැන භාණ්ඩාගාරිකතුමා ලවා බුරුම විසුංගාම ආඥාපත්‍රය කියවා බලා මේ බුරුම රජුන්ගේ ආඥාපත්‍රය අප විසින් වෙනස් නොකරන ලදී. අපේ විසුංගාම ආඥාපත්‍රයත් මේ පිළිවෙළමය. මා ඒජනතකෙනෙක් නිසා මගේ දීමත් මහාරාජිනියගේම දීමකි. මහාරාජිනියට ආයාචනා පත්‍රයකින් දැනුම්දී යවන්ට වුවමනාවක් නැත්තේයයි කීයේය. කාරුණු මෙසේ හෙයින් ඒජනතාදී මූලාදෑනීන්ට ගම් විසුං කරන්ට සහ එක්කරන්ටත් බලය ඇති බව හා ඔවුන්ගේ දීම ආගමානුකූල බවද නිරාශඞ්කිවම දතයුතු.

### දෘෂ්ටි ප්‍රසාදයක්.

යට දැක්වූ ආකාර පරීක්ෂණයන්ගෙන් බුරුම මහාස්ථවිරයන් වහන්සේලා විනයධර්මයෙහි කෙතරම් පරීක්ෂා බුද්ධියක් ඇති කුකුස් බහුලවූ විනය ගරුකයෝදැයි සිතාගත හැකි වේ. අභිනවයෙන් ඇතිවෙන කිසිවක් විනයෙහි බහා විනිශ්චය නොකොට පිළිනොගන්නා උන්වහන්සේලාට **සාථලිකයෝ** යයි ලියන කියන උපසෙනස්ථවිරයන් වහන්සේගේ විනය ගරුත්වයට හා විනයෙහි පිහිටි බවටත් වැදගත් උදාහරණ දෙක තුනක් මතු දක්වන්නෙමු.

“බුද්ධාගම නොදන්නා නොඅදහන මිසදිටු නිලධාරීන් ගෙන්” ලබාගැනීම විසුංගාම අකැපවීමට අනික් හෙතුවක යනු උපසෙනස්ථවිර මතය වේ. ගම් බෙදීම එක්කිරීමාදිය රාජකාරිය බවත් ඊට ආගමක් නුවමනා බවත් විසුංගම් දීම විනයකර්මයක් වැනි ආගමික වැඩක් නොවන බවත් තමන්ට නොතේරෙනවා නම් ඇසුවොත් පාඨශාලීය ගම්දරුවෝත් කියාදෙනවා ඇත. විසුංගාම වෙන්කොට දීම තබා සීමා බන්ධන නිමිත්ත කිත්තනයෙහිදී “පුරත්ථිමායදිසාය කිං නිමිත්තං සී.” ඇසූ ප්‍රශ්නයට “උදකං භන්තෙ” යනාදීන් දෙනුලබන පිළිතුර පවා මිසදිටුවෙකු දීමෙන්ද වරදෙක් නොවේ. මෙබඳු සුළු කරුණක් ගැන ලොව මුළා කරන්ට තැත් කරතිබෙන රඟ බැලිය යුතුයි. අනුන් ලබාගත් නිසා විසුංග්‍රාමය වරද වූනත් ඉඩ කඩම් ස්ථාන පන්සල් ආදියත් තමන්ට දුන්නා නම් මිසදිටු

වන්ගෙන් ලැබුණායයි අත්නොහරින බව අපි සහතිකකොට කියමු. උපසෙනස්ථවිරයන්ගේ සබ්‍රහ්මචාරීන් විසින් දායකයන් මෙහෙයා ආණ්ඩුවෙන් ලබා පිළිගෙන භුක්තිවිඳින ඉඩකඩම් ආදිය වුවමනා නම් විස්තරයෙන් අපට පෙන්වාදිය හැකි වේ. මිසදිටු ආණ්ඩුකාරයන් නිලධාරීන් ලවා අන්‍යයන්ගේ ගම් ඉම් වෙන්කරවාගැනීම වරදයයි සලකනවිට මිසදිටු ආණ්ඩුවේ ඉඩම්වල කිසිවෙකු නොවිචාරම සීමාබන්ධනය හා වේවැල් තම්බොටුවැල් ආදිය කපා කප්පවා ගැනීමේදීත් 'වරදද ?— නැද්ද'යි කිරින්දේ අරණ්‍යයෙහි බද්ධසීමාව සම්මතකිරීමේදී හා එහි වනවාස කාලයේත් උපසෙනස්ථවිරයන්ට සැකයක් නූප දීම ආශ්චර්යයක් නොවේද ? —

ඉංග්‍රීසි ආණ්ඩුවේ ඉඩම් ගම් මායිම් වෙන්කිරීම දෘෂ්ටිභේදය කට අයිතිනැති රාජසම්මතයක් බවත් කලින් කල යම් යම් රජදරුවන් විසින් කරනු ලබන වෙනස්කම් තේරුම්ගෙන ඒ ගම් මායිම් තුළ විනයකර්ම කටයුතු බවත් මේ පිළිවෙළ බුරුම රට තෙවලාධර රාජගුරු මහාතෙරවරුන් හොඳින් විමසා පිළි ගෙන තිබෙන අයුරුත් අපි යට දැක්වූයෙමු. ලක්දිවද සියලු නිකායවලම අවිවාදයෙන් පිළිගෙන තිබෙන මේ ලොකසම්ම තය හා රාජසම්මතය ලංඝනයකොට තම දරුණු හිතුවක්කාර කමින් ඉංග්‍රීසි කිරීටයද පිළිකෙව් කරමින් කපිල කොකාලික ආදී තෙරවරුන් මෙන් සසුන් පෙරළා සස්නට මහත් අනර්ථ ඉපදවීමට වර්තමාන ශතවර්ෂයෙහි උපන් එකම වීරපුරුෂයා නම් උපසෙන තෙරණුවෝ නොවේද? – මහනුවර උඩවත්තේ කැලේ සද්ධර්මවභාෂ පිරිවෙනේ සීමාවක් බඳින්ට ගොස් නගර සීමාව ශුද්ධ නොකොට නගරසීමාව තුළ සීමාබන්ධනය කළේ තමන්ගේ අහඞ්කාර දරුණු හිතුවක්කාරකම නිසා මිස අන් කුමක් පිහිට කොටගෙනද?– නගර භූමිය තුළ ලොප්වී ගිය කිසිවෙකු ව්‍යවහාර නොකරන පැරණි ගම් මායිම තමන් පිළි ගත්තේ කවර ආගමක් බලාගෙනද?– ඉංග්‍රීසි (මිසදිටු) ආණ්ඩුවේ ගම් සීමා නිසා මුන්නාන්සේ මේවා නොසලකනවායයි කියන නමුත් මතු දක්වන කරුණුවලින් මුන්නාන්සේ කිසිම සීමාවක් නොසලකන සියළු සීමාම උල්ලංඝනය කළ කෙනෙක් බව කරුණු සහිතව ඔප්පු වේ.

## තමන්ගේ ඇගේ මහ දූවයක්.

සීමා බන්ධනයක් සඳහා හාපිටිගම් කෝරළේ ගස්පේ විහාර ස්ථානයට ගිය මේ උපසෙනස්ථවිරයන් වහන්සේ තමන්ගේ සහධාර්මික භික්ෂුවකුත් සමඟම එගම් ඉම තුළ පිහිටි බද්ධසීමා

වක් එකවිටම අවලංගුකරනු කැමතිව ගමින් පිටව යන ලෙස
එකී භික්ෂූනමට ආඥාවක් එව්වේය. සීමාව තුළ සිටීමට හෝ
සංඝයා අත්පසට එන්ට හැකිව තිබියදී ගමින් පිටවෙන්ට නුව
මනායයි භික්ෂූන්වහන්සේ **පනිවිඩකාරයා** අත කියායැව්විට
මේ උපසෙනස්ථවිරයෝ තදින් කෝපව "එහෙනම් නොකරන
හැටි බලන්ට"යයි කියා සගපිරිස **සමග** කඩිමුඩියේ සීමාබන්ධ
නය කොට "උපසෙනඋන්නාන්සේ සීමාව බැන්ද බව.........ට
කියාපන්" කියා **පනිවිඩයක්** යටකී භික්ෂූනමට එව්වේය. අහෝ!
බලනු මැනවි. මේත් විනයධරයෙකුගේ ක්‍රියාවක්ද? ගාමශුද්ධිය
නොකොටම මෙසේ සීමාබන්ධනය කළ මූන්වහන්සේ සියලු
සීමාවන් ලඞ්ඝනයකර නැතැයි සිතීමට කරුණක් තිබේද?
මෙසේ හෙයින් ඉංග්‍රීසි ආණ්ඩුවේ ගම් ඉම් දෝෂයක් නිසා නොව
තමන්තුළ පිහිටි සීමා නොසැලකීමම ඊට කාරණය බව
පෙනේ. ග්‍රාමසීමාවලදී උපසෙනස්ථවිරයන් වහන්සේ ඉංග්‍රීසි
සිංහල යන උභය රාජනියොගයන් හා ඊට අයත් ගම් ඉම්
ලකුණුත් නොසලකන අයුරු යට උදාහරණ දෙකකින් දැක්වූමු.
යථොක්ත ගාමසීමා පමණක්නොව අබද්ධ (උදකුක්ඛෙප)සීමාද
උන්වහන්සේ ගණන් නොගන්නා බව පහත දක්වන පුවතින්
සැකහැර දතයුතුයි. "සමුද්දෙ පකතිවීචියො ඔසරිත්වා සණ්ඨ
හන්ති තතො පට්ඨාය කප්පියභූමි" මුහුදේ යම්තැනක ප්‍රකෘති
රළ නැගී බැස සිටීද එතැන් සිට කැප බිම වේ යන අටුවා
වචනයේ හැටියට ඇතැම් කලෙක ගොඩටම රළ වදිතත් මුහුදේ
උදකුක්ඛෙපසීමාව සමහරතැනක වෙරළේ සිට බඹ සියගණන
කින් ඈත පිහිටියේ වෙයි. සාගරයෙහි වාරකන් සුලඟින්
ඔසවනලද මහාරළවේගයෙන් හෝ සාමාන්‍ය රළවේගයෙන්
හෝ වඩදියෙන් කලින්කල යටවෙමින් මතුවෙමින් පවත්නා
**වෙරළ හෝ** මුහුදේ පිහිටි ගල්තලා ආදිය ආගන්තුක දියෙන්
යටවී ගිය කල්හිත් කප්පිය සීමා ලක්ෂණයට නොබසියි. මේ
මෙසේ වුවත් හත් අට අවුරුද්දකට පළමු මාතර නගර සමීප
මහීගේ වඩදියෙන් හා වාරකන් රළවේගයෙන් විටින්විට වැසී
යන ගල්තලාවක් ආශ්‍රිත මුහුදු වෙරළේ වලාලට වියලෙන
දියහෙබක අටවාගත්අ වල්ලක් උඩ උපසෙනස්ථවිරයන් වහන්
සේගේ ප්‍රධානත්වයෙන් සිදුකළ මහා විනයකර්මය ගැන ලජ්ජී
භික්ෂූන්ගේ හා විනයධරයන්ගේත් දෝෂාරොපණය තවමත්
නොසන්සිඳී තිබේ.

සත්තබ්භන්තර සීමාව තුළ බද්ධසීමාවක කියමින් විනය
ධරයන්ගේ විරුද්ධ වාදයන්ද නොපිළිගෙන උපසෙනස්ථවිරයන්
වහන්සේ **ග්‍රාමශුද්ධිය නොකොට** කිරින්දේ ආරණ්‍යභූමියෙහි

බද්ධසීමාවක් සම්මතකළ බව ප්‍රකට කරුණකි. සතතබහනාතර ලක්‍ෂණයට සම්පවත් නොවූ මේ වනභූමියෙහි ග්‍රාමශුද්ධිය නොකොට සීමාවක් බැඳීමද එම සීමාව මෙන්ම තමන්ගේ විනයධරත්වයේද පුහුබව ලොවට කියාපෑමකි.

මෙසේ උපසෙනස්ථවිරයන් වහන්සේ ලෝකසීමා, රාජසීමා, ගාමසීමා, නගරසීමා, බද්ධාබද්ධසීමා යන සියලු සීමාවන්ම පැනගිය සීමාන්තික විනයධරම්මන්‍යයෙක් බව තේරුම් ගැනීමට කරුණු ඉතා බොහෝ වෙත්.

## විසුංගාම ප්‍රතිපාදන ලිපි.

**ඉතා දීර්ඝකාලයක සිට බුරුම රජුන් විසින් සඞ්ඝයාවහන්සේගේ මෙහෙයීමෙන් බිම්පෙදෙස් විසුංගාමකොට දී ගෙනැවිත් තිබෙන අන්දම හා ඒවායේ ප්‍රමාණයත් මෙහි ඇතුළත් රාජාඥ පත්‍රවලින් දතයුතු.**

**"රතනපූර" යන නමින් රාජධානියක් පිහිටුවා සතරවෙනිවර රාජ්‍යාභිෂෙකයට පැමිණියාවූද "මේංඩුං" මහරජ තුමාගේ මුත්තණුකෙනෙක්වූද "මහා විජයරංසි" චෛත්‍යය කරවූ මහරජතුමාගේ**

**විසුංගාම ආඥාපත්‍ර :—**

**(අ) 1. "පෙංතලේ" පළාතේ "ශීජ්ශෙව, පතෙං" යන දෙගම්වැසි "තෙජවනත, විරමඤ්ඤ" ස්ථවිරයන්වහන්සේලා දෙනම විසින් සඞ්ඝයාගේ පොහෝ පවුරුණු ආදිය කරගැනීමට සීමාවක් නැති බව කියා "ශීජ්ශෙව" ග්‍රාමයෙහි චෛත්‍යයට ආසන්නවූ රියන් (140) පමණ ඇති බිම්පෙදෙස එම ගම පදිංචි මිනිහෙුරු "ඩයෙව්" නමැති අයටද "පතෙං" නමැති ග්‍රාමයෙහි විහාරස්ථානයට නැගෙනහිරින් පිහිටි රියන් (350) පමණ ඇති බිම්පෙදෙස එම ගම පදිංචි "ඩනු" නමැති අයටද විසුංගාමකොට පවරනලද්දේ නම් සීමාසම්මත කරනු කැමති බව මෛත්‍රී පූරස්සරව මහවාසලට ඔප්පුකළ බැවින් "ශීජ්ශෙව" ගම්වැසි මිනිහෙුරු "ඩයෙව්" නමැති අයටත් "පතෙං" ගම්වැසි "ඩනු" නමැති අයටත් ඒ බිම් පෙදෙස් විසුංගාමකොට දෙන්ට යෙදුනා ඇත.**

**බුරුම ශකවර්ෂ 1186 බක්මස අවතෙළෙස්වක් දින නිකුත්කරනලද ආඥාපත්‍රයයි.** (ක්‍රි. ව. 1826)

---

**(ආ) 2. "ඩකාංසෙ-මිශං" අඹු සැමියන් විසින් "සගයින්" පළාතට අයත් "ඩතේ" නමැති ග්‍රාමභොජක තැන විසින් බුදිනුලබන "ඩතේශෝ" නම් ග්‍රාමය තුළ සතරැස් රියන්**

(700) පමණ ඇති බිම්පෙදෙසක් ලබාගෙන සීමාවක් සම්මත කරවා සීමාමාලකයක්ද කරනු කැමති බව මහවාසලට බැහැදක සැලකර සිටියෙන් කියනලද බිම්පෙදෙස සීමා සම්මතකරවා සීමාමාලකයක් කරනු සඳහා විසුංගාමකොට දෙන්ට යෙදුනා ඇත.

1186 පොසොන් මස පුරසතවක් දින
නිකුත්කරනලද ආඥාපත්‍රයයි.

---

මූල ත්‍රිපිටක පාළිය ශිලාලිපියට නංවා පස්වෙනි සඞ්ගායනාවක් කරවූ "මෙංඩුං" මහරජතුමාගේ
විසුංග්‍රාම ආඥාපත්‍ර :—

(අ) 3. "ඩතාඩම්හං" පිතෘ පුත්‍රයන් විසින් මහවාසලට බැහැදක සැලකරනලද පරිද්දෙන් "සගයින්" පලාතේ "වෙංජාවාවොම" ග්‍රාමයෙහි ගණාචාර්‍ය්‍යපාදයන් වහන්සේ වැඩසිටින ආරණ්‍යසෙනාසනභූමිභාගය "ඩතාඩම්හං" පිතෘ පුත්‍රයන්ට විසුංගාමකොට දෙවා වදාරන්ට යෙදුනා ඇත.
සීමා සම්මතකරවා පූජා කරනු.

1223 පොසොන් මස පුරදියවක් දින
නිකුත්කරනලද ආඥාපත්‍රයයි.

---

(ආ) 4. මහවාසලට බැහැදක ආයාචනාය කළ පරිද්දෙන් සඞ්ඝයාගේ පොහෝ පවුරුණු ආදිය පිණිස "දමාව" නම් ගම විහාරස්ථානය තුළ සතරැස් රියන් (40) පමණ ඇති බිම් පෙදෙස "ඩශෙවං" නමැති අයට බද්ධසීමාවක් සම්මත කරවා පූජාකිරීම පිණිස විසුංගාමකොට දෙන්ට යෙදුනා ඇත. සීමා සම්මතකරවා පූජා කරනු.

1228 උඳුවප් මස පුරතුදුස්වක් දින
නිකුත්කරනලද ආඥාපත්‍රයයි.

---

මණ්ඩලේ "රතනපූණ්ණ" නුවර දෙවෙනිවර රාජාභිෂෙකයට පැමිණි බුරුම රාජවංශයෙහි අන්තිම "තිබෝ" මහරජතුමාගේ
විසුංගාම ආඥාපත්‍ර :—

(අ) 5. සුධර්මා සඞ්ඝසභාවට ඇතුලත් ගරුකටයුතු මහා ස්ථවිරයන් වහන්සේගෙන් මහවාසලට පණිවුඩවූලෙස සීමාවක් සම්මතකරනු පිණිස නුවරට දකුණුදිගින් පිහිටි පවුරින් වටකරනලද "හුංජෝ" ආරාමභූමිය අයලෙබක "නේමෝය්ශි ඩූවොවෙං" නමැති අයට විසුංගාමකොට දෙවා වදාරන්ට යෙදුනා ඇත.

1240 ඉල් මස අවසතවක් දින
නිකුත්කරනලද ආඥාපත්‍රයයි.

---

(ආ) 6. සුධර්මා සඞ්ඝසභාවට ඇතුළත් ගරුකටයුතු මහා ස්ථවිරයන්වහන්සේගෙන් මහවාසලට පණිවුඩවූ ලෙස සඞ්ඝයාගේ පොහෝ පවුරුණු ආදිය සඳහා ඛණ්ඩසීමාවක් සම්මත කිරීම පිණිස "තෞංබුවෙන්ජි" පළාතේ "බබවුන්ගුන්" ගම විහාරස්ථානය තුළ සතරැස් රියන් (40) පමණ ඇති බිම් පෙදෙස "ඩපෝල්ලු" නමැති අයට විසුංගාම්කොට දෙවාවදාරන්ට යෙදුනා ඇත.

බුරුම ශකවර්ෂ 1241 වෙසක් මස පුරදියවක් දින
නිකුත්කරනලද ආඥාපත්‍රයයි.

---

දැනට බිම් පෙදෙස් විසුංකර දෙන ඉංග්‍රීසි ආණ්ඩුවේ
ආ ඥා ප ත්‍ර :—

(7) දිස්ත්‍රික්කය ... ... ... ... ... ... ... පළාත ... ... ... ... ... ... ... ... ආරාමය තුළ මතු දැක්වෙන ඉම් ලකුණින් වෙන්කරනලද බිම් පෙදෙස අසවල් තැනැත්තාගේ නමින් විසුංග්‍රාම්කොට දෙන්ට යෙදුනා ඇත.

---

## විභජ්ජවාදීය මහාස්ථවිර විනිශ්චයෝ.

කුශාග්‍රීය බුද්ධියෙන් ත්‍රිපිටක ධර්ම සාගර පාරප්‍රාප්තවූ අසම්භින්න ආචාර්ය්‍ය පරම්පරායාත මහාග්‍රන්ථකාරකවූ වර්ත්තමාන බුරුම ශාසනාම්බරයෙහි හිර සඳසේ ප්‍රසිද්ධ මහා ගණාචාර්ය්‍ය පණ්ඩිත රත්නයක්ව සිට නොබෝදා දිවංගතවූ මන්ලී ශෙයාඩෝ ලේඩිශෙයාඩෝ යි ව්‍යවහාරප්‍රාප්ත මහාස්ථවිර ස්වාමිවරයන් වහන්සේලා වෙත දෙමටගොඩ ප්‍රදෙශයෙහි ආණ්ඩුවෙන් බෙදා වෙන්කළ විසුංග්‍රාම්යාගේ තතු පවසා අසා යවනලද ලිපියට එවූ විනිශ්චය දෙක පහත දක්වනු ලැබෙත්.

### අග්ගමහාපණ්ඩිත භදන්තජවන බුරුම මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගේ විනිශ්චය. (1)

"බුද්ධං ධම්මං සංඝං නම්‍ය සක්කච්චං සිරසා ගරුං
විසුංගාමං ලිඛිස්සාමි සුබොධාය යථාක්කමං."

එත්ථිදං සඞ්ඛෙප විසුංගාම ලක්ඛණං, එකස්මිං පකති ගාමක්ඛෙත්තෙ එකොපදෙසො පරිච්ඡින්දිත්වා රඤ්ඤා කස්සචි දින්නො සො එකන්තෙන විසුංගාමොව දට්ඨබ්බො. තෙන අට්ඨකථායං "යම්පි එකස්මිං යෙව ගාමක්ඛෙත්තෙ එකං පදෙසං

අයම්පි විසුංගාමො හොතූති පරිච්ඡින්දිත්වා රජ්ජා කස්සචි දෙති සො විසුංගාමසීමා හොති යෙවාති" වුත්තං. අයං පනෙත්ථ පිණ්ඩත්ථො: "අයං විසුංගාමො හොතූ"ති ඉමිනා එකං යෙව ගාමක්ඛෙත්තං ද්වෙ ගාමෙ කරොති, තෙන වුත්තං විනයාලඞ්කාරටීකායං, අයම්පි විසුංගාමො හොතූති ඉමිනා න කෙවලං පුරිමගාමො යෙව හොති අථ ඛො ඉදානි පරිච්ඡින්න පදෙසොපි විසුං යෙව ගාමො හොතූති. එකං යෙව ගාමක්ඛෙත්තං ද්වෙ ගාමෙ කරොතීති දස්සෙතීතිච, රජ්ජා කස්සචි දෙතීති ඉමිනා ගාමභොජකස්ස දින්නභාවං පකාසෙතීතිච. විමතිවිනොදනීටීකායම්පි තත්ථ රාජිච්ඡාවසෙන පරිවත්තනිත්වා සමුප්පන්නා අභිනවාච ඉතරා අපරිවත්තා පකති ගාමසීමාච යථා බද්ධසීමායං සබ්බං සඞ්ඝකම්මං කාතුං වට්ටති එවමෙතාපි සබ්බා කම්මාරහතා සදිසෙන බද්ධසීමා සදිසා සමාන සංවාසා එකූපොසථාති අධිප්පායොති වුත්තං. අයම්පි විමතිවිනොදනීටීකායං පිණ්ඩත්ථො විනයාලඞ්කාරටීකායං වුත්තො. කථං? රාජිච්ඡාවසෙන පරිවත්තනිත්වාති ඉමිනා අගාමකභූතං ඛෙත්තං රාජිච්ඡාවසෙන පරිවත්තනිත්වා ගාමො හොතීති දස්සෙති අභිනවාචාති ඉමිනා පුරාණගාමසීමාච අභිනවගාමසීමාචාති පුරිම ගාමෙන අමිස්සං විසුංගාමලක්ඛණං දස්සෙතීති. පරිච්ඡින්දිත්වාති ඉමිනා පදෙසෙන වා කාරෙන වා පරිච්ඡින්නෙසු අඤ්ඤතරෙන පරිච්ඡෙදෙන පරිච්ඡින්නං නාම, තෙසු අට්ඨකථායං එකං පදෙසන්ති පදෙසෙන පරිච්ඡින්නං දස්සෙති, විනිච්ඡයටීකාදීසු පන කාරෙන පරිච්ඡින්නං දස්සෙන්ති, තෙන වුත්තං ගාමපරිච්ඡෙදෙති සබ්බදිසාසු සම්මා පරිච්ඡින්දිත්වා ඉමස්ස පදෙසස්ස එත්තකො කාරොති එවං කාරෙන නියමිතො ගාමපදෙසොති. සීමාලඞ්කාර ගණ්ඨිපදෙපි ගාමානං කරග්ගාහ පරිච්ඡින්නො සමන්තතො ගාමසීමාති වුත්තං. රජ්ජාති එත්ථ රජ්ජා නාම න පථවිස්සරරාජා යෙව අථ ඛො පථවිස්සරරඤ්ඤො සන්තිකා ලද්ධාණාපි මහාමච්චාදයො රාජා නාමාති දට්ඨබ්බා. තෙන වුත්තං විමතිවිනොදනීටීකායං සහ ආදී සද්දෙන රාජාදීහි පරිච්ඡින්නා භූමිභාගො හි සබ්බො ඨපෙත්වා නදී ලොණී ජාතස්සරෙ ගාමසීමාති වෙදිතබ්බාති. තස්මා තාසු තාසු ටීකාසු පථවිස්සරො රාජාතිච පථවිස්සර රාජූහීතිච වුත්ත වචනං පධානනයෙන වුත්තන්ති දට්ඨබ්බං. කස්සචීති සම්පදානපදෙපි අට්ඨකථාටීකාදීසු විසෙසං අවුත්තත්තා සජීව නිජ්ජීව පුග්ගල ගණ සංඝ චෙතිය විහාරාදීනං පදෙසොපි විසුංගාමොති දට්ඨබ්බො. තස්මා චෙතියස්ස දින්නභූමියම්පි විසුංගාමභාවෙන

පුබ්බ රාජ මණ්ඩි චූළ චෙතියඞ්ගණ මහාරාජඞ්ගාලෙ ගනාථ ඤාරඤ්ඤ ගනාථනොවිද විනයාලඞ්කාරපිඤ්ඤාචරියාදයො මරම්ම රාමඤ්ඤවාසාචරියාපි සීමාසම්මුතිං කාරිංසූති වදන්ති. එවං වුත්ත ලක්ඛණෙන වෙ ගාමභාවං සම්පත්තාසම්පත්තත්තං ඤත්වා සීමාසම්මුති කාතබ්බා.

ඉදානි සීහලදීපෙ කොළම්බනගරෙ දෙමටගොඩ විසුද්ධාරාමෙ සාමිනා මන්තලෙනගරෙ මහාවිසුද්ධාරාම සාමි රාජගුරු ථෙරස්ස අන්තෙවාසික ගණවාචකභූතෙන භදන්ත සිරිධම්ම සාරෙන පෙසිත පණ්ණෙ අයං ලද්ධවිහාරභූමි විසුංගාමො යෙවාති දට්ඨබ්බාති.

පෙසිතමිදං සන්දෙසපණ්ණං සාට්ඨකථා තිපිටක පරියත්ති විසාරදෙන භදන්ත ජවන මහාථෙරෙන රාජගාමන්ත මහාවිහාර සාමිනා සම්බුද්ධපරිනිබ්බානා විසහස්ස චතුස්සත තිසට්ඨි මෙ සංවච්ඡරෙ මුම්මරට්ඨෙ මන්ලීනගරතොති දට්ඨබ්බං.

---

### ඤාණාලඞ්කාර මහාස්ථවිරපාදයන්වහන්සේගේ විනිශ්චය.

එක එක ග්‍රාමපරිච්ඡෙදයක් ග්‍රාමසීමාවක් නම් වේ. එක එක ග්‍රාම්භොජකයකුට අයත් ග්‍රාමක්ෂෙත්‍රයක යනු භාවයි. ආදි කල්පයෙහි පටන් ඉම් ලකුණින් පිරිසිඳගෙන එන එවැනි ග්‍රාමපරිච්ඡෙදයෙක් ප්‍රකෘති ග්‍රාමසීමා නම් වේ. මෙහි නගරයද ග්‍රාම ග්‍රහණයෙන්ම ගෘහීතයි. එසේවූ ග්‍රාමයක් තුළ සංඝයා විනයකර්ම කරන කල්හි ඒ සීමාවට ඇතුළත්වූ භික්ෂූන්ම මිස සීමාන්තරගත භික්ෂූන් අත්පසට ගැනීමක් නැත්තේය.

### මේ ප්‍රකෘතිග්‍රාමසීමා ලක්ෂණයි.

විසුංගාමයයි කියන්නේ රාජාණ්ඩුවක් විසින් එබඳු ප්‍රකෘති ග්‍රාමක්ෂෙත්‍රයක් ග්‍රාමක්ෂෙත්‍ර දෙකක් හෝ තුනක්කොට බෙදා ඒවාට භොජකයන් පත්කිරීමෙන් ඇතිවන අභිනව ග්‍රාම ක්ෂෙත්‍රයන්ටයි. අප වසනා "මූංයවා" නගරය මුලදී එක භොජකයකුට අයත්වූ එකම නගරයක්වැ පැවැත්තේය. පසුව ආණ්ඩුව විසින් දෙකට බෙදා නැගෙනහිර කොටසට එක්කෙනෙක් බස්නාහිර කොටසට එක්කෙනෙක්දැයි භොජකයන් දෙන්නකු පත්කිරීමෙන් දැන් නැගෙනහිර කොටස "මූංයවා" යන මුල් නමින් හා බස්නාහිර කොටස "මූංයෙව" යන අභිනව නමකින් ව්‍යවහාරයට පැමිණ තිබේ. නැගෙනහිර කොටස ප්‍රකෘතිග්‍රාමසීමායි. බස්නාහිර කොටස විසුංගාමසීමායි. "මූංයෙව" යන ගමද පෙර එක ග්‍රාම්භොජකයකුට අයත් එකම ගමක්වැ පැවැත්තේය. පසුව ආණ්ඩුව

විසින් දෙකට බෙදා දකුණු කොටසට එක්කෙනෙක්ද උතුරු කොටසට එක්කෙනෙක්දැයි ග්‍රාමභෝජකයන් දෙන්නකු පත්කිරීමෙන් දකුණු කොටස "මුංසෙව" යන පුරාණ නාමයෙන් හා උතුරු කොටස "චෙම්මුං" යන අභිනව නාමයෙන් ව්‍යවහාරයට පැමිණ තිබේ. දකුණු කොටස ප්‍රකෘති ග්‍රාමසීමායි. උතුරු කොටස විසුංගාමසීමායි. මේ භික්ෂූන්ගේ සම්බන්ධයක් නැතිව ආණ්ඩුව සියකැමැත්තෙන් බෙදා වෙන්කරනලදුව විසුංගාම ඇතිවන ආකාරයයි.

යම්කිසි බිම්පෙදෙසක් සංඝාරාමයක් පිහිටුවනු පිණිස ආණ්ඩුවට දන්වා ආණ්ඩුව විසින් බිම් ලේඛණයෙහි ලියා පදිඤ්චිකොට බෙදා වෙන්කරන ලද්දේ නම් ඒ ආරාම භූමියද එක් විසුංගාමසීමාවකි. මණ්ඩලේ නුවර පිහිටි සංඝාරාම භූමීන් මෙනි. තවද ඒ ඒ ආරාමයක් තුළ හෝ පිට තැනක හෝ විසුංගාම නාමයෙන් ඉල්ලා ආණ්ඩුවෙන් වෙන්කර දෙනලද භූමිභාගයක් වී නම් හෙද එක් විසුංගාමසීමාවකි. මෙහි ආණ්ඩුවේ දීම ආණ්ඩුවට අයත් බද්දෙන් නිදහස්කොට ආරාම සන්තකකොට ශාසන සන්තකකොට දීමය,—ආණ්ඩුවට අයත් බද්දෙන් නිදහස් නොකොට ආණ්ඩුවේ අයිතිය පිටම ග්‍රාමභෝජකයාට අයත් ප්‍රකෘති ග්‍රාමසීමාත්වයෙන් පමණක් මුදවා සීමාන්තරත්වයට පැමිණවීම් මාත්‍රයෙන් පිරිසිඳ දීමය කියා දෙවදෑරුම්. ඒ දෙවිදියෙන් පළමු විදියේ හැටියට ඒ බිම්පෙදෙසෙන් ආණ්ඩුවට අයවෙන බද්දක් නැත්තේය. දෙවෙනි විදියේ හැටියට ඒ බිම්පෙදෙසින් අයවියයුතු බද්ද වෙනුවෙන් පියවිගම් බුදින්නාට අයිතියක් නැත, නුමුත් ඉහළ නිලධාරීන්ට උවමනා නම් එහි බදු අයකර ගන්ටද බලය තිබේ. මේ විසුංගාම විෂයෙහි දතයුතු වෙනසයි. මේ අදහස මහාවිශුද්ධාරාමික මහානායක ස්වාමීන් වහන්වහන්සේගේ විනිශ්චයෙහිද අවූත් තිබේ.

බුරුම ශකවර්ෂ 1281 පොසොන් අව 12 වක් දින.

මේ වනාහි පරමත්ථදීපනී නිරුත්තිදීපනී ආදී ප්‍රශස්ත පාළිභාෂාමය ග්‍රන්ථයන් හා ස්වභාෂාමය ආගමික ග්‍රන්ථ 70 ගණනකටද අධිකව නිපදවා බුදුසසුන් බබළුවමින් සිට මීට අවුරුදු 2 ට පමණ ඉහත ස්වර්ගස්ථවීවදාළ අග්ගමහා පණ්ඩිත (ලේඩිසෙයාඩෝ යි ප්‍රසිද්ධ) ඤාණාලඞ්කාර මහාස්ථවිර පාදයන් වහන්සේ විසින් බුරුම භාෂාවෙන් ලියා එවනලද විසුංගාම විනිච්ඡයෙහි සිංහල අනුවාදනායයි.

## බලවත් ප්‍රඝට්ටනයක්.

මෙසේ උපසෙනස්ථවිරයන් වහන්සේ විසින් අහසෙහි ප්‍රාසාදයක් දක්වන්ට තැත්කරන්නාසේද, සිතාම්බර (නම් පට සළුවක්) වියමුයයි රජෙකු රැවටූ අය සේද තම මතයට වාසි ඇතිව අතින් මිටින් නොයෙක් බොරු යොදා අභූතාලඞ්කාර යෙන් සරසා ප්‍රකාශකළ සංඝරාජාරාමස්ථ විසුංගාමසීමාව සිය මතයට විරුද්ධව ඇතිසැටියේ ප්‍රකාශ විය. ඒ අනුවම තමන්ට විරුද්ධ ලිපියක් සහතික කිරීමෙන් උපසෙනස්ථවිරයන් වහන්සේ කළ වර්ණනාවෙන් තම මතයට විපක්ෂවූ අන්‍යවූ විසුංගාමසීමාවෝද වර්ණිත වූහ. දැන් අප විසින් කටයුතුව තිබුණු මේ විසුංගාමසීමා වර්ණනාව උපසෙනස්ථවිරයන් වහන්සේ විසින් ( අ. සී. වි. 36–37–38. පිටුවල) ප්‍රකාශකර තිබෙන බැවින් එයම මෙහි අනුරුප වශයෙන් දක්වමු. “තවද අප මාහිමියන් වහන්සේලා උපසම්පදාව ලත් රතනාපූර්ණ නගරයෙහිවූ ඒ විසුංග්‍රාම් සංඛ්‍යාත සඞ්ඝරාජාරාමය **ප්‍රධානකොට යට දක්වූද නොදක්වූද සියළු විසුංගාමසීමාවෝ** වනාහි ආගමන වශයෙන්ද–ආගම වශයෙන්ද–කාරක වශයෙන්ද–කාරාපිතා කාරවශයෙන්ද–අනුසාසකවශයෙන්ද–පටිග්ගාහකවශයෙන්ද යන ෂඩාකාරයෙන්ම නිරාසඞ්ක පිරිසිදු **සීමාවෝ වෙති.**

1. එහි ආගමන වශයෙන් කෙසේ පිරිසිදුවීදයත්? රාමඤ්ඤ බුරුම දෙරටැ බුදුසසුන් පිහිටිතැන් පටන් සොණුත්තර මහින්ද ථෙර පරම්පරාවෙන් හා දැහැමි රජ පරපුරෙන්ද සසුන් කටයුතු පැවැතැ ඊම ආගමන නම්, හේ මෙසේ දතයුතු—1 සම්මුඛ මහාශ්‍රාවක උපාලි මහරහතන් වහන්සේගේ ශිෂ්‍යවූ 2 දාසක ස්ථවිරයන් වහන්සේය, එසේම–3 සොණක, 4 සිග්ගව,–චණ්ඩ වජ්ජී, 5 මොග්ගලිපුත්තතිස්ස මාහිමියාණන් වහන්සේගේ ශිෂ්‍යවූ රාමඤ්ඤදෙශයෙහි සසුන් පිහිටුවාලූ–6 සොණ–උත්තර යන රහතන්වහන්සේලා හා උන්වහන්සේලාගේ ශිෂ්‍යානු ශිෂ්‍යවූ–7 සොභිත, 8 සොමදත්ත, 9 සුමනතිස්ස, 10 සොභාග, 11 සොමදත්ත, 12 අනොමදස්සී, 13 අධිසීල, 14 ඛනදස්සී 15 සීලබුද්ධි–මහාකාල, 16 ධම්මදස්සී, 17 ගුණසාර, 18 අග්ග පණ්ඩිත, 19 අග්ගවංස, 20 උත්තරාජීව, 21 ජප්පට, 22 සද්ධම්ම කිත්ති, 23 තිසාසනධජ, 24 ධම්මරාජගුරු, 25 මුනින්දඝොෂ (තිපෙටකාලඞ්කාර), 26 මහාතිස්ස, 27 චන්දපඤ්ඤ, 28 ගුණසිරි, 29 කල්‍යාණධජ, 30 ධම්මධර, 31 ඉන්දාභාස, 32 කල්‍යාණ චක්ක, 33 විමලාචාර, 34 ගුණසාර, 35 චන්දසාර, 36 වරඑසි,

37 ගුණසිරි, 38 ඤාණාභිවංස සඞ්ඝරාජ, 39 සූරියවංසාලඞ්කාර, 40 ඤෙය්‍යධම්මාභිමුනිවර ඤාණකිත්ති සිරිපවර ධම්මසෙනාපති මහාධම්මරාජාධි රාජගුරු සඞ්ඝරාජ මාහිමියන් වහන්සේ දක්වා අවිච්ඡින්න ආචරිය ථෙර පරම්පරාවෙන් සීමාබන්ධන උපසම්පදාදි විනය කර්ම පැවැත් ආහෙයින් ආගමනශුද්ධි වශයෙන්ද එම **විසුංග්‍රාමසීමාවෝ** නිරාසඞ්ක වන්නෝමය.

වෙසෙසින්ම විනය විරෝධ විසුංග්‍රාමසීමාවන් ප්‍රතික්ෂෙප කළාවූ මුනින්දඝොෂ නම් තිපෙටකාලඞ්කාර මහාස්ථවිරයන් වහන්සේ එම ආචාර්‍ය්‍ය පරම්පරාවෙහි උතුමකුවීම ආගමන ශුද්ධියට අත්‍යන්ත හෙතු විය.

2. ධර්මවිනයධර සහස්‍රාධික සුධර්මසභික ස්ථවිර භික්ෂූන් පිරිවරකොට ඇති ත්‍රිපිටකධර ඤෙය්‍යධම්ම සඞ්ඝරාජ මාහිමියාණන් වහන්සේ විනය විරොධ විපත්ති සීමාවන්හි කිසිසේත් සඞ්ඝකර්ම නොකරන හෙයින් **මේ විසුංග්‍රාමසීමාවෝ** විනය අටුවාවෙහි නියම ආකාරයෙන්ම **ශොධන ලද්දන් බැවින්** ආගම ශුද්ධි වශයෙන්ද **නිරාසඞ්ක වන්නෝමය.**

3. ඒ විසුංග්‍රාම **සීමාවන්** (නගරය ඉදිකරන කල්හි) ඒ ප්‍රදෙශ **විහාරභූමිවලින්** වෙන්කොටැ වෙන්වූ **ගම් වශයෙන්** නියමකළාවූ ම්‍රම්මදෙශාධීශ්වරවූ මහාධම්ම රාජාධිරාජ මහරජ තුමා ශ්‍රද්ධාප්‍රඥාදි ගුණයෙන් යුක්තවූ ධර්මවිනයෙහි දක්ෂවූ පස්වැනි ධර්මසඞ්ගායනාව කැරවූ ශාසනමාමක උතුමකු බැවින් කාරක වශයෙන්ද පිරිසිදු නිරාසඞ්ක සීමාවෝ වන්නාහුමය.

4. **භික්ෂූන්ගේ හා දායකයන්ගේත් ආශාවනාවන් ඇතිවැ** මහරජතුමාගේද කැමැත්තෙන් **අඩි ගණන් රියන් ගණන් පමණවූද** භූමිප්‍රදෙශයන් භූමිශාස්ත්‍රඥයන් ලවා වෙන්කරවා **රාජපණ්ණයෙහි ආරොපණය කොට** විසුංග්‍රාමයයි නම් තබා **සීමාසම්මතකාරක හෙයින් හා** සඞ්ඝරාජාරාමය කරවා සඞ්ඝගත කළ හෙයින්ද කැරවූ ආකාර වශයෙන්ද පිරිසිදු **නිරාසඞ්ක සීමාවෝම වන්නාහුය.**

5. යටකී පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ගුණාඞ්ගසඞ්ගතවූ ඒ සඟ රජ මාහිමියාණන් වහන්සේ ප්‍රධානකොට ඇති සියගණන් රාජගුරු මහතෙරුන් වහන්සේලා රජතුමාගේ අනුශාසකයෝ වූහ. පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ධරවූ එබඳු ලජ්ජී භික්ෂූහු දැනැ දැනැ ලොකයා අස්ථානයෙහි නුසුදුසු ක්‍රියාවෙහි නොයොදවන්නාහුය. එහෙයින් අනුශාසකයන්ගේ වශයෙන්ද **මේ විසු සීමාවෝ** නිරාසඞ්ක වන්නාහුමය.

6. ඒ ආරාම භූමි ප්‍රදේශයන් විසුංග්‍රාමසීමා වශයෙන් පිළිගෙන, එහි චතුර්විධ සංඝකර්මයන් කළාවූ සඞ්ඝරාජ මාහිමියාණන් ඇතුළු රාජගුරු මහතෙරුන්වහන්සේලා යට කීසේ පය්‍ර්‍යාප්ති ප්‍රතිපත්තිධර ලජ්ජීන් හෙයින් පටිග්‍රාහක වශයෙන්ද ඒ විසුංග්‍රාමසීමාවෝ නිරාසඞ්ක වන්නාහුමය.

මෙසේ හෙයින් බුරුම දේශයෙහි රතනාපූර්ණ රාජධානිය සමීපයෙහි මහාධම්ම රාජාධිරාජ මහරජතුමා විසින් විසුංග්‍රාම වශයෙන් වෙන්කොට දෙනලද **කුඩා** ප්‍රදේශයෙක්හි ගොඩනගනලද සංඝරාජාරාම සීමාවටද – **තදන්‍ය විනයානුකූල විසුංසීමාවන්ටද** අල්පශ්‍රැත ආධුනික ඊර්ෂ්‍යාකාරයන් විසින් තම තමන්ගේ **අඥාන ඊර්ෂ්‍යාදෘෂ්ටි පටලය නිසා** විනය විරොධ හිස් බිම්කැබලියයි සිතන ලියන කියන නමුත් ඒ අගතිගාමී ශ්‍රමණයන්ගේ ශාසන විනාශකාරී අවිනය ප්‍රලාප විලාපයන් භාරගැනීම මහත් අනර්ථයට හෙතුවන බැවින් අත්වැඩ පර වැඩ සසුන් වැඩකැමති සිහිනුවණැති කිසිවෙක් එබඳු අයගේ කියමන් භාරනොගනිත්වා.”

මෙසේ විසුංගාමසීමා විපක්ෂභාගීවූ උපසෙනස්ථවිරයන් වහන්සේ තමන් නොදැනීමෙන්ම අභිමානයෙන් මූලාව කරගන්නාලද අවිචාර ක්‍රියාව ගැන දැන් මනස්තාපයෙන් තැවෙන්ට සුදුසු වේ. උපසෙනස්ථවිරයන් වහන්සේ බුද්ධ ශාසනයට වරින් වර බලවත් අපරාධ කරන්නෙක් බව හා උන්වහන්සේට අනුබලදී අනුව **ඡන්නන්** ධර්මවාදී සත්පුරුෂයන්ගේ බලවත් අනුකම්පාවට භාජනව සිටින බවත් මෙයින්ද ප්‍රත්‍යක්ෂ වේ.

මීට

පොකුණුවිට ශ්‍රී විනයාලඞ්කාරාමවාසී
**කබැල්ලෑගොඩ අග්‍රධම්මාලඞ්කාර**
ස්ථවිරයෝය.

---

xviii පිට 34 වෙනි පෙළ “මුහුනට කෙල ගසා” යනු මුහුන කෙලගා කියාද 11 පිට 20 පෙළ ප්‍රකෘතියෙන් යනු කෘතියෙන් කියාද වෙනත් මෙවෙනි තැන් මෙසේම ශොධ්‍යයට පමුණුවාද **කියවිය යුතු.**

# විසුංගාමසීමාවිනිච්ඡය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

1. සබ්බඤ්ඤුසො පරමසච්චවදො මුනි'න්දං-
සබ්බාභිවෙසතිමිරො'ඝනිදූසභානු,
සම්මොහිතස්ස පරිදීපයතං අවිජ්ජා-
ඛන්ධං පදාළිය ජනස්සි'ධ මග්ගවිජ්ජා.

2. යො සත්ථුවණ්ණිතගුණො පන සත්ථුකප්පො
සො භද්දවාච'මනුචින්තිය බොධනීයං,
සද්ධම්මසඞ්ගහ'මකාසි පගෙව ධීරො
වන්දෙ'නු බුද්ධ වරකස්සපථෙර පාදං.

3. වජ්ජිහි ලජ්ජිගුණවජ්ජිතකෙහි ජාතං
සොධෙසි සාසනමලං දසවත්ථුජාතං,
ඛීණාසවං දුතියසඞ්ගහකාරකං තං
කාකණ්ඩපුත්තයසසත්ථවිරං නමෙ'හං.

4. යො'නෙකතිත්ථියගණෙහි'මධම්මධූම-
මුබ්ඪත්තසාසනවරං විසදීකරොන්තො,
ධම්මං තතාන භුවි මොග්ගලිපුත්තතිස්ස-
ථෙරං නමෙ තතියසඞ්ගහකාරකං තං

5. යො'පාලිථෙරපමුඛාය පරම්පරාය
යාවජ්ජසාසනවරං විමලං නයිංසු
ථෙරා විසුද්ධ පටිපත්ති රතා සුධීරා
ධාරෙමි තෙසමි'හපාද රජානිසීසෙ.

6. ගාමො සියා පචන භාසනමාතුගාම
වාසාදිනෙත්‍යවිනයං විනයා'පගා යෙ
ආහංසු දුම්මතමි'දං හි විසුංකරොන්තො
ගාමන්තනිච්ඡයමහං පරිදීපයිස්සං.

ශ්‍රී ඝන සුගත තථාගත ශාක්‍යසිංහ සමන්තභද්‍ර සර්ව ලොක ශිවඞ්කරවූ අප භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජොත්තමයාණන් වහන්සේ විසින් වදාරනලද විනය සූත්‍රාභිධර්ම සංඛ්‍යාත ත්‍රිවිධ දෙශනාවන් අතුරෙන් විනය

දෙශනාතොමෝ ආඥාහී භාග්‍යවතුන් වහන්සේ විසින් ආඥා බාහුල්‍යයෙන් වදාරනලද හෙයින් ආඥාදෙශනා නම් වේ. අපරාධයට සුදුසු සේ දඬුවම් පමුණුවා අපරාධ කළ වුන් දමනය කිරීමෙන් හික්මවීම පිණිස දෙශනා කරනලද හෙයින් ඒම යථාපරාධශාසනනමුදු වේ. (අපරාධය අනුව දඬුවම් පැමිණ විය හැකි රාජනීතින් බඳු ශික්ෂා ප්‍රඥප්ති සමූහයෙක යනු භාවයි.)

ඒ මේ විනය දෙශනායෙහි පණවනලද ශික්ෂාපද ප්‍රඥප්තීහු වනාහි අනුඤ්ඤාත පටික්ඛෙප වශයෙන් දෙවැදෑරුම් වේ. ඔවුනතුරෙන් අනුඤ්ඤාතයද සාමාන්‍ය විශෙෂ වශයෙන් දෙවදෑරුම් වේ. පටික්ඛෙපයද එසේමය.

**මෙතන්හි ඔවුන්ගේ විශෙෂයද උපොසථක්ඛන්ධක සීමා කථා පාළියෙන්ම උදුරා දක්වනු ලැබේ.**

1. විශෙෂානුඥාතය නම් (1) "එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බා පඨමං නිමිත්තා කිත්තෙතබ්බා පබ්බත නිමිත්තං, පාසාණනිමිත්තං, වනනිමිත්තං, රුක්ඛනිමිත්තං, මග්ගනිමිත්තං, වම්මිකනිමිත්තං, නදීනිමිත්තං, උදකනිමිත්තං, නිමිත්තෙ කිත්තෙත්වා" යනුයි.

මෙසේ විශෙෂයෙන් නිමිති අටක් අනුදැන වදාළ හෙයින් එයින් අනිකක් සීමාසම්මත කාලයෙහි නිමිත්ත වශයෙන් නොගත යුතු බව පැහැදිලි වේ.

2. සාමාන්‍යානුඥාතය නම් (2) 'තෙනහි භික්ඛවෙ සඞ්ඝො යාව මහන්තං උපොසථපමුඛං ආකඞ්ඛති තාව මහන්තං උපොසථපමුඛං සම්මන්නතු එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බං පඨමං නිමිත්තා කිත්තෙතබ්බා නිමිත්තෙ කිත්තෙත්වා" යනුයි.

මෙහි වනාහි "පඨමං නිමිත්තා කිත්තෙතබ්බා" යනුවෙන් නිමිත්ත සාමාන්‍යයෙන්ම අනුදැන වදාරනලද හෙයින් යට කී නිමිති අට අතුරෙන් යම් කිසි නිමිත්තකින් වේවා එයින් අන්‍යවූ නිමිත්තකින් වේවා උපොසථාගාර පමුඛසම්මුතිය කට යුතු වන්නිය. එහෙයින් අට්ඨකථායෙහි (3) "නිමිත්තා කිත්තෙතබ්බාති උපොසථපමුඛස්ස ඛුද්දකානි මහන්තානි වා පාසාණඉට්ඨකදාරුක්ඛණ්ඩදණ්ඩකාදීනි යානි කානිචි නිමිත්තානි යත්ථ කත්ථචි සඤ්ඤාණං කත්වා කිත්තෙතුං වට්ටති"යි කීහ.

මේ අටුවා වචනයෙහි හටගත් සැක ඇත්තවුන්ගේ සැක දුරුකර ගැනීම පිණිස වජිරබුද්ධි ටීකාචාර්‍ය්‍යයෝ (4) "යානි කානිචි නිමිත්තානි කිත්තෙතුං වට්ටතීති ඉදං කථං පඤ්ඤායතීති? පඨමං නිමිත්තා කිත්තෙතබ්බා නිමිත්තෙ කිත්තෙත්වාති එත්තකමෙව වුත්තත්තා, පඨමං වුත්තත්තා නවුත්තන්තිචෙ? තං පන අකාරණං නහි බුද්ධානං දෙසනාය අලසියං අත්ථී"යි වර්ණනා කළෝය. සීමාසම්මුති කාලයෙහි නිමිති අටක් විශෙෂයෙන් වදාරනලද හෙයින් මෙහිදු ගතයුත්තේ ඒ නිමිති අට පමණක් නොවේද? කියා චොදනා නොකටයුතු. කුමක් හෙයින්ද යත්? බුදුරජාණන්වහන්සේලාට ධර්මදෙශනා කිරීමෙහි මැලි බවක් නැති බැවින් දෙශනා කළ ධර්මයක්ම වුවත් ප්‍රස්තාව පැමිණිවිට නැවත නැවතද දෙශනාකරන හෙයිනි.

3. විශෙෂ ප්‍රතික්ෂෙපය නම්:—(5) "න භික්ඛවෙ අතිමහතී සීමා සම්මන්නිතබ්බා චතුයොජනිකා වා පඤ්චයොජනිකා වා ඡයොජනිකා වා යො සම්මන්නෙය්‍ය ආපත්ති දුක්කටස්ස" යනුයි.

මෙහි චතුයොජනිකාදි සීමාවන්ගේ සම්මතය ප්‍රතික්ෂෙප කළ හෙයින් තුන් යොදුනකට කෙසගක් පමණකුදු මහත් වීනම් විපත්ති සීමා වන බව දතයුතු. ඊට කුඩා නම් යටත් පිරිසෙයින් විසිඑක් දෙනෙකුට රැස්ව ඉඳගැනීමට තරම් ප්‍රමාණය දක්වා කැප වේ. ඉඳින් විසිඑක් දෙනෙකුට රැස්ව ඉඳ ගැනීමට තරම් නොවේ නම් "අතිඛුද්දකං සීමං සම්මන්නන්තී"යි පරිවාර කර්මවර්ගී පාළියෙහි විපත්ති සීමාගෙහි ලා වදාළ හෙයින් කැප නොවේ.

4. සාමාන්‍ය ප්‍රතික්ෂෙපය නම්:—(6) "න භික්ඛවෙ සීමාය සීමා සම්භින්දිතබ්බා යො සම්භින්දෙය්‍ය ආපත්ති දුක්කටස්ස" යනුයි. මෙහි බද්ධසීමාවන්ගේ අන්‍යොන්‍ය සම්භෙදය (සංමිශ්‍රන)ය නොකටයුතුයයි සාමාන්‍යයෙන් වදාළ හෙයින් අන්තිම පරිච්ඡෙදයෙන් කෙසගක් පමණවත් සම්භෙදය නොකටයුතු. ඉඳින් සම්භෙදයකොට සම්මත කරන ලද්දී නම් ඒ විපත්ති සීමාවක් වන්නීය.

(මෙහි උද්දෙශානුකූලව නිර්දෙශය නොදක්වන ලද්දේ පාළියෙහි ආ ක්‍රමයට අවබොධය පහසු කරනු පිණිසයි.)

මෙසේ කියනලද නයින් අනුඥත ප්‍රතික්ෂෙප සාමාන්‍ය විශෙෂයන්ගේ ලක්ෂණ හොඳින් උගෙන සාමාන්‍යයෙන් වදාරන ලද්ද සාමාන්‍යයෙන්ද විශෙෂයෙන් වදාරන ලද්ද විශෙෂයෙන්ද ගතයුතු. සාමාන්‍යය විශෙෂය කොටද

විශෙෂය සාමාන්‍යය කොටද නොගතයුතු. ප්‍රතිසංස්කරණ
යට හෝ අතුරු පැනවිලි එකතු කිරීමට අවකාශයෙක්
නැත්තේය යනු භාවයි.

විශෙෂයෙන් වනාහි ප්‍රඥප්ත්‍යවද්‍යශික්ෂාපදයන් ප්‍රතික්ෂෙප
පක්ෂයෙහි නොවී නම් බෙහෙවින් අනුඥතයෙහි ඇතුළත්වන
බව දතයුතු. පාල්‍යාගත අප්‍රකටවූ ස්ථානයන්ද අට්ඨකථාවන්හි
පැහැදිලිකොට වර්ණනා කළෝය. ඒ අට්ඨකථාවෝද බුද්ධකාල
යෙහිත් විද්‍යමානව ඒ ඒ තන්හි බුදුරජාණන්වහන්සේ විසින්ම
වර්ණනා කරනලද ප්‍රකීර්ණක දෙශනාවන් සමග බුද්ධමත
ඥ බුද්ධ මහාකාශ්‍යප, උපාලි ආදි මහ රහතන්වහන්සේ
ලාගේ දෙශනාද වන හෙයින් බුද්ධදෙශිත පාළිය මෙන්ම
ගරුතන්හි තබා ඇදහිය යුත්තාහුය. එහෙයින් සඞ්ග්‍රහාට්
ඨකථාචාර්‍ය්‍යවූ බුදුඝෝස් මාහිමියාණෝ (7) "බුද්ධෙන ධම්මො
විනයො ච වුත්තො, යො තස්ස පුත්තෙහි තථෙව ඤාතො"
යනාදියද ආචාර්‍ය්‍ය ධම්මපාල ස්ථවිර ස්වාමිපාදයෝ ධම්ම
සඞ්ගණි අනුටීකායෙහි "(8) පඨම සඞ්ගීතියං 'යා අට්ඨකථා
සඞ්ගීතා'ති වචනෙන සා භගවතො ධරමානකාලෙපි අට්ඨ
කථා සංවිජ්ජති තෙන පාඨො විය භගවං මූලිකාවා'ති විඤ්ඤා
යති" යනුද ආචාර්‍ය්‍ය ශාරීපුත්‍ර සංඝරාජ ස්වාමිපාදයෝ සාරත්ථ
දීපනී ටීකායෙහි (9) "නහි භගවතා අබ්‍යාකතං නාම තන්ති
පදං අත්ථි සබ්බස්සෙව අත්ථො කථිතො තස්මා සම්මා
සම්බුද්ධෙ නෙව තිණ්ණං පිටකානං අත්ථවණ්ණනාක්කමොපි
භාසිතොති දට්ඨබ්බං තත්ථ තත්ථ භගවතා පවත්තිතා පකි
ණ්ණකදෙසනා යෙවහි අට්ඨකථා" යනුද කීහ. කාරුණ්‍ය
මෙසේ හෙයින් ආයුෂ්මත් බුද්ධඝොෂාචාරීන් විසින් භාෂාපරි
වර්‍ත්තන මාත්‍රයෙන් සඞ්ගෘහිතවූ අට්ඨකථාවන්හිද මහාවංස ථූප
වංසාදියෙන් උද්ධරනලද බාහිරනිදාන වර්ණනා සීහල ථෙර
වාදයන්ගෙන්ද "අම්හාකං ඛන්ති අම්හාකං මති"යි දැක්වෙන
ස්වකීය මතයන්ගෙන් හා මහාපච්චරිය කුරුන්දි අන්ධක අට්ඨ
කථා වාදයන්ගෙනුත් අන්‍යවූ සියල්ලක් සඞ්ගායනාත්‍රයට
ආරූඪ කරනලද මහා අට්ඨකථා වචනමැයි දතයුතු.

ඒ මහා අට්ඨකථාගත විනිශ්චයජාතයද, සූත්‍රයෙහි හා
සූත්‍රානුලොම සඞ්ඛ්‍යාත සතර මහා ප්‍රදෙශයන්හි ලා සාකල්‍ය
යෙන් සුවිනිශ්චිත හෙයින් නිසැකවම ඇදහිය යුතු වේ.
එහෙයින් ත්‍රිපිටකධර ටීකාචාර්‍ය්‍යවරයන් පවා අන්‍යපාල්‍යට්
ඨකථා සාධකයක් නැති තැන අට්ඨකථාගත සාමාන්‍ය
වචනය විශෙෂවශයෙන් ගෙන වර්ණනාකිරීමට පොහොසත්

නොවූහ. එහෙයින් වජිරබුද්ධි ටීකාචාර්යයෝ (10) "නහි බුද්ධානං දෙසනාය ආලසියං අත්ථි"යි ද සාරත්ථදීපනී ටීකාචාර්යවරයෝ (11) "අට්ඨකථාචරියා එවෙත්ථ පමාණං භගවතො අධිප්පායඤ්ඤුනො හි අට්ඨකථාචරියා"යි ද විමති විනෝදනී විනයාලඞ්කාර ටීකාචාර්යවරයෝ (12) "නහි විනයෙ සබ්බත්ථ යුත්ති සක්කා ඤාතුං බුද්ධගොචරත්තාති වෙදිතබ්බං" යනුද, (13) "විපත්තිපරිහාරත්ථං හි ආචරියා නිරාසඞ්කට්ඨානෙසුපි 'ඤත්තිං අකිත්තෙත්වා'ති ආදිනා සිද්ධමෙවත්ථං පුනප්පුනං අවොචුං"යි ද කීහ. එහෙයින් අට්ඨකථාගත සාමාන්‍ය වචනය සාමාන්‍යයෙන්ම ගත යුතු. ප්‍රතිසංස්කරණයට හෝ අතුරු පැනවිලි එකතුකිරීමට හෝ අවකාශයක් නැත්තේය.(14)"උපමාය පිධෙකච්චෙ අත්ථං ජානන්ති පණ්ඩිතා" යන ජාතක පාළිපාඨය අනුව යථොක්ත අර්ථය ප්‍රකටවීම පිණිස උපමා වශයෙන් මෙසේ දතයුතු. විනය දෙශනාව ආඥා දෙශනාව බැවින් ඒ ඒ ආණ්ඩුවල රාජනීති හා සමානයි. පැමිණිලිකාර විත්තිකාර දෙපක්ෂයටත් ඔවුන්ගේ නීතිඥයන්ටත් ඒ රාජනීති වෙනස් කිරීමට අවකාශයෙක් නැත්තේය. ස්වපක්ෂයෙහිවූ විත්තිකරු හෝ පැමිණිලිකරු නිදහස් කරගනු පිණිස නැත හොත් පරපක්ෂයෙහි අයට දඬුවම් පමුණුවනු පිණිස නීති ප්‍රතිසංස්කරණයට පමුණුවා හෝ අතුරු නීති ඇතිකොට කථාකරන නීතිඥයෙක් වෙයි නම් මනුෂ්‍යයෝ ඒ නීතිඥයා විපර්යස්තයෙක් උන්මත්තකයෙක්යයි හගිත්මය.

ඒ ඒ රට ආණ්ඩුකරන රජවරුන්ට වඩා ශතසහස්‍ර වාරයෙකිනුත් ශ්‍රෙෂ්ඨ ජ්‍යෙෂ්ඨ ධර්මරාජන්වූ භාග්‍යවතුන් වහන්සේගේ විනය නීති ප්‍රතිසංස්කරණයට පමුණුවන්නාවූ හෝ අතුරු පැනවිලි ඊට එකතුකරන්නාවූ පුද්ගලයන් ගැන වනාහි කියනුම කවරේද?

මේ වනාහි විනය දෙශනාව පෙළ අටුවාවන්හි ආ පරිද්දෙන්ම ගත යුතුවා මිස ප්‍රතිසංස්කරණයට පැමිණවීම හෝ අතුරු පැනවිලි එකතුකිරීම හෝ නොකටයුතු බව පැහැදිලි කරනු වස් කියනලද වක්ෂ්‍යමාණ විසුංගාමසීමාවිනිච්ඡයෙහි ප්‍රාරම්භ කථායි.

**දැන් විසුංගාමසීමාවිනිච්ඡය පෙළ අටුවා ටීකා සාධක සහිතව පැහැදිලිකර දක්වනු ලැබේ.**

සීමාව බද්ධාබද්ධ වශයෙන් දෙපරිදි වේ. එයින් බද්ධසීමාවගේ ප්‍රමාණය පමණක් සර්වඥයන් වහන්සේ විසින් වදාරන ලදී. කෙසේද යත්? මහාවග්ග උපොසථක්ඛන්ධක පාළියෙහි සහ පරිවාරකම්මවග්ගයෙහි:—

(15,"අනුජානාමි භික්ඛවෙ තියොජනපරමං සීමං සම්මන්නිතුං,
එකාදසහි ආකාරෙහි සීමතො කම්මානි විපජ්ජන්ති,
අතිඛුද්දකං සීමං සම්මන්නන්ති අතිමහතිං සීමං සම්මන්නන්ති."

යනුවෙනි. උපරිම පරිච්ඡෙදයෙන් තුන් යොදුන් පමණ වූද අන්තිම පරිච්ඡෙදයෙන් භික්ෂූන් එක්විසි නමකට රැස්ව ඉඳගැනීමට තරම්වූද බඩසීමා සම්මතකරන්ට අනුදනිමි යනු එහි භාවයයි. කියනලද ප්‍රමාණ නියමයට වඩා මහත් කොට හෝ කුඩාකොට සම්මත කළහොත් ඒ විපත්ති සීමා වන්නීය. එහෙයින් කංඛා. තදට්ඨකථායෙහි (16) "අතිඛුද්දකා නාම යා එකවීසති භික්ඛූ න ගණ්හාති"යි.

මෙසේ බඩසීමාවගේ කුඩා මහත්වූ ප්‍රමාණ නියමය වදාළ නමුත් ග්‍රාම, නදී, ජාතස්සර, අරණ්‍ය සීමාවන්ගේ කුඩාවූ හෝ මහත්වූ ප්‍රමාණ නියමයක් වදාරා නැත්තේය. ඔව්හු වනාහි (17)"යං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති යා තස්ස වා ගාමස්ස ගාමසීමා නිගමස්ස වා නිගමසීමා අයං තත්ථ සමානසංවාසා එකූපොසථා" යනාදීන් සාමාන්‍යවශයෙන්ම වදාරන ලදහ. එහෙයින් බරණැස් නුවර පමණ දොළොස් යොදුන් විශාලවූ නුවරක් වී නම් ගාමසීමාවත් දොලොස් යොදුන් පමණ විශාල වන බවද ඊටත් වඩා විශාල නුවරක් වී නම් ගාමසීමාවත් එසේම විශාලවන බවද දතයුතු. හෙට්ඨිම පරිච්ඡෙදයෙන් සතරැස් රියනක් වියතක් අගලක් පමණ දක්වා වුවත් කුඩාද විය හැක්කේය. එහෙයින් අට්ඨකථාචාර්‍ය්‍යවරයන් විසින් ගාමසීමායෙහි කුඩාවූ හෝ මහත්වූ ප්‍රමාණ නියමය නොදක්වා (18) "සො පදෙසො අප්පො වා හොතු මහන්තො වා ගාමසීමාත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති" යනුවෙන් සාමාන්‍යයෙන් වර්ණනා කරනලදී. නදී සමුද්‍ර ජාතස්සර අරණ්‍යසීමාවෝද එසේමය. උදකුක්ඛෙප සත්තබ්භන්තරයන්ගේ වශයෙන් පිරිසිඳිය හැකි තන්හි පමණක් උදකුක්ඛෙප සත්තබ්භන්තර පරිච්ඡෙදය කටයුතු බව දක්වා එසේ පිරිසිඳිය නොහැකි තන්හි (19) "සචෙ නදී නාතිදීඝා හොති පභවතො පට්ඨාය යාව මුඛද්වාරං සබ්බත්ථ සංඝො නිසීදති උදකුක්ඛෙප සීමා කම්මං නත්ථි" යනුවෙන් ප්‍රභවයෙහි පටන් මෝදොර දක්වා ගඟ සපුරා සංඝයා වී නම් උදකොක්ඛෙප සීමාකර්මයක් නැතැයි කී අටුවා වචනය සලකා බැලියයුතු. (ග්‍රාම සීමායෙහි ප්‍රමාණ නියමය ප්‍රකාශවන පාළි පාඨයක් හෝ අටුවා පාඨයක් පෙන්වන්ට පිළිවන් සමතෙක් ඇත්නම් පෙන්වියයුතු අපි එය පිළිගන්ට නිතර සූදානම්ව සිටිමු.)

(20) "එත්තකකරීසමත්තො" යන විනයාලඞ්කාර ටීකා වචනයද ලක්‍ෂණදීපක වචන මාත්‍රයකි.

යට සතරැස් රියනක් වියතක් අගලක් ප්‍රමාණය දක්වාද ගාමසීමාව කුඩා විය හැකියයි කී වචනය විනයෙහි අවිශාරදවූවන්ගේ පිළිගැනීමට දුෂ්කර වියහැකි හෙයින් එය සාරවත්වූ සාධක පාඨවලින් ස්ථිරකොට දක්වනු ලැබේ. (21) "සමවස්සකාලෙ පහොනකජාතස්සරෙ පන සචෙපි දුබ්බුට්ඨිකාලෙ වා ගිම්හහෙමන්තෙසු වා සුක්ඛති නිරුදකො හොති තත්‍ථ සඞ්ඝකම්මං කාතුං වට්ටති සචෙ පනෙත්‍ථ උදකත්‍ථාය ආවාටං වා පොක්ඛරණීආදීනි වා ඛණන්ති තං ඨානං අජාතස්සරො හොති ගාමසීමාසඞ්ඛ්‍යං ගච්ඡති ලාබුතිපුසකාදිවප්පෙ කතෙපි එසෙව නයො" උපොසථක්ඛන්ධක අට්ඨකථා. සමවැසි ඇති වැසි සාරමස මුළුල්ලේ දිය රඳාසිටින ස්වයංජාතවූ විල වර්‍ෂණ ඍතුවෙහි නියගකොට හෝ හෙමන්ත ග්‍රීෂ්ම ඍතු පැමිණ හෝ වියලී ගිය කල්හිද සංඝකර්‍ම කිරීමට යොග්‍ය වේ. එහි ලිඳක් හෝ පොකුණක් හෝ සාරනලද්දේ වී නම් ලබු පුසුල් ආදිය හෝ වැවිලි කරනලද්දේ වී නම් ඒ ලිං පොකුණු සාරනලද ලබු පුසුල් ආදිය වැවිලි කරනලද පෙදෙස පමණක් ජාතස්සරය නෂ්ටව ග්‍රාමසීමා බවට පැමිණේ සෙස්ස ජාතස්සරම වේ. එහෙයින් අභිනව කඞ්ඛාවිතරණී ටීකායෙහි (22) "තං ඨානන්ති යත්‍ථ වාපි ආදිකං කතං තං ඨානං අක්ඛෙත්තං පන කප්පියභූමි" යනුද විමතිවිනොදනී ටීකායෙහි (23) "තං ඨානන්ති ආවාටාදීනං කතට්ඨානං න අකතට්ඨානන්ති අත්‍ථො" යනුද කියනලදි මෙහි ලිං පොකුණු සාරනලද හෝ ලබු පුසුල් ආදිය වැවිලි කරනලද පෙදෙස පමණක් ග්‍රාමසීමා වන බවද සෙස්ස ජාතස්සරමයයිද කීමෙන් ස්වයංජාතවූ විලමැද ඇතිවූ ග්‍රාමසීමාවගේ ප්‍රමාණය සලකාගත හැක්කේය. ඉඳින් ලිඳ අතින් සාරනලද්දේ නම් ඊට අයත්වූ ග්‍රාමසීමාව සතරැස් අඩියක් පමණද අඩි සතරක් පහක් පමණ යට සාරනලද ලිඳක් නම් ඊට අයත් ග්‍රාමසීමාව අඩි තුනක් හතරක් පමණද ලබු පුසුල් ආදිය වැවිලි කරනලද කොටුවක් වී නම් ග්‍රාමසීමාව පස් රියනක් හරියනක් යනාදි ප්‍රමාණද විය හැකි.

යට කී පරිද්දෙන් ලිං පොකුණු සාරනලද හෝ වැවිලි කරනලද ස්ථානය පමණක් ජාතස්සරය නෂ්ටව ග්‍රාමසීමාවක් වන්ට හෙතුව නම් මනුෂ්‍ය තිරශ්චීනාදි කිසි සත්වයකු විසින් නො සාරන ලදුව ඉබේම සෑරී සෑදුනු ජාතස්සර

ලක්ෂණය බිඳ යාමයි. එහෙයින් සීහ. කඞ්ඛාවිතරණී ටීකාවෙහි (24) "යො පන කෙනචි ඛණිත්වා අකතො සයං ජාතො සොබ්භො සමන්තතො ආගතෙන උදකෙන පූරිතො තිට්ඨති"යි.

යට කී ලෙස ස්වයංජාත විල වියලී ගොස් එහි ළිං පොකුණු කැනීමෙන් හෝ ලබු පුසුල් ආදිය රොපණය කිරීමෙන් ඇතිවූ හාත්පස අගලක් අඩියක් හෝ රියන් ගණනක් පමණවූ ග්‍රාමසීමාව කවර ගමකට ඇතුලත්වන්නීද යත්? යම් ගමක වැසියන් විසින් ළිඳ සෑරීම හා ලබු පුසුල් ආදිය රොපණය කිරීම කරනලද්දේ නම් ඒ ගමට ඇතුලත් වන්නීය. විල හාත්පස පිහිටි සියලු ගම්වැසියන් විසින් කරන ලද්දේ නම් ඒ සියලු ගම්වලටද ඇතුලත් වන්නීය. එසේ ගමකට ඇතුලත්ව පිහිටි විලක් නොවී නම් විසුංගාමසීමා වන්නීය. එහෙයින් වජිරබුද්ධි ටීකායෙහි (25)"ගාමසීමාසඞ්ඛ්‍යමෙව ගච්ඡතීති යෙහි කතං තෙසං ගාමසීමාසඞ්ඛ්‍යං වා සාමන්තාතිරඤ්ඤගාමෙහි චෙ කතං සබ්බගාමසඞ්ඛ්‍යං වා අඤ්ඤෙහි ගාමක්ඛෙත්තෙහි අසම්බන්ධට්ඨානංචෙ විසුංගාමසීමාසඞ්ඛ්‍යං වා ගච්ඡතීති ආචරියො" යනු කියනලදී. *

මේ ටීකාපාඨයට ඇතුලත්වී එන (26) "අඤ්ඤෙහි ගාමක්ඛෙත්තෙහි අසම්බන්ධට්ඨානඤ්චෙ විසුංගාමසීමාසඞ්ඛ්‍යං ගච්ඡති" යනු මේ විසුංගාමසීමා විනිච්ඡයෙහි අභිමතවූ වචනයයි. එහෙයින් එය මෙහි විශෙෂයෙන් පැහැදිළිකර දක්වනු ලැබේ.

යම් කිසි ගාමසීමාවකට ඇතුලත් නොවූ ස්ථානයෙක්හි ස්වයංජාත විලක් වී ඒ අවට සියලුම ගම්වලමායිම් ඒ ස්වයංජාත විල් ඉවුරින් අනතිම වෙත් නම් විල කිසිම ගමකට ඇතුලත් නොවේ. එවැනි විලක් යට කී නයින් නියංකිරීමෙන් වර්ෂා ඍතුවෙහිම වේවා නැතහොත් හෙමන්ත ග්‍රීෂ්ම ඍතුන්හි වේවා දිය සිඳී වියලී ගොස් වැල්ල මතුවූ කල එහි යම්කිසිවෙකු විසින් ජලය ලබාගැනීම පිණිස හාත්පස සතරැස් අඩියක් පමණවූ ආවාටයක් කනින ලද්දේ වී නම් ඒ කනිනලද ආවාටය හා සමප්‍රමාණවූ ප්‍රදෙශයම විසුංගාමසීමා වන්නීය.

* මෙහි "ආචරියො" යන්නෙන් අදහස් කරනලද්දේ සඞ්ග්‍රහාපිඨකථාචාර්‍ය්‍ය බුද්ධඝොෂ මහා ස්වාමිපාදයන් වහන්සේගෙන් පසු ඇතිවූ විනයාපිඨකථාචාර්‍ය්‍ය ධම්මපාල ටීකාචාර්‍ය්‍ය ශාරිපුත්‍රස්ථවිරාදි තෙවලාධර සියලුම පඬිවරයන් විසින් සම්භාවිත අභිධම්මමූලටීකාචාර්‍ය්‍ය ආනන්ද ස්ථවිර ස්වාමිපාදයාණෝයි.

“විසුං පවත්තො ගාමො විසුංගාමො”යි විග්‍රහකරනු. රජුන් විසින්ද භික්ෂූන් විසින්ද විසුං (වෙන්) නොකරන ලදුව තොමෝම වෙන්වූ ගාමසීමාය යනු හාවයි.

මේ හාත්පස අඩියක් පමණ පෙදෙස විසුංගාමසීමා විය හැකි අන්දමයි. සතරැස් අගලක් පමණ පෙදෙස විසුංගාම වියහැකි ආකාරය මතු දැක්වෙන පරිද්දෙන් දතයුතු.

(27)“අන්තො නදියං පාසාණො වා දීපකො වා හොති තත්‍ථ යත්තකං පදෙසං පුබ්බෙ වුත්තප්පකාරෙ පකතිවස්සකාලෙ වස්සානස්ස චතූසු මාසෙසු උදකං ඔත්‍ථරති සො නදීසඞ්ඛ්‍යමෙව ගච්ඡති අතිවුට්ඨිකාලෙ පන ඔඝෙන ඔත්‍ථටොකාසො න ගහෙතබ්බො සො හි ගාමසීමාසඞ්ඛ්‍යමෙව ගච්ඡති” උපොසථක්ඛන්ධක අට්ඨකථා.

**මෙහි අදහස පාෂාණයාගේ වශයෙන් දක්වනු ලැබේ.**

ඉතා විශාල නොවූ ගඞ්ගාවක් මධ්‍යයෙහි ගල්පරයක් පිහිටා සමවර්ෂණ කාලයෙහි වැසි සාරමස මුළුල්ලේ ජලයට ඒ ගල්පරය අජ්ඣොත්‍ථරණය වන්නේ නම් ගඞ්ගා සඞ්ඛ්‍යාවටද එසේ වැසි සාරමස මුළුල්ලේ අජ්ඣොත්‍ථරණය නොව මස් මරන්නවුන් විසින් ගමනාගමනය කළහැකිවූ මනුෂ්‍යගොචර මනුෂ්‍යූපචාරයෙහි වී නම් ගාමසීමා සඞ්ඛ්‍යාවටද පැමිණෙන්නේය. ගඞ්ගාව අති විශාලවැ ගල්පරය මස් මරන්නවුන්ට ගොස් එදිනම හැරී ඊමට පිළිවන් මනුෂ්‍යගොචර මනුෂ්‍යූපචාරයෙක්හි නොව දූරස්ථ වී නම් ඒ ගල්පරය අරණ්‍ය සීමා බවට පැමිණෙන බව දතයුතු.

මනුෂ්‍යගොචර මනුෂ්‍යූපචාරයෙහි පිහිටි ඒ ගල්පර විසුංගාමසීමාව කවර ග්‍රාමයකට ඇතුළත් වන්නේද? මේද වජිර බුද්ධි ටීකායෙහි කියන ලදී. (28)“ගාමක්ඛෙත්තසඞ්ඛ්‍යං ගච්ඡති කතරගාමක්ඛෙත්තං? යතො මනුස්සා සඤ්චරන්ති තෙසං, සබ්බෙ ච සඤ්චරන්ති සබ්බෙසං, අඤ්ඤෙහි ගාමක්ඛෙත්තෙහි අසම්බන්ධට්ඨානංචෙ විසුංගාමක්ඛෙත්තසඞ්ඛ්‍යං ගච්ඡතීති ආචරියො”යි.

එහෙයින් ගඞ්ගාව පළලින් විශාලවැ දෙගං ඉවුරේ පිහිටි ගාමසීමාවන්ට ඇතුළත් නොවී නම් ඒ ගල්පරය විසුංගාම සීමාව වේ. හෙද විසිඑක් දෙනෙකුන්ට රැස්වීමට තරම් වී නම් කැමතිම සඞ්ඝකර්මයක් කිරීමටද හාත්පස සතැරැස් අඩියක් පමණ වී නම් එහි එක භික්ෂූන්වහන්සේ කෙනෙකුට අධිට්ඨාන උපොසථය කිරීමටද පිළිවන් වේ.

ඉදින් වැසි සාරමස මුළුල්ලේ ජලයෙන් යට නොවන ඒ ගල්පරමුදුන අඟලක් පමණ වී නම් විසුංගාමසීමාවද එපමණම වෙයි. එහෙත් එය විනයකර්ම කිරීමට පිළිවන් තැනක් නොවේ. විසුංගාමසීමා විය හැක්කේ ආණ්ඩුවෙන් බදු අයකරන ස්ථානයක්මයයි. ඝොෂාකරන්නන්ගේ සැනසීම පිණිස සතරැස් අඩියක් පමණවූ ඒ ගල්පරවිසුංගාමයෙන් ආණ්ඩුවට බදු අයවිය හැකි ආකාරයද මෙහි දක්වනු ලැබේ.

යම් කිසිවෙකු විසින් ඒ සතරැස් අඩියක් පමණවූ ගල්පරය මසුන් ඇල්ලීමට සුදුසු ස්ථානයක් බව දැන අන්‍යයන්ගේ එහි පැමිණීම වලක්වනු පිණිස රුපියල් 4ක් 5ක් පමණ බද්දක් ගෙවන බව ආණ්ඩුවට දන්වා ආණ්ඩුවෙන් ලබාගෙන අවුරුදු පතා නියම බද්ද ගෙවමින් ඒ ගල්පරය ස්වසන්තක කරගන්නා ලද්දේ වී නම් එතැන් පටන් ඒ ගල්පර ගාමසීමාව මස් මරන්නාට අයත්වූ ආණ්ඩුවෙන් බදු අයකරන විසුංගාම සීමාවක් වන්නීය.

මේ හාත්පස සතරැස් අඟලක් පමණ පෙදෙස විසුංගාම සීමා වන ආකාරයයි.

මේ අටුවාවැකියෙහි දැක්වූ ගාමසීමා වජිරබුද්ධි ටීකාවෙහි දැක්වූ විසුංගාමසීමාවන් මනුෂ්‍යයන්ගේ ගමනාගමනපරිභොග පරිග්‍රහණ මාත්‍රයෙන්ද මස් මරන්නවුන් විසින් ගොස් එදිනම හැරී ආහැකි පමණින්ද ගාමසීමාවූ හෙයින් රාජරාජමහාමාත්‍යාදීන්ගේ බදු නියමකිරීම් ඉම් ලකුණු දක්වා පිරිසිඳීම් ග්‍රාමභොජකයන් පත්කිරීම් හා කිසි සම්බන්ධයක් නැතිවම සිද්ධවූ විසුංගාමසීමාවන් යයිද සම්බන්ධය ඇති ඒවාත් පළමුකොටම සිද්ධවූ ගාමසීමාවන් යයිද දතයුතු.

### දූන් භික්ෂූන්ගේ කෘතියෙන් ඇතිවන විසුංගාමසීමාව දක්වනු ලැබේ.

හාත්පස ක්‍රොෂයක් (ගඩසනක්) පමණ විශාලවූ ප්‍රකෘති ග්‍රාමයක් සම්පූර්ණයෙන් මහා සීමාවක් හා එහි මැද ඛණ්ඩසීමාවක්ද කොට සම්මත කරනුලබන කල්හි සම්බන්ධය වලක්වනු පිණිස මහා සීමා ඛණ්ඩ සීමාවන්ගේ අන්තරය තැබිය යුතු වේ. ඒ සීමාන්තර ප්‍රමාණය (29) “අනුජානාමි භික්ඛවෙ සීමං සම්මන්නන්තෙන සීමන්තරිකං ඨපෙත්වා සීමං සම්මන්නිතුං’’යි සාමාන්‍යයෙන් වදාළ හෙයින් සීමාන්තරිකය කැමති තරමක් තැබිය හැකි වේ. එහෙයින් කියන ලදි අට්ඨකථායෙහි:— (30)‘‘සීමන්තරිකා පච්ඡිමකොටියා එකරතනප්පමාණා වට්ටති

විදත්ථිප්පමාණා වට්ටතීති කුරුන්දියං චතුරඞ්ගුලප්පමාණාපි වට්ටතීති මහාපච්චරියං වුත්තං"ති. ටීකාචාර්යයෝ වනාහි (31) "එකඞ්ගුලමත්තාපි සීමන්තරිකා වට්ටතියෙව"ති කීහ. මහාසීමා ඛණ්ඩසීමාවන්ගේ අන්‍යොන්‍ය අසම්බන්ධමාත්‍රය අභිමත හෙයින් "අඩ්ඪඞ්ගුලමත්තාපි වට්ටතෙව"සී ද කිවමනා තැනි. (32) "සීමන්තරිකා හි ගාමක්ඛෙත්තං භජති"ති අට්ඨකථායෙහි කී හෙයින් සීමන්තරිකය ග්‍රාමක්ෂෙත්‍රයට ඇතුළත් වන බව දතයුතු. එහෙයින් කියනලද හාත්පස ක්‍රොෂයක් පමණ වූ පියවි ගමෙහි සීමන්තරිකය හැර අන් සියල්ලක් බඩසීමා වන හෙයින් රියනක් නැතහොත් වියතක් සතරඟුලක් අඟලක් පමණද වූ ප්‍රදෙශය භික්ෂූන් විසින් කර්මවාක්‍යයෙන් විසුං කරනලද රජරජමහා අමාත්‍යාදීන් විසින් බලිග්‍රහණයෙන් හා සීමාන්තපරිච්ඡෙදයෙන් නොපිරිසිඳිනලද අන්‍ය ග්‍රාමයන් සමගද සම්බන්ධයක් නැති විසුංගාමසීමාවක් වන්නීය. ඒ සීමන්තරිකයෙහි සිට ගැනීමට ප්‍රමාණ නම් පෙළට සිටගෙන භික්ෂූන්ට කැමතිම විනයකර්මයක් කළ හැකි වේ. ඉදින් මහාසීමා ඛණ්ඩසීමාවන්ට ඇතුළත් නොවී ග්‍රාමයෙන් කොටසක් ඉතිරිවී නම් සීමාන්තරිකයද ඊට ඇතුළත්ව විසුං ගාමයක් නොව ප්‍රකෘති ග්‍රාමසීමාම වන්නීය.

මේ භික්ෂූන්ගේ ප්‍රකෘතියෙන් විසුංගාමසීමා ඇතිවියහැකි ආකාරයි.

මෙසේ කියනලද පරිද්දෙන් ග්‍රාමසීමා සම්බන්ධවූ කුඩු මහත් ප්‍රමාණ නියමයක් කිසිම දෙශනා පාළියක වදාරා නැත්තේය. අටුවාවලද කියා නැත්තේය. ගෙවල් දොරවල් ඇති නැති බවද ප්‍රමාණ නොවේ. ආහාර පිණිස ගේන් කුඹුරු ගොවිතැන් ආදිය පිණිස ගමනාගමනයෙන් පරිභොග ස්ථාන වූ මනුෂ්‍යගොචර මනුෂ්‍යූපචාරයන් තුළ වී නම් අඟලක පමණ බිම් පෙදෙසක් වූවත් ගාමසීමා නොවීමට කිසිම බාධාවක්ද නැත්තේය. එහෙයින් විසුංගාමය යටත් පිරිසෙයින් කිරියක් (සතරමුණක් බිජු වපසරියැති) විය යුතුය. ගෙවල්ද ඇති විය යුතුය යනා ආදි වශයෙන් ඇතිකරගෙන තිබෙන දූෂිත සියල්ලක් බැහැර ලා යථාධර්මයෙහි පිහිටීම පිණිස සිත්වලට ගතයුතු.

දැන් රජුන් විසින් වෙන්කරනුලබන අට්ඨකථායෙහි සෘජු වම දක්වනලද විසුංගාමසීමාවිනිච්ඡයාවසරය පැමිණියේයි. එහෙත් ඒ විසුංගාමසීමාවසම්බන්ධ සුඛාවබොධය පිණිස රට වැස්සන්ට බිම් අයිති වී අවුත් තිබෙන ආකාරය හා පෘථිවීශ්වරවූ රජුන්ට බිම් අයිති වී අවුත් තිබෙන ආකාරය මෙහි පළමු

කොට දක්වනු ලැබේ. රට වැස්සන් ආදි කල්පයෙහි සිටම බිම් පෙදෙස් බෙදා වෙන්කොට ස්වසන්තකත්වයට පමුණුවා පරිපාලනය කරගෙන එන්නන් බැවින් ඔව්හු මාතෘ පිතෘ ආදීන්ගෙන් දායාද වශයෙන් අයිතිවන්නාවූ බිම් පෙදෙසුත් මිලදී ගන්නාලද බිම් පෙදෙසුත් කඳු වන කාටූකොහොල් පිහයා ගන්නාලද බිම් පෙදෙසුත් ස්වසන්තකත්වයෙහි තබා එහි ඊශ්වර වන්නාහුය. එහෙයින් දීඝනිකාය පාථේය්‍ය වග්ග අග්ගඤ්ඤ සූත්‍රයෙහි භාග්‍යවතුන්වහන්සේ විසින් (33) "යංනූන මයං සාලිං විභජෙය්‍යාම, මරියාදං ඨපෙය්‍යාමාති. අථ ඛො තෙ වාසෙට්ඨ සත්තා සාලිං විභජිංසු මරියාදං ඨපෙසුං. අථඛො වාසෙට්ඨ අඤ්ඤතරො සත්තො ලොලජාතිකො සකං භාගං පරිරක්ඛන්තො අඤ්ඤතරං භාගං අදින්නං ආදියිත්වා පරිභුඤ්ජි. තමෙනං අග්ගහෙසුං ගහෙත්වා එතද වොචුං: පාපකං වත භො සත්ත කරොසි, යත්‍රහි නාම සකං භාගං පරිරක්ඛන්තො අඤ්ඤතරං භාගං අදින්නං ආදියිත්වා පරිභුඤ්ජසි, මාස්සු භො සත්ත පුනපි එවරූපමකාසීති" යන ආදීන් වදාරන ලදහ. තදට්ඨකථායෙහිද (34) "තෙ පනස්ස ඛෙත්තසාමිනො තිහි සද්ධෙහි අභිසෙකම්පි අකංසු" යනුවෙන් රටවැසියන් කෙත් හිමියන්කොට කියනලදී. තට්ටීකායෙහිද (35) "ඛෙත්තසාමිනොති තං තං භූමිභාගං පරිග්ගහෙත්වා ඨිතත්තා" යනුවෙන් හා "සීමං ඨපෙය්‍යාමාති අයං භූමිභාගො අසුකස්ස අයං භූමිභාගො අසුකස්සාති එවං පරිච්ඡෙදං කරෙය්‍යාම" යනුවෙනුත් වර්ණනා කරන ලද්දේය. විනයට්ඨකථා විතීය පාරාජික ශික්ෂාපද වර්ණනායෙහිද අනුන්ට අයත්වූ ගේ දොර කෙත් වත් ගව මහිස එළු බැටළු ආදි සවිඥානක අවිඥානක වස්තූන් සිඳ බිඳ ගන්නාවූද දහයෙන් පංගුවවූ නියම සුංගම (අයබද්ද) බලාත්කාරයෙන් වැඩිකොට ගන්නාවූද රජරාජ මහා අමාත්‍යාදීන්ට පසය්හාවහාර වශයෙන් අදින්නාදානය සිද්ධවන බව (36) "කොධවසෙන පරසරවිලොපං කරොන්තා අත්තනො පත්ත බලිතොච අධිකං බලක්කාරෙන ගණ්හන්තා රාජරාජමහාමත්තාදයො විය තෙසෙවං ගණ්හතො අවහාරො පසය්හාවහාරොති වෙදිතබ්බො" යි කීහ.

කියනලද නයින් රටවැසියන් ස්වසන්තකයෙහි ඊශ්වරයන් වූවද රාජදෙයවූ තමන් අයත් ආදායමෙන් දහයෙන් කොටසක් රජුන්ට දීම් රජ අණට අකීකරු වී නම් සිය බිම් පෙදෙසින් නෙරපනුලැබීම් රජුන් විසින් තබනලද නීති ඉක්මවා සිය බිම්හි වූවත් කිසිවක් නොකට හැකි වීම් ආදිය හෙතු කොටගෙන රජවරුන්ට මෙන් ආශු සම්පන්න ඊශ්වරත්වයක්

නම් රටවැසියන්ට නැත්තේය. රජවරු වනාහි රටවැසියන් මෙන් එක දෙශයකට නොව මුළු මිහිපිට යම් පමණ තැන් සිය අණසක පැතිර පවත්නේද ඒතාක් ස්වකීය ආඥබල යෙන් යුක්තව ඊශ්වරවූවාහු නම් වෙත්. එහෙත් වැසියන්ට මෙන් රටුන්ට අයත්වූ බිම් පෙදෙස් විකිණීමට බලයක් හෝ දායාද්‍ය වශයෙන් ගැනීමට බලයක් හෝ රජවරුන්ට නැත්තේය. කරුණු මෙසේ හෙයින් වැසියන් සතුවූ ආදායමෙන් දහයෙන් කොටසක් ගැනීම රජ අණ කඩකරන්නවුන්ට නීතිය අනුව දඬුවම් පැමිණවීම වැසියන් සිය බිම් පෙදෙස් වලින් නෙරපීම වැසියන් අයත් බිම් පෙදෙස්වලට නීති පැනවීම් ආදිය රජවරුන්ගේ පෘථිවීශ්වරභාව ගුණයයි දතයුතු. එහෙයින් අග්ගඤ්ඤ සූත්‍රයෙහි (37) "අථ ඛො තෙ වාසෙට්ඨ සත්තා යො නෙසං සත්තො අභිරූපතරො ච දස්සනීයතරො ච පාසාදිකතරො ච මහෙසක්ඛතරො ච තං සත්තං උපසඞ්කමිත්වා එතදවොචුං: එහි භො සත්ත සම්මා ඛීයිතබ්බං ඛීය, සම්මා ගරහිතබ්බං ගරහ, සම්මා පබ්බාජෙතබ්බං පබ්බාජෙහි, මයං පන තෙ සාලීනං භාගං අනුපදස්සාමා'ති. එවං භො'ති ඛො වාසෙට්ඨ සො සත්තො තෙසං සත්තානං පටිස්සුණිත්වා සම්මා ඛීයිතබ්බං ඛීයි, සම්මා ගරහිතබ්බං ගරහි, සම්මා පබ්බාජෙතබ්බං පබ්බාජෙසි. තෙ පනස්ස සාලීනං භාගං අනුපදංසු. මහාජනසම්මතො'ති ඛො වාසෙට්ඨ මහාසම්මතො මහාසම්මතොතෙව පඨමං අක්ඛරං උපනිබ්බත්තං, ඛෙත්තානං අධිපතීති ඛො වාසෙට්ඨ ඛත්තියො ඛත්තියොතෙව දුතියං අක්ඛරං උපනිබ්බත්තං, ධම්මෙන පරෙසං රඤ්ජෙතීති ඛො වාසෙට්ඨ රාජා රාජාතෙව තතියං අක්ඛරං උපනිබ්බත්තං" යිවදාරනලදී. තදට්ඨකථායෙහිද (38) "ඛීයිතබ්බං ඛීයෙය්‍යා'ති පකාසෙතබ්බං පකාසෙය්‍ය ඛිපිතබ්බං ඛිපෙය්‍ය හාරෙතබ්බං හාරෙය්‍යා'ති වුත්තං හොති. යො නෙසං සත්තොති යො තෙසං සත්තො කො පනාසො?ති. අම්හාකං බොධිසත්තො; සාලීනං භාගං අනුපදස්සාමා'ති මයං එකෙකස්ස ඛෙත්තතො අම්මණං අම්මණං ආහරිත්වා තුය්හං සාලිභාගං දස්සාම තයා කිඤ්චිකම්මං නකාතබ්බං ත්වං අම්හාකං ජෙට්ඨකො ජෙට්ඨකට්ඨානෙ සෙට්ඨට්ඨානෙ තිට්ඨාහි" යනුවෙන් වර්ණනා කරන ලදී.

මහාසම්මත රජහු විසින්ම මනුෂ්‍යයන් විසින් නො ඉක්මවා හැසිරිය යුතු නීත්‍යුපදෙශ මර්යාදාද තැබූ බවට අග්ගඤ්ඤසූත්‍ර පොරාණාභිනව ටීකාවන්හි :—

"ඨපිතා යෙන මරියාදා ලොකෙ ලොකහිතෙසිනා,
වවත්ථිතා සක්කුණන්ති නවිලඞ්ඝයිතුං ජනා."

යි සාධක දක්වූහ.

එසේ බදු අයකර ගැනීමට පිළිවන් බලයද, රාජාඥාවට අධිකාරුවූවන් ඔවුන් සතු බිම්වලින් නෙරපිය හැකි බවද වැසියා සතු බිම්වල ව්‍යවස්ථා පණවා අනුශාසනා කළ හැකි බවද අපරාධකරුවන්ට අපරාධය අනුව දඬුවම් පැමිණවිය හැකි බව හා ඉම් ලකුණින් ගම්, කෝරළ, පළාත් බෙදා වෙන්කිරීමට හා එක්කිරීමට පිළිවන් බවද පෘථිවීශ්වරභාව ගුණයයි කියනු ලැබේ. ඒ ප්‍රථිවීශ්වරභාව ගුණයද අභිෂික්ත අනභිෂික්ත සකල නරපතීන් කෙරෙහිම ඇති හෙයින් ඒ ඒ නරපතීන් ස්වකීය පෘථිවීශ්වරභාව ගුණය ආණ්ඩුකාර ඒජන්ත ආදි නිලධාරීන් වෙත නොපැවරිය හැකිය කියා නැත්තේය. කැමති සේ තනතුරුවලට පමුණුවා ස්වකීය පෘථිවීශ්වරභාව ගුණය ඒ ඒ නිලධාරීන් වෙතද පැවරිය හැක්කේමය. එහෙයින් එබඳු රජුන් වෙතින් ලත් ආඥා බලය ඇති ආණ්ඩුකාර ඒජන්ත ආදී නිලධාරීන්ටද ගම් කෝරළ ආදිය බෙදා වෙන්කිරීමට හා එක්කිරීමට පිළිවන් ආඥාබලයක් ඇති බව නිසැකවම දතයුතු. සඟසතු ආරාම පන්සල්වල වුවත් රජවරුන්ගේ පෘථිවීශ්වර ආඥා බලය ඉක්මවිය හැකි නොවේ. එහෙයින් ඒ ආරාම පන්සල් වලද ආණ්ඩුවේ නිලධාරීන්ට නීත්‍යනුකූලව ගම් බෙදා වෙන්කිරීමට හා එක් කිරීමට බලය ඇති බවද නිසැකවම දතයුතු.

ප්‍රකෘති ග්‍රාම විසුංගාම දෙකින් භාග්‍යවතුන්වහන්සේ විසින් වදාරනලද්දේ ප්‍රකෘති ග්‍රාමය පමණයි. සඞ්ගීතිකාරක මහරහතන්වහන්සේලා විසින් අනුදන්නාලද විසුංගාමය වනාහි ඒ ප්‍රකෘති ග්‍රාමයාගේ අවයව මාත්‍රයෙන් විකෘති මාත්‍රයෙන්ම විශිෂ්ට බැවින් ප්‍රකෘති ග්‍රාම ලක්ෂණය පැහැදිලිව තේරුම්ගත් තැනැත්තාට විසුංගාම ලක්ෂණයද නිරායාසයෙන්ම අවබොධ විය හැක. එහෙයින් මෙහි ප්‍රකෘති ග්‍රාම ලක්ෂණයත් සමගම විසුංගාම ලක්ෂණය දක්වනු ලැබේ. (39) "අසම්මතාය භික්ඛවෙ සීමාය අට්ඨපිතාය යං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති. යා තස්ස ගාමස්ස වා ගාම සීමා නිගමස්ස වා නිගමසීමා අයං තත්‍ථ සමානසංවාසා එකූපොසථා" යන උපොසථක්ඛන්ධක පාළියෙහි භික්ෂූන් නිශ්‍රයකොට ගෙන වාසයකරන ග්‍රාමයෙහි ග්‍රාමාන්තරයන් හා අසම්බන්ධ සීමාපරිච්ඡෙදය ග්‍රාමසීමා නම් වේ. නිගමයෙහි ග්‍රාමාන්තරයන් හා අසම්බන්ධ සීමාපරිච්ඡෙදය නිගමසීමා නම් වේ.

මෙසේ සීමාන්තයෙන් පිරිසිඳිනලද එකෙක් ග්‍රාමක්ෂෙත්‍රයෙක් එකෙක් ප්‍රකෘති ග්‍රාමසීමාවක්වන බව වදාරන ලද්දේය.

තදට්ඨකථායෙහිද ග්‍රාමය සීමාන්තයෙන් පරිච්ඡින්නවූ කල්හි ගම් බුදින්නන්ට ලැබිය යුතු අයබද්දෙන්ද පිරිසිඳුණේවීයයි මෙනෙහි කොට අයබද්දෙන් පිරිසිඳීමත් සීමාන්තයෙන් පිරිසිඳීම මැයි දක්වනු පිණිස (40) "තත්‍ථ යත්තකෙ පදෙසෙ තස්ස තස්ස ගාමස්ස භොජකා බලිං ලභන්ති සො පන පදෙසො අප්පො වා හොතු මහන්තො වා ගාමසීමාත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති නගරනිගමසීමාසු පි එසෙව නයො" යි වර්ණනා කරන ලදි. මෙහි "යත්තකෙ-පෙ-ලභන්ති" යන වාක්‍යඛණ්ඩයෙන් ලොකව්‍යවහාර සිද්ධ ගාමක්ෂෙත්‍රය ග්‍රාම පරිච්ඡෙදය බදු අයවෙන ප්‍රමාණයෙන්ම දතයුතුවා මිස අභිධර්මයෙහි මෙන් ඉන්ද්‍රඛීලස්ථානයෙන්ද අදින්නාදාන ශික්ෂා පදයෙහි මෙන් පරික්ෂෙපපරික්ෂෙපාභිස්ථානයෙන්ද අරණ්‍යක ශික්ෂාපදයෙහි මෙන් ක්‍රොෂයකින් (හඬසනකින්)ද නොදතයුත්තේයයි දක්වන ලදි. එසේ දක්වීමෙන්ම ගම් වැස්සන් විසින් එක මහා ග්‍රාමපරිච්ඡෙදයක් ග්‍රාම දෙකක් හෝ තුනක් කොට පිහිටුවා ගන්නාලදුවද ආණ්ඩුව විසින් ඒ අභිනව ග්‍රාමයෝ සීමාන්තයෙන් බෙදා නොපිරිසිඳින ලද්දාහු නම් ග්‍රාමපරිච්ඡෙද ග්‍රාමභොජකයන්ගේ වශයෙන් විශෙෂයක් නොවූ හෙයින් ආදි මහාග්‍රාමසීමාන්තපරිච්ඡෙදයෙන් එකම ග්‍රාමක්ෂෙත්‍රයක්මයයිද දක්වන ලදි. "සො පන පදෙසො අප්පොවා හොතු මහන්තොවා" යන වාක්‍යඛණ්ඩයෙන් අන්තිම පරිච්ඡෙදයෙන් එක්විසි දෙනෙකුන්ට රැස්වීමට තරම්වූද උත්කෘෂ්ට පරිච්ඡෙදයෙන් තුන් යොදුන් තරම්වූද බද්ධසීමාවෙහි ප්‍රමාණ නියමයම උදාරනලද නමුත් මේ ග්‍රාමසීමාවෙහි ප්‍රමාණ නියමයක් වදාරා නැති බවද දක්වන ලදි. රාජපර්ණියයි කියනලද ආණ්ඩුවේ බිම් ලෙඛණයට ආරොපණයකොට සීමාන්තයෙන් නොපිරිසිඳින ලදුවද බලි පරිච්ඡෙදයෙන් පිරිසිඳිනලද්දේවී නම් ග්‍රාමය වෙන්වීයයි මේ අටුවාවචනයෙන් තේරුම්නොගත යුතු. එහෙයින් විනයවිනිච්ඡය ටීකායෙහි බලි පරිච්ඡෙදය හා සීමාන්ත පරිච්ඡෙදයත් දෙක එකට ගෙන (41) "ගාමපරිච්ඡෙදොති සබ්බදිසාසු සීමං පරිච්ඡින්දිත්වා ඉමස්ස පදෙසස්ස එත්තකො කරො'ති එවංකරෙන නියමිතො ගාමප්පදෙසො" යනු කියනලදි. එසේ සීමාන්ත පරිච්ඡෙදයෙන් පිරිසිඳි කල්හිම ග්‍රාමයක් වශයෙන් වෙන් විය හැකි හෙයින් පියවිගමක් තුළ විසුංගම ඇතිවනඅයුරු දක්වූ අට්ඨකථායෙහි අයබද්දෙන් පිරිසිඳ දීම නොදක්වා සීමාන්තයෙන් පිරිසිඳ රාජපර්ණියෙහි ආරොපණය කිරීමෙන් දීමම ප්‍රධාන නීතාර්ථවශයෙන් ගෙන (42) "යංපි එකස්මිං යෙව ගාමක්ඛෙත්තෙ එකං පදෙසං අයංපි

විසුංගාමො හොතූති පරිච්ඡින්දිත්වා රාජා කස්සචි දෙති සොපි විසුංගාමසීමා හොති යෙව" යනු කියනලදී. මෙහි "කස්සචි" යනු ගිහියෙක් වේවා පැවිද්දෙක් වේවා කවරෙකු වුවත් ගැනෙන සාමාන්‍ය වචනයක් නමුත් (43) "අනුජානාමි භික්ඛවෙ ආරාමං පටිග්ගහෙතුං"යි විසෙසානුඤ්ඤාතයක් ආ බැවින් භික්ෂූන්ට ආරාම ව්‍යවහාරයෙන් මුත් ගම් යන අකැප ව්‍යවහාරයෙන් බිම් පිළිගැනීම නොවටී.

**දැන් මට දැක්වූ පාළ්‍යට්ඨකථා ටීකාපාඨයන්ගේ අදහස නැවතත් මෙහි පිඬුකොට දක්වනු ලැබේ.**

1. පෙළේ සීමාන්තයෙන් පමණක් පිරිසිඳීමද.

2. පීයවිගම දැක්වූ අටුවා විනය විනිශ්චය ටීකාවන්හි සීමාන්ත බලි ග්‍රහණ දෙකින්ම පිරිසිඳීමද.

3. විසුංග්‍රාමය පැවසෙනා අටුවායෙහි සීමාන්තයෙන් පමණක් පිරිසිඳීමද දක්වන ලදී.

මෙසේ ආ පෙළ අටුවා ටීකා තුන එකිනෙක සසඳා ගත් කල්හි සීමාන්තයෙන් පිරිසිඳීම නමැති ප්‍රධාන ලක්ෂණයෙන් හා අයබද්දෙන් පිරිසිඳීම නමැති අප්‍රධාන ලක්ෂණයෙන් සලකනලද එක් ග්‍රාමක්ෂෙත්‍රයක් ප්‍රකෘති ග්‍රාමසීමාවක් බවද එහි තුළ රජාදීන් විසින් පිරිසිඳිනලද ප්‍රදෙශය විසුංගාමසීමාවක් බවද පැහැදිලි වේමය. යට කී නදී සමුද්‍ර ජාතස්සර යන්හි ගල්පර දූපත් ආවාටාදිය මනුෂ්‍යගොචර මනුෂ්‍යූපචාර යන්හි වූ පමණින් ග්‍රාමසීමා වන බව පැවසූ අටුවා වචනයෙන්ද අයබද්දෙන් පිරිසිඳීම ප්‍රධාන නොවන බව පැහැදිලි වේ. එහෙයින් පෙළ අටුවා සාධකයක් තබා සැහෙන ටීකා වචනයක්වත් නැතිව (44) "යස්මිං පකතිගාමඛෙත්තකෙද සංයංකිඤ්චි කරගාහපරිච්ඡින්නාට්ඨානං කරගාහං දාතුමිච්ඡයං රජාදිහි පරිච්ඡින්දිත්වා දින්නං තං යෙව විසුංගාමසඞ්ඛ්‍යං ගච්ඡති" යනුවෙන් කල්‍යාණි ශිලාලෙඛනයෙහි කියනලද්දේ අත්තනොමති මාත්‍රයක්බව දතයුතු. එහි "කරගාහං දාතුමිච්ඡයං" යන වචනය ගෙන බදු අයකරන අදහසින් විනා සීමාසම්මුති ආදිය පිණිස විසුං කරනලද්දේ වී නම් විසුංග්‍රාමයෙක් නොවේයයි අටුවා වචනයට අතින් මිරිත් දමා පිළිසකර කොට කියාපාන් නාවූ පරවාදීන් විනයනය ඉක්මවූ බැවින් යට දැක්වූ රජනීති වෙනස්කළ නීතිඥයාටත් වඩා දරුණුවූ විනය අවිනය කොට අවිනය විනය කොට දක්වන අපරාධකයන් වියනොහැක්කේද? "කොළඹ නගරයක් බැවින් එහි ග්‍රාමයක් විසුංකළ නොහැක" යනුද පරවාදීන්ගේ එක්තරා බොළඳ කීමකි.

ගාම ශබ්දය වාචකත්වයෙන් ග්‍රාම නිගම නගරත්‍රයෙහිම
ආරූඪ සාමාන්‍ය ව්‍යවහාරයකි. නිගම ශබ්දය වාචකත්වයෙන්
ස්වාර්ථමාත්‍රයෙහි ආරූඪ විශෙෂ ව්‍යවහාරයකි. එහෙයින් ගාම
නිගම ශබ්දද්වය ධම්මවිනය ශබ්දද්වයමෙන් සමස්ත ව්‍යස්ත අව
ස්ථාවයෙන් යුක්තවූ ප්‍රතියොගී වන්ද්වාරිශබ්දද්වයකැයි කියයුතු
වේ. ඒ එසේමය. විනය මහාවග්ගපාළියෙහි (45) "යං ගාමං
වා නිගමං වා උපනිස්සාය විහරති" අභිධම්මඛුද්දකවත්ථු
විභඞ්ග පාළියෙහි (46) "පුනචපරං භික්ඛු ගාමං වා නිගමං
වා පිණ්ඩාය චරන්තො" ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි (47) "ඉධ ව්‍යග්ඝ
පජ්ජ කුලපුත්තො යස්මිං ගාමෙ වා නිගමෙ වා පටිවසති"
නවඞ්ගුත්තර පාළියෙහි (48) "යං ජක්ඛුස්ස ගාමනිගමං ඉමං බො
මෙ ගාමනිගමං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති" මහා
පරිනිබ්බාණ සූත්‍රයෙහි (49) "යො වො ආනන්ද මයා ධම්මොච
විනයොච දෙසිතො පඤ්ඤත්තො" මූලපණ්ණාස චූලසීහනාද
සූත්‍රාදියෙහි (50) "එව රූපෙ භික්ඛවෙ ධම්මවිනයෙ සත්ථුප
සාදො" යන ආදීන් ත්‍රිපිටකයෙහිම "ගාමනිගම-ධම්මවිනය"
ශබ්දයන් සම්බන්ධ සමස්ත ව්‍යස්තාවස්ථාවයෙන් යුක්තවූ ශබ්ද
යුග්මයක් බවට සාධක ඉතා බොහෝ බැව් දක්නා ලැබෙත්.
එහෙයින් කෙවලව සිටි ගාම ශබ්දයෙන් ග්‍රාම නිගම නගරත්‍ර
යම වාච්‍යවන බවද නිගම ශබ්දය හා එක්ව සිටි කල්හි ගොබ
ලිවද්ද න්‍යායයෙන් ප්‍රතියොගී නිගම ශබ්දාර්ථාවශිෂ්ටාර්ථ මාත්‍රය
පමණක් වාච්‍යවන බවද දතයුතු. "ගොබලිවද්ද" න්‍යාය යන
තන්හි කෙවල ගො ශබ්දයෙන් ගව පිණ්ඩාර්ථය සාකල්‍ය
යෙන්ද බලිවද්ද ශබ්දය හා එක්ව සිටි කල්හි ප්‍රතියොගී බලි
වද්ද ශබ්දාර්ථාවශිෂ්ටවූ වච්ඡ, වච්ඡතර, දම්ම, ජරග්ගවසඞ්ඛ්‍යාත
ගවාර්ථය පමණක්ද වාච්‍ය වේ. මේ නයින්ම ධම්මවිනය ශබ්ද
වයෙන් "පදසො ධම්මං වාචෙය්‍ය" යනාදියෙහි මෙන් කෙව
ලව සිටි ධම්ම ශබ්දයෙන් විනයසූත්‍රාභිධර්මත්‍රයම වාච්‍යවන
බවද "ධම්මො ච විනයො ච" යනාදියෙහි මෙන් විනය ශබ්දය
හා එක්ව සිටි කල්හි ප්‍රතියොගී විනය ශබ්දාර්ථාවශිෂ්ට සූත්‍රාභිධර්
මය පමණක් වාච්‍යවන බවද දතයුතු. දක්වනලද නිදර්ශනා
නුසාරයෙන් "යං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති" යී
ආ තන්හි නිගම ශබ්දය හා එක්ව සිටි ගාම ශබ්දයෙන් ප්‍රති
යොගී නිගම ශබ්දාර්ථාවශිෂ්ට ග්‍රාම නගරද්වයයම වාච්‍යවන
බව පැහැදිලි වේ. එහෙයින් අට්ඨකථායෙහි (51) "ගාමග්ගහ
ණෙන චෙත්ථ නගරම්පි ගහිතමෙව හොති" යනුවෙන් "නග
රය" ගාමශබ්දාභිධෙයත්වයෙන් ගෙන වර්ණනා කරනලදී.
කෙවලව සිටි ගාම ශබ්දයෙන් නගර නිගම ග්‍රාමත්‍රයම සාමා
න්‍යයෙන් වාච්‍යවන බව පැහැදිලි වේ. එහෙයින් "ඨපෙත්වා

ගාමඤ්ච ගාමූපචාරඤ්ච" යන අවිප්‍රවාස කම්වාක්‍ය පාළි යෙහි දක්වෙන ගාම ශබ්දය (52) "එත්ථ ච නිගම නගරා නංපි ගාමෙනෙව සඞ්ගහිතා වෙදිතබ්බා" යනුවෙන්ද "ගාමා වා අරඤ්ඤා වා" යන අදින්නාදානශික්ෂාපදපාළියෙහි (53) "ඉමස්මිං සික්ඛාපදෙ නිගමොපි නගරංපි ගාමග්ග හණෙනෙව ගහිතන්ති වෙදිතබ්බං" යනුවෙන්ද අට්ඨකථා චාර්‍ය්‍යවරයන් විසින් වර්ණනා කරනලද්දේය. මෙහි "වා සද්දෙන"යි නොකියා ගාමග්ගහණෙන යනු කුමක් පිණිස කියනලද්දේදැයි කල්පනා කටයුතු. විශෙෂය නම් (54) "යං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති-ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච-ගාමා වා අරඤ්ඤා වා" යන ආදි තන්හි භික්ෂූන් වාසය කරන සංඝාරාමය ගමට ඇතුළත්වීමත් (55) "යො පන භික්ඛු සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසෙය්‍ය" යන ආදින්හි සංඝාරාමය ගමට ඇතුළත් නොවීමත් පමණකි.

ඉදින් පරවාදින් කියන්නාක්මෙන් ගාම ශබ්දයෙන් නග රය නොගැනෙන්නේ වී නම් අවිප්‍රවාස කම් වාක්‍යයෙහි නගර නිගම ව්‍යවහාරයක් නො ආ බැවින් නගර නිගම යන්හි හා ආරාමයන්හි ඒ සීමාව බැසගන්නීය කියාද අදින්නා දාන ශික්ෂාපදයෙහි "ගාමා වා අරඤ්ඤා වා" යනු පමණක් ආ හෙයින් නගර නිගමයන්හි හෝ ආරාමයන්හි අගනා වස්තු වක් පැහැර ගත්තත් පාරාජිකාවක් නැත කියාද (56) "යො පන භික්ඛු සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලෙ ගාමං පවි සෙය්‍ය" යන ශික්ෂාපදයෙහි ග්‍රාම ව්‍යවහාරය පමණක් ආ හෙයින් නුවරකට නියම්ගමකට ප්‍රවිෂ්ට වන භික්ෂූන්ට ඇව තක් නැත කියාද යන ආදි අනෙකවිධ අනිෂ්ට ප්‍රසඞ්ග පැමිණේ මෙන් මුළු විනයපිටකයම වාගේ දූෂිත වන හෙයින් එසේ නොගෙන කියනලද පෙළ අටුවානය අනුව ගාමවිනිච්ඡය තේරුම්ගෙන කොළඹනගරයෙහිද ආණ්ඩුවේ නිලධාරීන්ට ගම් වෙන්කළ හැකි බව නිසැකවම දතයුතු.

(57) "යං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති" යන ආදි උපොසථක්ඛන්ධක පාළිය අනික් පෙළ අටුවාවක් හා සසඳා ගන්ට නොදත් බැවිනුත් යුක්තායුක්ති විචාරණයෙහි නො පොහොසත් බැවිනුත් අනවශෙෂ සර්වසඞ්ග්‍රාහික වචනයයි ගෙන කියූ "අසම්මතාය සීමාය අඨපිතාය, යං විසුංගාමං උප නිස්සාය විහරති යා තස්ස විසුංගාමස්ස විසුංගාමසීමා අයං තත්ථ සමානසංවාසා එකූපොසථා" යනාදියද පරවාදීන්ගේ එක් තරා දූෂිත මාත්‍රයකි. ඒ පාළියෙ වනාහි භාග්‍යවතුන්වහන්සේ

විසින් ලොකප්‍රසිද්ධ ග්‍රාම නිගමයන්ම සඳහා වදාළා මිස පරවාදීන් කී පරිද්දෙන් සර්වසඞ්ග්‍රාහික වචනයෙක් නොවේ. ඒ බව නදීසමුද්‍ර ජාතස්සරයන්හි පිහිටි ගල්පර දූපත් ආදිය මනුෂ්‍යගොචර ස්ථානයෙහි වූ පමණින් ග්‍රාමසීමා වන බව පැවසූ අටුවා වචනයෙන්ද (58) "ගාමො නාම එකකුටිකොපි ගාමො විකුටිකොපි ගාමො" යනුවෙන් එකකුටික ග්‍රාමය වදාළ පාරාජිකා පාලියෙන්ද පැහැදිලි වන්නේය. මේ පාරාජිකා පාලියෙහි "එකකුටිකොපිගාමො"යි සාමාන්‍යයෙන් වදාළ වචනයෙන් ගොවීන්ගේ කුටිපමණක් නොවේ. මැදුම්සඟි චූල ගොසිඞ්ග සාලවන සූත්‍රයෙහි මෙන් යම් දැයපාලයෙක් අරණ්‍යයෙහි කුටියක් කොට වෙසේ නම් එබඳු දැයපාල කුටියද ග්‍රාම සීමා වන බව ප්‍රකාශිතය. අදින්නාදාන විකාලෙ ගාමප්පවෙසනාදි ශික්ෂාපදයන්හි දක්වෙන ග්‍රාමග්‍රාමූපචාරයන් අතුරෙන් ග්‍රාමය පරික්ෂෙප සහිත නම් පරික්ෂෙපාභ්‍යන්තරය ග්‍රාම නම් වෙයි. පරික්ෂෙපයෙන් පිට හාත්පස ගල්පහරකින් පිරිසිඳිනාලද්දේ ග්‍රාමූපචාර නම් වෙයි. ග්‍රාමය පරික්ෂෙප රහිත නම් ග්‍රාමාන්තස්ථ ගෘහයාගේ උපචාරයෙහි සිට ගල් පහරකින් පිරිසිඳිනාලද්දේ ග්‍රාම නම් වෙයි. එහි සිට දෙවන ගල් පහරින් පිරිසිඳිනලද්දේ ග්‍රාමූපචාර නම් වෙයි කියා ගන්නාක්මෙන් මේ සීමාවිනිච්ඡය විෂයෙහි ගතයුතු නොවේ. මෙහි වනාහි "ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච" යන්නෙහි (59) "ගාමූපචාරොති පරික්ඛිත්තස්ස පරික්ඛෙපො අපරික්ඛිත්තස්ස පරික්ඛෙපොකාසො"යි අටුවා කළ බැවිනුත් වජිරබුද්ධි ටීකායෙහි (60) "ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්චාති අන්තරඝරසඞ්ඛාතං ගාමඤ්ච ගාමූපචාරඤ්ච ඨපෙත්වා කෙචි පරික්ඛිත්තං සන්ධාය ගාමං'ති වුත්තං අපරික්ඛිත්තං සන්ධාය ගාමූපචාරං'ති වදන්ති තං පන අට්ඨකථාය විරුජ්ඣති තස්මා නිවෙසනරච්ඡාදයො සන්ධාය ගාමං පරික්ඛෙපාරහට්ඨානානි සන්ධාය ගාමූපචාරං'තිච වුත්තං"යි කී හෙයිනුත් ගෙවල් වීථි ආදි ග්‍රාමාභ්‍යන්තරය ග්‍රාමයයිද පරික්ෂෙප සහිත නම් පරික්ෂෙපයද පරික්ෂෙප රහිත නම් පරික්ෂෙපාර්හ ස්ථානයද ග්‍රාමූපචාරයයි ගතයුතු. එහෙයින් දැයපාලයාගේ කිළියේ නිසවතු කෙළවරින් (පලෙන් දිය වැටෙන තැනින්) ඇතුළත ග්‍රාමයයිද එහි පරික්ෂෙපය හා පරික්ෂෙපාර්හ ස්ථානයද ග්‍රාමූපචාරයයි ගතයුතු වේ. ඒ දැයපාලයාගේ ගේ විශාල වුවත් හාත්පස අඩි 10 ක් පමණ විය හැක, කුටි පරික්ෂෙපයද හාත්පස එපමණක්ම විය හැක, ඒ අසල ඔහු පරිභොග කරන ලිං බටු මිරිස් කොරටු ආදියද ඇතිවිය හැක. එහෙත්

හාත්පස ඒ සියල්ලම එකතුකොට ගත්තත් අඩි 30 ක් පමණ විශාලවූ දෑයපාල ග්‍රාමය තුළ භික්ෂූන්ට පන්සැලක් තනා ඇසුරු කරගෙන ඉඳිමට තරම් පෙදෙසක් නොලැබිය හැකි බැවින් පරවාදීන්ගේ මතයේ හැටියට ඒ දෑයපාලයාගේ එක කුටික ග්‍රාමය ග්‍රාමයෙක් නොවන්නේය යන අනිෂ්ට ප්‍රසඞ්ගය පැමිණේ. එහෙයින් "යං ගාමං වා නිගමං වා" යන ආදි පාළිය අනවශෙෂ සර්වසඞ්ග්‍රාහික වචනයක් නොව ලෝක ප්‍රසිද්ධ ග්‍රාම නිගමයන්ම සඳහා වදාරන ලද්දක් බව පැහැදිලි වේ. වැලිඳු "යං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති" යනු විනයකර්ම විෂයෙහි ආ හෙයින් විනය කර්ම පිණිස භික්ෂූහු යම් ග්‍රාමයෙක්හි වෙසෙත්ද එසේවූ ග්‍රාමයක් සඳහා මුත් පන්සැල් කිරීමෙන් හෝ භික්ෂාටනයෙන් ඇසුරු කරගනු ලබන ගමක් සඳහා නොවදාරන ලද්දේයයි ගතයුතු වේ.

පරවාදීහු ඉඳින් දෙවනු කී භික්ෂාටනයාගේ වශයෙන් භික්ෂුව එහි වසන්නකු කොට කියත් නම් භික්ෂූන් විසින් පන් සැල් කිරීමෙන් හෝ භික්ෂාටනයෙන් ඇසුරුකර නොගන්නා ලද ගම් නියම්ගම් ඒ භික්ෂූන්ට සමානසංවාස එකූපොසථ ග්‍රාම සීමා නොවිය හැකි හෙයින් එබඳු ගමක කිසි විනයකර්මයක් නොකොට යුතුය යන අනිෂ්ට ප්‍රසඞ්ගය පැමිණෙන්නේය.*

"ගාමසීමා" යනුද "ගාමස්ස සීමා ගාමසීමා" යි විග්‍රහ කොට සීමාව සමග ග්‍රාමපරිච්ඡේදය හෝ සීමාවක් නැතත් යට කී නයින් මනුෂ්‍යපචාරයෙහි වීමෙන් මනුෂ්‍යයන් විසින් ග්‍රාමයයි සම්මත ප්‍රදේශය හෝ ගතයුතු. මේ තත්පුරුෂ සමාසය වෛයාකරණයන් විසින් අජහත් ස්වාර්ථවෘත්තික යයි කියනු ලැබේ. "අජහමානානි පදානි සකත්ථං යස්සා සා අජහමාන සකත්ථා සාච සා වුත්ති චාති අජහමාන සකත්ථ වුත්ති"යි විග්‍රහ කරනු. විමති විනෝදනී විනයාලඞ්කාර ටීකාචාර්‍ය්‍යවරයෝ මේ විග්‍රහය පෙළට ගැලපෙන නමුත් අළු දුර්බෝධ හෙයින්:

(61) "අත්ථංහි නාථො සරණං අවොච නබ්‍යඤ්ජනං
ලොකහිතො මහෙසි
තස්මා අකත්වා රතිමක්ඛරෙසු අත්ථෙ නිවෙසෙය්‍ය
මතිං මුතිමා."

* අටුවාවෙහි එක කිළියක් ඇති ගමුත් තුබුණු බවට නිදසුන් විසින් "සෙය්‍යථාපි මලය ජනපදෙ" යි ආධාර වශයෙන් දක්වූ මුළු මලය ජනපදයෙහිම තුබුණේ එක කිළියකැ යනු පරවාදීන්ගේ අරුම තේරුමකි.

යන අට්ඨකථාචාර්‍ය්‍ය අනුශාසනය මෙනෙහි කොට "ගාමො එව සීමා ගාමසීමා"යි අවබෝධ පහසුව පිණිස විශේෂණ සමාස කොට දක්වූහ. එහෙයින් විමතිවිනෝදනී ටීකායෙහි (62)"යා තස්ස ගාමස්ස වා ගාමසීමා'ති එත්ථ ගාමපරික්ඛෙපස්ස අන්තො ච බහි ච ඛෙත්තවත්ථුඅරඤ්ඤපබ්බතාදිකං සබ්බං ගාමක්ඛෙත්තං සන්ධාය ගාමස්සා'ති වුත්තං න අන්තරඝරමෙව තස්මා තස්ස සකලස්ස ගාමක්ඛෙත්තස්ස සම්බන්ධනීයා ගාමසීමා'ති එවමත්ථො වෙදිතබ්බො. යොහි සො අන්තරඝරඛෙත්තාදීසු අනෙකෙසු භූමිභාගෙසු ගාමොති එකත්තෙන ලොකජනෙහි පඤ්ඤත්තො ගාමවොහාරො සො'ව ඉධගාමසීමා'තිපි වුච්චති'ති අධිප්පායො ගාමො එව හි ගාමසීමා"යි කීහ. ලිපිය දික්වන බැවින් විනයාලඞ්කාර පාඨය නොදක්වීමු. එහෙයින් "භික්ෂූන් විසින් ඇසුරුකොට ගෙන විසීමට තරම්වූ ගෙවල් ගේන් කුඹුරු වතු පිටි වලින් යුක්තවූ ප්‍රදෙශයක්ම ග්‍රාමසීමා වන්නියැ" යන පරවාදීන්ගේ කීම මුඛාරූඪමාත්‍රයක්වැ බැහැරලිය යුතු.

සමහරු "උතුරු කොට ගේන, දකුණු කොට ගේන" යන ආදීන් මෙන් ලොකයා අතර ප්‍රසිද්ධියට පැමිණි කල්හිම විසුංගාම වන බව කියත්. එයින් ඔවුන් ග්‍රාමික බාල ජනයාගේ දැනීම ප්‍රමාණකොට ගන්නාවුන් බව පෙනේ. ඔවුන්ගේ කීමේ හැටියට නම් යට දක්වූ පරිද්දෙන් නදී සමුද්‍ර ජාතස්සරයන්හි පිහිටි ගල්පර දූපත් කොරටු මහජනයා තුළ ග්‍රාමය කියා ව්‍යවහාරයක් නැතිහෙයින් ඒවා ග්‍රාමසීමා විය නොහෙනු පමණක් නොව රජුන් විසින් බිම් ලෙඛණයෙහි ආරොපණය කොට නොපිරිසිඳිනලද ගමකින් කොටසක් මහජන ව්‍යවහාරයෙන් වෙනස් ව්‍යවහාරයට පමුණුවාගත් පමණින්ද විසුංගාමයෙක් විය යුතුය. එසේම මුලදී කුඩාවට පිහිටි ගම් දෙකක් පිළිවෙළින් දියුණුවී අවුත් පසුව ආණ්ඩුවේ බිම්ලෙඛණයෙහි එක ගමක් වශයෙන් ලියා පදිඤ්චිකොට එක ග්‍රාමභොජකයකු යටතේ පාලනයට පමුණුවන ලදුවත් ගම්වැස්සන් විසින් ආදි පටන් ව්‍යවහාර කරගෙන ආ පිළිවෙළින්ම ගම් දෙකක් වියයුතු වේ. කරුණු මෙසේ හෙයින් ග්‍රාමික බාල ජනයාගේ ගම් දෙකක් කොට දැනීම හෝ නොදැනීමද එසේම ආණ්ඩුවෙන් බදු අයකිරීම හෝ නොකිරීමද බිම් ප්‍රමාණයේ කුඩා මහත් කමද ප්‍රමාණ නොවේ. භූදෙක් රාජපණ්ණයයි කියනලද බිම් ලෙඛණයෙහි ලියා පදිඤ්චිකොට ආණ්ඩුවෙන් වෙන්කර දුන් පමණින්ම විසුංගාම වන්නේයයි නිශ්ශඞ්කීවම දතයුතු, මෙසේ කියනලද කරුණු ආචාර්‍ය්‍ය පරම්පරාගත

විනිශ්චය වශයෙන් මොනවට උගත් විනයධරයන් විසින් සංඝයාගේ අධිකත්වය නිසා ශුද්ධිය දුෂ්කරවූ බුරුම රාමඤ්ඤ දෙරටම මහා නගරයන්හි බොහෝ දීර්ඝ කාලයක පටන් මේ වනතෙක් විසුංගාම කරවා සීමාසම්මත කරගෙන එන බව පෙනේ. ඒ බව මීට අවුරුදු 460 ට පමණ පෙර ලියනලද කල්‍යාණි ශිලාලේඛණවලින්ද පැහැදිලි වේ.

මේ විසුංගාමසීමා බුරුම රාමඤ්ඤ රටවල පමණක් නොවේ. මේ ලක්දිවද මීට අවුරුදු 470 ට පමණ පූර්වයෙහි සම්මත කළ බව ආචාර්ය්‍ය ජප්පටාභිධාන සද්ධම්ම ජෝතිපාල මහා ස්වාමීන් විසින් රචනාකරනලද–

1. අභිධම්මත්ථසඞ්ගහ සඞ්ඛෙප වණ්ණනා
2. කච්චායන සුත්ත නිද්දෙස
3. සීමාලඞ්කාර විනය ටීකාවසානයන්හි

(63) පුණ්ණෙ දසෙ නවනවුති ගුණෙච (990) වස්සෙ
වස්සෙ සහස්සගණනෙ (1000) ජිනනිබ්බුතම්හා,
ඉද්ධාරිමද්දනපුරා වරතම්බපණ්ණිං
පත්වාන යො සිරිපරක්කමබාහුභූපං.

නිස්සාය සාසනමලං සුවිසොධයිත්වා
භික්ඛූහි ඤාතවිනයෙහි සුසඤ්ඤතෙහි,
බන්ධාපයී පුරවරෙ ජයවඩ්ඪනව්හෙ
සීමං විපත්තිරහිතං විනයානුරූපං.

යන නිගමන ගාථාවෙන් ප්‍රකාශ වේ. 1, 2 වෙනි අඞ්ක දරණ පොත් සිංහල අක්ෂරෙන්ද මුද්‍රණයට පමුණුවා ප්‍රසිද්ධ වී තිබේ. බු: ව: 1990. ක්‍රි: ව: 1455 වැන්නෙහි බුරුමරට අරිමද්දන රාජධානියෙන් ලඞ්කාවීපයට පැමිණි ශ්‍රී පරාක්‍රමබාහු රජතුමන් සභායකොට ගෙන මොනවට ශාසනමලය විශෝධනය කොට විනය දත් සුසංයත භික්ෂූන් ලවා තමන්ගේ ප්‍රධානත්වයෙන් ජයවර්ධන නම් පුරප්‍රවරයෙහි (කෝට්ටේ නුවර) විනයානුකූලවූ විපත්ති රහිත සීමාවක් සම්මතකරවී යනු එහි භාවයයි. එවකට කෝට්ටේනුවර බොහෝ භික්ෂූන් ගෙන් ආකීර්ණ සමාකීර්ණවූ දුර්විශොධනීය රාජධානියක්වූ හෙයින් විසුංගාමසීමාවක් මුත් අන් අන්දමකින් එහි නිරාශඞ්ක සීමාසම්මතයකට අවකාශ නොතිබුණු බැවින් ඒ බන්දවන ලද්දේ විසුංගාමසීමාවක්ම බව පැහැදිලි වේ. මේ ග්‍රන්ථ කර්තෘ වර ජප්පටාභිධාන ස්වාමිපාදයෝ මුම්මථෙරවංස ග්‍රන්ථකර්තෘ

වංස දෙක්හිම ප්‍රසිද්ධයට පැමිණි පණ්ඩිත මහා ස්ථවිරොත්තම යෙකි. කල්‍යාණී ශිලාලිපිවල දැක්වෙන ජපපට ස්ථවිර වනාහි අන්‍යතර ස්ථවිරතුමෙකි.

බුරුමරට ශාසනය සුවර්ණභූමියෙන් ගෙනගිය බව ඇත්තකි. එහෙත් මෙයින් අවුරුදු 460 පමණේදී රාමඤ්ඤ රට ධම්මචෙතිය රජු විසින් මුලින් තිබුණු ශාසනය ලොප්කොට අලුතෙන් පිහිටුවනලද ශාසනයටත් ඒ රජතුමාගේම මත පරිද්දෙන් සම්මත කරවනලද කල්‍යාණී සීමාවටත් බුරුම රට ශාසනයාගේ කිසි සම්බන්ධකමක් නැත්තේය. ඒ දම්සෑ රජුන් කලම මේ ලක්දිවටද පැමිණ සීමා සම්මත කළ ජපපටාභිධාන මහා ස්ථවිරයන්වහන්සේ බුරුමරට එව කට ජීවත්ව සිටි බවද මණිසාර මඤ්ජූසා මණිදීපාදී ප්‍රශස්ත ග්‍රන්ථයන්ගේ කර්තෘවූ ආචාර්ය ආර්යවංශ ස්ථවිරාදී තුන් සියයක් පමණ ත්‍රිපිටකධාරී මහා ස්ථවිරයන්ගෙන් ශොභා මත්වූ රතනපූර රාජධානිය ප්‍රමුඛකොට ඇති මුළු බුරුමරටම වාගේ ඒ කාලයෙහි කාශාවච්ඡත්‍රයෙන් බැබලුණු බවද බුරුම රාජවංශයෙහි කියනලදී.

සැදැහැ මඳවූ ඇතැම් රජුන් විසින් බිම් නැතිවන්නාහුයයි සලකා රාජපණ්ණයෙහි ආරොපණයෙන් ගම් විසුංකොට නොදෙනලදින් ඇතැම් තෙරුන්වහන්සේලා විසින් භික්ෂූන් ගේ අනුමතයෙන් භූමිලෙඛණයට ආරොපණය නොකොට තාවකාලික වශයෙන් රජුන් විසින් අවකාශ දෙනලද බිම් පෙදෙස් වුවත් විසුංගාමයයි සිතා එවැනි විසුංගාම යන්හි සීමා සමූහන සම්මුති කර්ම කරනලදින් (64) "කෙවලං භික්ඛූනං අනුමතියා තාවකාලිකවසෙනෙව ඔකාසං කරොති" යනාදීන් විනයාලඞ්කාර ටීකායෙහි ඒ තෙරුන්වහන්සේ ලාගේ මතම කෙව්වාද අපරෙවාද කොට දැක්වූ පමණිමුත් පෘථිවීශ්වරවූ රජුන් විසින් හෝ රජ අණ ලත් ඇමතියන් විසින් රාජපණ්ණයෙහි ආරොපණයෙන් විසුංකොට දෙනලද භූමිප්‍රදෙශ විසුංගාම නොවන බවක් දක්වා නැත්තේය. එහෙයින් "මේ කාරණයෙහිදී" යනාදියෙන් පටන්ගෙන සුපෙසල ශික්ෂාකාමී බුරුම මහා පණ්ඩිතොත්තමයන් වහන් සේලා කෙරෙහි පවරනලද දෙස් සියල්ලක් පරවාදීන්ගේම අමූලික අත්‍යුක්ත්‍යංසනා පරවම්භන ධූමිත සම්ප්‍රලාප මාත්‍ර යකි. ඒ එසේමය. විනයාලඞ්කාර ටීකායෙහිම (65) "යදි පන පකති ගාමසීමා අතිවිත්ථාරා හොති නිගමසීමා නගරසීමා වා හොන්ති බහූනං භික්ඛූනං නිසීදනට්ඨානසඤ්චරණට්ඨාන තතො සොධෙතුං රක්ඛිතුං වා නසක්කොන්ති එවඤ්චසති පඨ

විසසරරජ්ජුහි පරිච්ඡින්නාය විසුංගාමසීමාය සුට්ඨු සොධෙත්වා
සුරක්ඛිතං කත්වා සීමාසමූහනසම්මුතිකම්මං කාතබ්බං" යනු
වෙත් බොහෝ සඞ්ඝාරාමයන්ගෙන් හා දිශාසඤ්චාරක
භික්ෂූන්ගෙන් ගහනව ශුද්ධිය දුෂ්කරවූ මහා ග්‍රාමයක් හෝ
රාජධානියක් වී නම් එහි ප්‍රෘථිවීශ්වර භූපාලයන්ගේ අණින්
පිරිසිඳිනලද විසුංගාමය ශුද්ධකොට සීමාසමූහනසම්මුතිකර්මය
කටයුතු බව කියනලදි. එහෙයින් මේ විනයාලඞ්කාර ටීකා
පාඨයෙන් අදහස් කරනලද්දේ කියනලද ආකාර භික්ෂූන්
ගෙන් ගහනව ශොධනය දුෂ්කරවූ මහා ග්‍රාමයක් හෝ රාජධානි
යක් වී නම් එය හැරදමා පසල් ගමකට ගොස් සීමාසම්මත
කිරීම නොවේ. එහිම ගිහියෙකුගේ නමින් ඉල්වා රාජපණ්ණ
යෙහි ආරොපණය කොට රජ අණින් පිරිසිඳවා ගන්නාලද
විසුංගාමයෙක්හි සීමා සම්මුතිය කටයුතු බවයි.

තවද ලෝසසුන් දෙක්හිම ඉතා ප්‍රකටවූ දැනග්‍රහණ
මාත්‍රයවත් නොදත් පරවාදී(65)"සාච රාජිච්ඡාවසෙන පරිවත්තෙ
ත්වා සමුප්පන්නා අභිනවාච ඉතරා අපරිවත්තා පකතිසීමාච"
යන විමතිවිනොදනී ටීකාපාඨයෙහි "රාජිච්ඡාවසෙන" යන්
නෙන් රජුන් විසින් බදු අයකරගන්නා අටියෙන් ගම් පිරි
සිඳීමම අදහස් කරන ලද්දේයයි කියයි. එහෙත් ඒ දුර්මතය
බැහැර ලා ටීකාචාරීන්වහන්සේ විසින් එයින් ගම් බෙදා
වෙන්කිරීමට හා එක්කිරීමට අණ නොලත් පහත් මුලාදෑනීන්
විසින් අත්ලස් ගැනීමෙන් වෙන්කරනලද හෝ ගම්මුන් සිය
කැමැත්තෙන් වෙන්කරනලද හෝ එක මහා ග්‍රාමක්ෂෙත්‍ර
යක් තුළ අලුතෙන් පිහිටුවාගන්නාලද හෝ ග්‍රාමයක් වුවත්
රාජපණ්ණයට නගා වෙනම ගමක් වශයෙන් රාජෙච්ඡායෙන්
වෙන්නොකළතාක් එය වෙනම ගමක් නොවන බවම දක්
වන ලද්දේයයි ගතයුතු.

(66) "එත්තකකරීසමත්තො පදෙසො පුරිමගාමතො
විසුංගාමො හොතූති" යන විනයාලඞ්කාර ටීකාපාඨයෙහි එන
"එත්තකකරීසමත්තො" යන්නෙහි එල්බගෙන විසුංගාමය
යටත්පිරිසෙයින් සතරමුණක් වපසරියැති බිම්පෙදෙසක විය
යුතුය යනුද පරවාදීන්ගේ යුක්තිරහිත කීමකි. මේ "එත්තක
කරීසමත්තො" යනු ලෝසසුන් දෙක්හිම ප්‍රකටවූ එක් කිරියක්
පමණ දෙකිරියක් පමණ යනාදී වශයෙන් ව්‍යවහාරවන
ලක්ෂණදීපක වචන මාත්‍රයකි. ඉදින් ඔවුන්ගේ මත පරිද්
දෙන් වී නම් යට දක්වනලද පෙළ අටුවාපාඨයන් හා විරුද්ධවනු
පමණක් නොව කරීෂ ප්‍රමාණය අවිනිශ්චිත හෙයින් අනෙක

ශංසයොතපත්තියට හෙතුවීමෙන් ටීකාවචනයද බැහැරලිය යුතු වේ. ඒ එසේමය. පාලි නිඝණ්ටුවෙහි "කරීසං චතුරම්මණං"යි කී හෙයින් සතරමුණක් වපසරියැති බිම් පෙදෙසක් කිරියෙක් වෙයි. "එකාදසදෙණාතු අම්මණං"යි එහිම කී හෙයින් අමුණක් එකොළොස් ද්‍රෝණයෙක්වැ ඒ කිරිය ද්‍රෝණ 44ක් වියයුතු. මේ පාලි නිඝණ්ටුකාර ආචාර්‍ය්‍ය මෞද්ගල්‍යායන ස්ථවිර මතයි. "වීකුම්භං සකටං, කුම්භො පන දසම්මණානි වදන්ති" යනු මහාපරිනිබ්බාන සූත්‍රටීකායෙහිද, "සකටසහස්සමත්තානීති වාහසහස්සමත්තං, වාහො පන වීසති බාරී, බාරී සොළස දෙණමත්තා, දෙණං සොළසනාළියො වෙදිතබ්බා කුම්භං දසම්මණානි සහස්සනාළියොති කෙචි" යනු ජනවසභසූත්‍ර ටීකායෙහිද, කී හෙයින් විකුම්භයක් වාහයකට (යාලකට) සමවැ එක් කුම්භයෙක් දශබාරියකට සමවේ. එක කුම්භයක් දසමුණෙක්වැ අමුණක් බාරියකටද සමවේ. එහෙයින් ආචාර්‍ය්‍ය ධම්පාල ස්ථවිර මතයේ හැටියට කිරියක් ද්‍රෝණ 64 ක වපසරියැති බිම් පෙදෙසෙක් වියයුතු මේ වාදය මතු දක්වන අට්ඨකථාවන් හා සංසන්දනය වන්නේය. ඒ එසේමය. (67) "තෙසු ඛත්තියමහාසාලා නාම යෙසං කොටිසතම්පි කොටිසහස්සම්පි ධනං නිඛණිත්වා ඨපිතං දිවසපරිබ්බයො එකං කහාපණසකටං නිගච්ඡති සායං,වෙ පවිසන්ති. බ්‍රාහ්මණමහාසාලා නාම යෙසං අසීතිකොටිධනං නිහිතං හොති දිවසපරිබ්බයො එකො කහාපණකුම්භො නිගච්ඡති සායං එකසකටං පවිසති" යන මහාපරිනිර්වාණ සූත්‍රාට්ඨකථාවත් (68) "යස්ස පන ගෙහෙ පච්ඡිමන්තෙන අසීතිකොටිධනං නිධානගතං හොති කහාපණනාළිව දසම්මණානි දිවසවලඤ්ජො නික්ඛමති අයං බ්‍රාහ්මණමහාසාලො නාම යස්ස පන ගෙහෙ කොටිසතධනං නිධානගතං හොති. කහාපණනාළිව වීසතිඅම්මණානි දිවසවලඤ්ජො නික්ඛමති. අයං ඛත්තියමහාසාලො නාම" යන ධම්මහදයවිභඞ්ගාට්ඨකථාවත් සමග සසඳාලූ කල්හි එකසකටයක් විසි අමුණකටද එක් කුම්භයක් දසමුණකටද සමාන බැව් පෙනේ. සුත්තනිපාත, සගාථාවග්ගබ්‍රහ්මසංයුත්ත, දසඞ්ගුත්තරථෙරවග්ගාගත කොකාලික සූත්‍රාට්ඨකථාවන්හි "තිලවාහොති තිලසකටං"යි වර්ණිත හෙයින්ද නිඝණ්ටුවෙහි "වාහොතු සකටො" යනු කී හෙයින්ද වාහසකටවය පර්‍ය්‍යාය ශබ්දයි. "බාරියො වීස වාහො" යනුද එහිම කී හෙයින් බාරිවිස්සෙක් එක් වාහයෙක් වෙයි. එසේ වූ කල්හි බාරි විස්සට අමුණු විස්ස සමාන වේ. එහෙයින් මේ ආචාර්‍ය්‍ය ධම්පාල ස්ථවිරවාදය යථොක්ත අට්ඨකථා

වත් හා සංසන්දනය වන්නේයයි දතයුතු. ආචාර්ය අනන්ද ස්ථවිරස්වාමිපාදයෝ වනාහි ධම්මහදයවිභඞ්ගමූලටීකාවෙහි "චතුදොණං අම්මණං ච දොණානි එකො"යි කීහ. එහෙයින් උන්වහන්සේගේ මතයේ හැටියට කිරියක් ද්‍රෝණ 16 ක වපසරියැති බිම් පෙදෙසක් වියයුතු. එහිම දක්වෙන එකො ආචාර්යමතයේ හැටියට කිරියක් ද්‍රෝණ 24 ක වපසරියැති බිම් පෙදෙසක් වියයුතු. ශ්‍රී භාවමිශ්‍රයන් විසින් භාවප්‍රකාශ නම් වෛද්‍ය ග්‍රන්ථයෙහි :-

"චතුර්භිරාඪකෛර්ද්‍රෝණඃ-කලශෝනල්වණෝන්මිණඃ
උන්මානශ්ච ඝටෝරාශිර්-ද්‍රෝණපර්‍යාය සංඥිතඃ"

යනුවෙන් අම්මණය ද්‍රෝණපර්‍යාය වශයෙන් ගෙන කී හෙයින් තන්මතයෙන් කිරිය ද්‍රෝණ 4 ක වපසරියැති බිම් පෙදෙසක් වියයුතු. (69)"අම්හාකං භගවතො සුදත්තො ගහපති අට්ඨකරීසප්පමාණං භූමිං කහාපණසන්ථාරෙන කිණිත්වා විහාරං කාරාපෙසි" යනුවෙන් සෙනාසනක්ඛන්ධක සමන්තපාසාදිකා විනයට්ඨකථාවෙහි ජෙතවනාරාම භූමිය අටකිරියක් පමණ විශාල බව කියනලදී. කකුසඳ බුදුන් කල ගව්වක් (ඉස්බ 80ක්) ද කොණාගම බුදුන් කල අඩගව්වක් (ඉස්බ 40ක්) ද කසුප් බුදුන් කල ඉස්බ 20ක්ද අප බුදුන් කල කිරිය 8 ක් දැයි මෙසේ අඩියෙන් අඩිය අඩුකොට කී අටුවාව හා සසඳාගත් කල්හි ඒ අටකිරිය 10 ඉස්බකට හෝ 8 ඉස්බකට සමානවූ ප්‍රදෙශයක් බව පැහැදිලි වේ.

(70) "ද්වාදසඞ්ගුලා විදත්ථි තා දුවෙ රතනං මතං,
යට්ඨිතු තානි සත්තෙව තාවීසතුසභං මතං,
ගාවුතමුසභාසීති යොජනං චතුගාවුතං" යි.

කී හෙයින් ඉස්බක්ද සත් රියන් යටියෙන් යටි 20ක් වේ. එහෙයින් එක් කිරියෙක ප්‍රමාණය සත්රියන් යටියෙන් යටි 20 ක් හා රියන් 140 ක් වන බව දතයුතු. මේ ප්‍රමාණය වනාහි දැනට පෙණෙන්ට තිබෙන ජේතවනාරාම භූමිය හා සමවන්නේයයි හඟිමු. ඉන්දියාවේ පුරාණ වස්තු පරීක්ෂකයන්ගේ බිම් සිතුයම් පොත් සමගද සසඳා බැලිය යුතු.

මෙසේ කරීෂ ප්‍රමාණයාගේ නියම විනිශ්චයක් නැති හෙයිනුත් "එත්තක කරීසමත්තා" යන්න යට කී ලෙස ලක්ෂණදීපක වචන මාත්‍රයක් බවම පැහැදිලි වේ. "රාජා කස්සචි දෙති" යන්නෙහි රාජ ශබ්දයෙන් යම් රටක් පෘථිවීශ්වර රජෙක් අනුශාසනා කෙරේ නම් ඒ පෘථිවීශ්වර රජද

යම් රටක් පෘථිවීශ්වර රජහු විසින් පාවාදෙනලද්දුව මහාමාත්‍යාදීහු අනුශාසනා කෙරෙත් නම් ඒ මහාමාත්‍යාදීන්ද ගැනෙනන බව සැලකිය යුතු. එහෙයින් විමතිවිනොදනී විනයාලඞ්කාර ටීකාවන්හි (71) "රාජාදීහි පරිච්ඡින්නභූමිභාගො–පෙ–ගාමසීමාති වෙදිතබ්බා" යනු කියනලදී. පෘථිවීශ්වර රජුන්ට මෙන් ගම් බෙදා වෙන්කිරීමට සහ එක්කිරීමට පිළිවන් සමිති හා ඇමැති ආදීන් ඇති බව "තෙපිම ගම් නියම්ගම් අනුශාසනා කරව්" යයි රජුන් විසින් ඒ ඒ ගම් නියම්ගම් පාවාදෙනුලබන බව ප්‍රකාශවෙන (72) "රාජා නාම යත්‍ථ රාජා අනුසාසති රාජා අපලොකෙතබ්බො–පෙ–ගණො නාම යත්‍ථ ගණො අනුසාසති ගණො අපලොකෙතබ්බො" යනුවෙන් භික්ඛුණී විභඞ්ගපාළියෙහිද (73) "ගණංවාති මල්ලගණභටිපුත්තගණාදිකං, පූගන්ති ගණබම්මං, සෙණීන්ති ගන්ධිකසෙණි දුස්සිකසෙණි ආදිකං, යත්‍ථ යත්‍ථහි රාජානො ගණාදීනං ගාමනිගමෙ නිය්‍යාතෙන්ති තුම්හෙව එත්‍ථ අනුසාසථාති තත්‍ථ තත්‍ථ තෙ එව ඉස්සරා හොන්ති තස්මා තෙ සන්ධාය ඉදං වුත්තං" යනුවෙන් තදට්ඨකථායෙහිද දක්වනලදී. මේ පෙළ අටුවා වෙඟරානුශාසන විෂයෙහි ආ නමුත් (74) "යත්‍ථ යත්‍ථ හි රාජානො ගණාදීනං ගාමනිගමෙ නිය්‍යාතෙන්ති තුම්හෙව එත්‍ථ අනුසාසථාති තත්‍ථ තත්‍ථ තෙ එව ඉස්සරා හොන්ති" යි ගම් නියම්ගම් පාවාදෙන වචනයෙහිම ඉම්ලකුණින් අයබද්දෙන් ගම් බෙදා වෙන් කරන ආකාරයද ඇතුළත්ව ආ හෙයින් මෙහි සාධකකොට දැක්වීමු. ඒ එසේමය. මෙහි ආ අනුසාසනය යනු වෙඟරානුශාසනයෙහිම නොවේ, ගම් බෙදා වෙන්කිරීම් ආදි නිරවශෙෂ රාජ්‍යානුශාසනයෙහිම ව්‍යවහාරයට පැමිණි වචනයෙකි. එහෙයින් පකිණ්ණකනිපාත සාධීන ජාතකයෙහි සාධීන රජතුමා තව්තිසා දෙව්ලොව මිනිස් ගණනින් හවුරුදු 700 ක් ගෙවා නැවත මේ මිනිස්ලොවට පැමිණි කල රාජ්‍යානුශාසනය කරමින් සිටි 7 වෙනි මුණුපුරු රජහු විසින් රාජ්‍යය පාවාදීමේදී (75) "ඉදං වො අත්තනො සන්තකං රජ්ජං අනුසාස" යනුවෙන්ද සත්තතිනිපාත කුසජාතකයෙහි කුසරජතුමා මෑණියන්ට රාජ්‍යය පාවාදීමේදී (76) "මාතුසන්තිකං ගන්ත්වා අම්ම අහං පභාවතිං අනෙස්සාමි තුම්හෙ රජ්ජං අනුසාසථාති වදන්තො පඨමං ගාථමාහ :–

"ඉදං තෙ රට්ඨං සධනං සයොග්ගං
සකායුරං සබ්බකාමූපපන්නං,
ඉදං තෙ රජ්ජං අනුසාස අම්ම
ගච්ඡාමහං යත්‍ථ පියා පභාවතී" ති.

තත් සංයොගනාති හත්ථියොගාදිසහිතං, සකාසුරනති සපක්ඛචරාජකකුදභණ්ඩං, අනුසාස අම්මාති සො කිර පුරිසස්ස රජ්ජං දත්වා පුන ගහණං නාම නයුත්තන්ති පිතුවා භාතුවා අනියාතෙත්වා මාතු නියාතෙන්තො එවමාහ" යනුවෙන්ද දීඝනිකායේ පාථෙය්‍යවග්ග චක්කවත්ති සුත්තාදියෙහි සක්විති රජ්ජුරුවන් පැමිණි පැමිණි රාජ්‍යයන්හි රජවරු රාජ්‍යය පාවාදීමේදී (77) "යං ඛො පන භික්ඛවෙ පුරත්ථිමාය දිසාය පටිරාජානො තෙ රාජා නං චක්කවත්තිං උපසඞ්කමිත්වා එවමාහංසු එහි ඛො මහාරාජ ස්වාගතං තෙ මහාරාජ සකං තෙ මහාරාජ අනුසාස මහාරාජ" යනුවෙන්ද "අනුසාස" යන අභිලාපයම අවුත් තිබේ. මෙසේ පෙළ අටුවාවල සෘජුවම දක්නට තිබෙන හෙයින්ද යට දැක්වූ ටීකාවන්හි "රාජාදිහි" යි ආදි ශබ්ද සමග පැවසූ හෙයින්ද පෘථිවීශ්වර රජුන්ගෙන් අණ ලත් ගණමහාමාත්‍යාදීන්ටද ගම් බෙදා වෙන්කිරීම් ආදි රාජ්‍යානුශාසනය කටහැකි බව පැහැදිලි වන්නේය. එහෙසින් "පඨවිස්සරො රාජා" යන්නෙහි එල්බගෙන "විසුංගාමය වෙන්කොට දෙන රජහුද පඨවිමණ්ඩලයකට අධිපතිවූ බිම් හිමි රජෙක් වියයුතු බවත් මහරජුන් යටතේ ආණ්ඩුකරන ලඞ්කාණ්ඩුකාරාදීන් වැනි ඇමතියන් නොවන බවත් දතයුතුමය" යනුවෙන් පරවාදීන් විසින් පළකරවන ලද හිස්වූ ප්‍රලාපවලට ආධුනිකයෝ නොරැවටෙත්වා.

මෙසේ පවසනලද කථාමාර්ගීය වනාහි පාළි අට්ඨකථා ටීකා සාධක පාඨයන්ගෙන් ගහනව නුවණ මඳ අයට ශීඝ්‍රව තේරුම් ගැනීම දුෂ්කර වන හෙයින් ඔවුන්ගේ තේරුම් ගැනීම පහසු කරනු පිණිස සාධක පාඨ නැතිව දැන් විනිශ්චය කථාශරීරය පමණක් සංක්ෂේපයෙන් දක්වනු ලැබේ.

අබද්ධසීමාව ග්‍රාම, උදකොත්ක්ෂෙප, සප්තාභ්‍යන්තරයයි ත්‍රිවිධ වේ. අතරින් පතර පිහිටි ගෙවල් මැදින් විනිවිදගිය නොගිය මාර්ගී තුන්මං සතරමං සන්ධියයි කියනලද ග්‍රාමාභ්‍යන්තරය සමග ඒ ග්‍රාමපරිච්ඡේදයට ඇතුළත් කෙත් වත් වන පව් කඳු හෙල් ආදි ඇතිතාක් ගොඩ බිම් පෙදෙස් සියල්ලක් අගලක් පමණද නැර ග්‍රාමසීමා නම් වේ. නදී සමුද්‍ර ජාතස්සරාදීන් තුළ මධ්‍යම පුරුෂයාගේ උදකොත්ක්ෂෙපයෙන් පිරිසිඳිනලද ප්‍රදේශය උදකොත්ක්ෂෙපසීමා නම් වේ. ග්‍රාම නගර පරිච්ඡේදයට ඇතුළත්නොවූ මනුෂ්‍යගොචර මනුෂ්‍ය ප්‍රචාරයෙන් පිටත අරණ්‍යයෙහි සත් අබ්තුරකින් පිරිසිඳින ලද ප්‍රදේශය සත්තබ්භන්තර සීමා නම් වේ. මේ සත්තබ්භ

නතර සීමාවට විෂයවූ අරණ්‍යය වනාහි අභිධම්මයෙහි මෙන් ඉන්ද්‍රඛීලයෙන්ද අදින්නාදාන ශික්‍ෂාපදයෙහි මෙන් ග්‍රාමොපචාරයෙන්ද අරණ්‍යක ශික්‍ෂාපදයෙහි මෙන් දුනු පන්සියයකින්ද පිරිසිඳියයුතු නොවේ. ඒ එසේමය. ශාලිව්‍රීහි මුද්ගමාෂාද්ධාන්‍යයන් ගොවිතැන් කරන මනුෂ්‍යගොචර මනුෂ්‍යොපචාරයන් තුළ නොහොත් රාජපණ්ණයට ආරොපණය කරනලද ග්‍රාමක්‍ෂෙත්‍රයන් තුළ වීනම් දුනු පන්සියයකින් තබා දුනු දහසකින් ඈත්වූ අරණ්‍යයක් වූවත් එහි සත්තබ්භන්තර සීමාවක් නොලැබේ.

මෙසේ කියනලද පරිද්දෙන් ගාමසීමාදී ත්‍රිවිධ සීමාවන් අතුරෙන් කොළඹනගරය තුළ ඇතිතාක් ගොඩ බිම්පෙදෙස් සියල්ලක් ග්‍රාමසීමා බවට පැමිණ තිබෙන ආකාරය දතයුතු. එහි තුළ ග්‍රාමසීමා නොවන අගලක් පමණ බිම් පෙදෙසකුදු කිසිම කෙනෙකුටවත් පෙන්විය හැකි නොවේ. කුමක් හෙයින්ද යත්? බුදුන් විසින්ම ග්‍රාමසීමාකොට වදාළ හෙයිනි. එහෙයින් අගලක් පමණ බිම් පෙදෙසකුදු නැර ග්‍රාමසීමාවූ කොළඹනගරය තුළ බිම් බෙදා වෙන්කරන්ටත් එක්කරන්ටත් බලයලත් නගරාධිපති නිලධාරීන්ට උවමනා වූ විටක යම් යම් අයට බිම් පෙදෙස් බෙදා වෙන්කර දිය හැක්කේමය. එසේ බෙදා වෙන්කර දියහැකි වීමද පෘථිවීශ්වර බලයෙන්මය. මෙහිද ආණ්ඩුවට බිම් බෙදා වෙන් නොකොට හැක කියා කිසිවකුටද කියහැකි නොවේ.

එසේ ආණ්ඩුව රාජපණ්ණයෙහි ආරොපණයකොට ප්‍රකෘති ග්‍රාමයෙන් පෙදෙසක් බෙදා වෙන්කිරීම පාළි භාෂාවෙන් “විසුංකරණයයි” කියනු ලැබේ. ඒ විසුං ශබ්දය හා ගාමසීමා යන්න සම්බන්ධවීමෙන් සිද්ධවූ “විසුංගාමසීමා” යන්න සාමාන්‍ය දැනීමක් ඇත්තවුන්ටද අවබොධ නොවන තරම් දුෂ්කර පදාර්ථයෙක් නොවේ.

ආණ්ඩුවෙන් බෙදා වෙන්කර දීමද නිකම් රැවටිල්ලක් නොවන බව ඒ විසුංගාමසීමා භූමිය අවුරුද්දකට ලක්‍ෂයක් පමණ ආදායමක් ලැබියහැකි ගොඩනැගිල්ලකට යොග්‍යවූ ස්ථානයක් වූයේවීනමුත් එහි අයිතිකාරයන්ගේ අකැමැත්තෙන් ආණ්ඩුව කිසිවක් නොකිරීමෙන්ද, අත්හරින්ටම බැරි කටයුත්තක් වූවමනාවක් පැමිණියහොත් ඒ වෙනුවට අන් තැනක් විසුං(වෙන්)කරදී ගැනීමෙන්ද, යම්කිසි ආකාරයකින් ඒ භූමියෙන් හැඳිනීම් මාත්‍රය පවා නැතිවී ගොස් කාලාන්තරයක් ගතවී කැලෑවී ගිය කල්හිත් නැවත එය නගා සිටුවනු

කැමැත්ත ඇතිවූවිට ආණ්ඩුවේ බිම් ලේඛනය බලා ස්වකීය විසුංගාමසීමා පරිච්ඡේදය දතහැකි වීමෙන්ද, පැහැදිලි වන්නේය. යථෝක්ත ප්‍රකාර ආචාර්ය පරම්පරාගත විසුංගාම විනිච්ඡය මොනවට දැන සිටි තෙවළාධර සඞ්ඝරාජ මහාස්ථවිරයන්වහන්සේ සහිත රාජගුරු මහාස්ථවිරයන්වහන්සේලාගේ උපදෙස් ඇතිව රතනපූණ්ණ රාජධානිය ප්‍රතිෂ්ඨාපනය කොට ශාසන සංවර්ධනය කළාවූ ශ්‍රද්ධාසම්පන්න ශාසනදායක මෙංඩුං මහරජතුමා රාජධානියට පූර්වදිග්භාගයෙහි මහෙසිකා, කුමාර, කුමාරිකා, සෙනාපති ආදීන්ට රාජපණ්ණයෙහි ආරෝපනය කොට විසුංග්‍රාමයන් භොජග්‍රාමයන් කොට දීමෙන් ආරාම 16 ක් රාජධානිය සමග එක්විට පිහිටවා ඒ ආරාම රාජගුරු මහතෙරුන්වහන්සේලාට පූජාකරවා ඒවායේ වෙන වෙනම සීමාසම්මත කරවූහ. ඒ කාලයෙහි නානා නිකායික ස්ථවිරයන්වහන්සේලා බිම් පෙදෙස් කුඩා බවක් ගැන හෝ ගෙවල් නැති බවක් ගැන කිසි විවාදයක් නොකොටම ඒ විසුංගාමසීමා පිළිගත්හ.

රාමඤ්ඤ නිකාය සමුට්ඨාපක ඉන්දසභවරඤාණසාමි නායක ස්ථවිර ප්‍රමුඛ ස්ථවිරයන්වහන්සේලාද යථෝක්ත රාජධානියට පෙරදිගින් ඉතා ආසන්නව පිහිටි "මහා විසුතාරාම" නම්වූ සඞ්ඝරාජාරාමයට අයත් විසුංගාමසීමායෙහි උපසම්පදා වූවෝය. මෑතදී බුරුම රජුන් පත්කළ සඞ්ඝරාජ මහා ස්ථවිරයන්වහන්සේ ජීවත්ව සිටිද්දීම රාජගුරු මහා ස්ථවිරයන් වහන්සේලා ඉංග්‍රීසි නිලධාරීන් සම්මුඛව විචාළ කල ඔව්හු මහාරාජිනියගෙන් අණලත් නිලධාරීන් බැවින් තමන් බෙදා වෙන්කර දුන්නත් ඒ මහාරාජිනියගේම දීමක් වන බවත් බුරුම රජුන්ගේ විසුංගාම ආඥාපත්‍රයත් තමන්ගේ ආඥාපත්‍රයත් භාෂායෙන් වෙනස් වූවත් අදහසින් වෙනසක් නැති බවත් කීවෝය.

ඔවුන්ගේ ඒ කීම පාළ්‍යට්ඨකථාගත ව්‍යවහාරයට ගැළපෙණ බැවින් තෙවළාධර ඒ රාජගුරු මහතෙරුන්වහන්සේලා නිඃශඞ්කව ඒ විසුංගාමවල සීමා සම්මතද කළෝය. එහෙයින් මෙහි දක්වනලද ආගම යුක්ති නැවත නැවත නුවණින් යෙදී විමසා බලා ආචීර්ණවශයෙන් සිත්සතන්හි හැනී එන්නාවූ දුර්මත දුරින්ම දුරලා යථා ධර්මයෙහි පිහිටීම පිණිස උත්සාහ කටයුතු.

විසුංගාමසීමාවිනිච්ඡය නිමි.

කොළඹ දෙමටගොඩ මහා විසුද්ධාරාමයෙහි
සම්මත කරනලද

# ශාසන ශොභිනී සීමාව.

---

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

---

“යදා එසො ’භිසම්බොධිං–සම්පත්තො මුනිපුඞ්ගවො,
තදාප්පභුති ධම්මස්ස–ලොකෙ ජාතො මහුස්සවො”

යන සුබොධාලඞ්කාර ගාථාවෙන් දැක්වෙන පරිද්දෙන් අගාරික, අනගාරික, සෙඛ, අසෙඛ, පච්චෙක යන පඤ්චවිධ මුනින්ට පුරෙචාරී මාර්ගදෙශකවූ මේ සම්‍යක්සම්බුද්ධ දිවාකර තෙම යම් කාලෙක්හි ත්‍රෛභූමිකවෘත්ත දුඃඛපඞ්කය වියලවා ගෙවා පාරඞ්ගාමිත්වයෙන් අනාවරණඥානසඞ්ඛ්‍යාත උදයගිරි මස්තකාරූඪව උජ්ජ්වලිතවූ සේක්ද එතැන් පටන් ධර්මයාගේ මහත් අද්භූතවූ උත්සවයෙක් ඇතිවී.

ඒ එසේමය. බුද්ධාඞ්කුරවූ සුමෙධ තාපසයාණන් වහන්සේ මේ මහා භද්‍රකල්පයෙන් යට සාරමණ්ඩ නම් කල්පයෙහි දිවකුරු බුදුන් හමුයෙහි මනුෂ්‍යත්වය ආදි අෂ්ට ධර්මසමවධානයෙන් නියත විවරණ ලත්තැන් පටන් සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි දානාදි සමත්‍රිංශත් පාරමින් සපුරා තුසී දෙව්ලොව ඉපද එහි ආයු ඇතිතාක් දෙව් සැපවිඳ දසදහසක් සක්වළ දෙවි බඹුන් විසින් මේ මඟුල් සක්වළට රැස්ව කරනලද ආයාචනයෙන් කාල, ද්වීප, දෙශ, කුල, මාතෘ, පරමායු යන පස් මහ බැලුම් බලා ඉන් සැව දඹදිව කිඹුල්වත් පුර සුදොවුන් මහරජුන් නිසා මහාමායා බිසවුන් කුස පිළිසිඳගෙන දස මසක්හුගේ ඇවෑමෙන් මවුකුසින් බිහිව පිළිවෙළින් වැඩෙමින් එකුන්තිස්විය පැමිණ මහබිනික්මන් කොට එතැන් පටන් සාවුරුද්දක් මුළුල්ලෙහි දුෂ්කර ක්‍රියාකොට ඒ දුෂ්කර ක්‍රියාව බුදුවීමට උපාය නොවන බව දැන මැදුම් පිළිවෙත්හි පිළිපැද සියලු බුදුවරයන් විසින් අත්නොහරිනලද පර්‍ය්‍යඞ්ක, ධර්මචක්‍රප්‍රවර්තන, දෙවොරොහන, පරිනිර්වාණස්ථාන යන සතරින් එකක්වූ පර්‍ය්‍යඞ්ක ස්ථානය කරා එළඹ වජ්‍රාසනාරූඪව චතුරඞ්ගසමන්විත වීර්‍ය්‍ය අධිෂ්ඨාන කොට අෂ්ටාඞ්ගික මාර්ග රථයෙන් ගමන්කොට අනාවරණ

ඥානසඞ්ඛ්‍යාත උදයගිරිමස්තකාරූඪ වූසේක. ඉක්බිති මේ සම්‍යක් සම්බුද්ධ දිවාකරතෙමේ විනෙයජනයන්ගේ සිත් සතන්හි ඥානාලොකය පතුරුවා ධම්මචක්කප්පවත්තන, අනත්තලක්ඛණ සූත්‍රාදි විමුක්තිරස විසින් එකවිධවූ, ධර්මවිනය විසින් විවිධවූ, පිටක විසින් ත්‍රිවිධවූ, නිකාය විසින් පඤ්චවිධවූ, අඞ්ග විසින් නවවිධවූ, ස්කන්ධ විසින් චතුරශීති සහස්‍රවිධවූ ධර්මරශ්මීන් කරණකොටගෙන පෙර බුදුන් දවස දෙශනා ධර්මරශ්මිස්පර්ශනයෙන් කුහුල්ගති පහවූ විනෙයජනයන්ගේ ශෙෂවූ මොහඳුරු සියල්ලක් මුල්උපුටා හරිමින් කාශී රට බරණැස් නුවර ඉසිපතනාරාමයෙහි පඤ්චවර්ගිකස්ථවිර ප්‍රමුඛ දිව්‍ය බ්‍රහ්ම සමාගමය ආදි සහස්‍රාධික සඞ්ගමයන්හි ධර්මොත්සවයන් පවත්වා බොහෝ සත්ත්වයන් තමන්වහන්සේට අනුගමනය කරනසේ යොදවාලීමෙන් තදවශිෂ්ට සත්ත්වයන්ගේද තමන්වහන්සේ වෙතම පැමිණීම පිණිස "හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථ" යන පශ්චිම වචනය දක්වා දහම්රැස් පතුරුවා කාලමනා සියලුම බුදුකිස නිමවූයෙන් නිවන්පුර පැමිණ වදාළසේක. එතැන් පටන් සාධුකීළන, ධාතුපූජන, ධාතුභාජන, ප්‍රථමසඞ්ගීති, ද්විතියසඞ්ගීති, තෘතියසඞ්ගීති, රට නවයක ශාසනය පිහිටුවීම, බුදු වසින් 455 වැන්නෙහි පුස්තකාරූඪ චතුර්ථ සඞ්ගීති යන මෙතෙක් ධර්මොත්සවයන් පවත්වා ශාසනය 5000 ක් අවුරුදු මුළුල්ලෙහි පැවතීමට මග සලසාලූ ලක්දිව මලියදෙව මහරහතන්වහන්සේගෙන් හා අරිමද්දන නුවර ධම්මදස්සී මහරහතන්වහන්සේගෙන් අනතිමවූ මහොත්තමයන් වහන්සේලාද පර්‍යාප්ති ශාසනය මුඛපාඨ වශයෙන් දරාගෙන එමින් ශික්ෂාත්‍රය සඞ්ගෘහීත දෙශනා ධර්මරශ්මියෙන් සියසතන්හි මොහඳුරු සියල්ලක් මූලොත්පාටනය කොට මොක්සිරිපුර පැමිණියාහුය.

එසින් මෑතභාගයෙහි සම්බුද්ධ ශ්‍රාවකවූ විනයධර එතදග්‍ර ස්ථානාන්තරප්‍රාප්ත **උපාලි** මහරහතන්වහන්සේගේ පරපුරයෙන් පැවත ආ අරිමද්දන නුවර **ධම්මදස්සී** මහ රහතන්වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරානුයාත ආයුෂ්මත් **ගුණසාර ස්ථවිර**, උන්වහන්සේගේ ශිෂ්‍ය ආයුෂ්මත් **අග්ගපණ්ඩිත ස්ථවිර**, **අග්ගවංස**, **උත්තරාජීව**, පඨම ඡප්පද **සද්ධම්මපාල**, දුතිය ඡප්පද **ඤාණසද්ධම්ම**, තතිය ඡප්පද **ධම්මසිරි**, "කුබන්ජ්" නුවර බෙම්ඞගාරාමාධිපතිව වැඩවිසූ **සුධම්මචාරී**, ඒ නුවරම පශ්චිම උම්ඞගාරාමාධිපතිව වැඩවිසූ ආයුෂ්මත් **අග්ගධම්මාලඞ්කාර**, "තොයංහ" ග්‍රාමයෙහි වැඩවිසූ ආයුෂ්මත්

ධම්මානන්ද, "කුබන්ජි" නුවර තම්බලතාරාමාධිපතිව වැඩ විසූ ආයුෂ්මත් පුඤ්ඤවාසි, "ශේඑං" නමැති ග්‍රාමයට ආසන්නවූ අරණ්‍යායතනයෙහි වැඩවිසූ ආයුෂ්මත් ඤාණාලඞ්කාර, උන් වහන්සේගේ ශිෂ්‍ය "දබයෙං" නගරයට ආසන්නවූ "නමෝ" යන භෝගග්‍රාමයෙහි වැඩවිසූ ආයුෂ්මත් පුඤ්ඤරම්භ, උන්වහන් සේගේ ශිෂ්‍ය එහිම වැඩවිසූ ගණපාමොක්ඛාචරිය ආයුෂ්මත් විචාරින්ද, උන්වහන්සේගේ ශිෂ්‍ය "තලූං" නමැති අරණ්‍යා යතනයෙහි වැඩවිසූ ගණවිමුක්තාචාර්‍යවූ ආයුෂ්මත් චන්දිමා ලඞ්කාර, උන්වහන්සේගේ ශිෂ්‍ය ආයුෂ්මත් නන්ද, මේ චන්දිමා ලඞ්කාර නන්ද ස්ථවිර දෙනමගේ ශිෂ්‍යවූ "මෙංගුන්" අරණ්‍යා යතනයෙහි වැඩවිසූ ආයුෂ්මත් ජාගර, උන්වහන්සේගේ ශිෂ්‍ය විසුද්ධාචාර, සාසනාලඞ්කාර යන රාජගුරු මහතෙරුන්වහන් සේලා දක්වා යථොක්ත ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාගත මහාස්ථ විරයන්වහන්සේලාද සර්වඥදිවාකරයාණන්ගේ ධර්මරශ්මින් කාරණකොටගෙන සිය පරසන්තතිහි මෝහඳුර දුරලමින් වැජඹුණු උතුමෝමය. ඒ "විසුද්ධාචාර, සාසනාලඞ්කාර"මාහිමි යන් වහන්සේලාගේ ශිෂ්‍යවූ "පරියත්තිසාසනහිත ධම්මා චරිය" අග්ගධම්මාභිවංස ස්ථවිර, ආචාර්‍ය සිරිධම්ම ස්ථවිර යන දෙදෙනාවහන්සේ ප්‍රමුඛකොට ඇති මහාසඞ්ඝයාවහන්සේ විසින් ශාසනය පන්දහසක් අවුරුදු මුළුල්ලෙහි පවතිනාතුරු "කුලපුත්‍රයෝ උපසම්පදාදි විනයකර්ම කිරීමෙන් ස්වපරසන්තා නයන්හි මෝහඳුර දුරලීම පිණිස උත්සාහවත් වෙත්වා" යන සම්‍යක් ඡන්දය මුදුන්පත්කොට ගෙන සීමාවක් සම්මතකරනු කැමැත්තෙන් මධ්‍යම පලාතේ මහජන මන්ත්‍රීවූ ඩබ්ලිව්. ආර්තර් ද සිල්වා සාමදූන විනිශ්චයකාරතුමාගේ ඉල්වීම ලෙස ආණ්ඩුව ලවා ජේ. ඞී. ධර්මසේන මහතා ග්‍රාම භෝජක කොට "කොළඹ, දෙමටගොඩ" මහාවිශුද්ධාරාම විහාරස්ථානයෙහි දිගින් රියන් 33ක් හා අගල් 6ක් නොහොත් අඩි 50 ක් පුළුලින් රියන් 26 ක් හා අගල් 12 ක් නොහොත් අඩි 40 ක් පමණ ඇති බිම් පෙදෙසක් හාත්පස ඉම් ලකුණින් පිරිසිඳ රාජපණ්ණයයි කියනලද බිම් ලෙබණයෙහි ආරෝ පණයෙන් විසුංගාම කරවාගෙන එහි පුරාණ බද්ධසීමා ඇතිවිය හැකියයි සැක උපදවන ලජ්ජී ප්‍රියශීලී භික්ෂූන්ගේ ශඞ්කා විනෝදනය පිණිස සත්අට දිනක් මුළුල්ලෙහි විමති විනෝදනී ආදී විනයටීකාවන්හි ආ පරිද්දෙන් නොයෙක් සමූහන ක්‍රමවලින් සමූහනකර්මය කොට තදනන්තරව බොහෝ වාරගණනක් උච්චාරණ ශුද්ධිය ඇතිව සමාන සංවාසක කර්මවාක්‍යයද ඉක්බිති චීවර අවිප්‍රවාසය පිණිස

අවිප්‍රවාස කර්‍මවාක්‍යයද කියා සම්මතකරනලද මේ "ශාසන ශොභිනී" නම් සීමාතොමෝ බු. ව. 2467, (ක්‍රි. ව. 1923) වැන් නෙහි පොසොන් මස පුර 15 වක ලත් (මැයි මස 29) කුජ දින අපරභාග ඔලෝසු පැයින් 2-30 ට පමණ ඥප්ති විතීය කර්‍ම වාක්‍යසඞ්ඛ්‍යාත බුද්ධානුභාවයෙන් ලොකශාසන සංරක්‍ෂක දෙවියන් ඇතුළු බොහෝ දෙවිම්නිසුන් ලවා සාධුකාර පවත්වාලමින් පෘථිවිසන්ධාරක ජලස්කන්ධය දක්වා දෙලක්‍ෂ සතලිස් දහසක් යොදුන් ඝනවූ මේ මහ බොල්පොළොව විනිවිද ගොස් ප්‍රතිෂ්ඨිතවූය.

යාව තිට්ඨන්ති සුත්තන්තා–විනයො යාව දිබ්බති,
තාව දිබ්බතු'යං සීමා–චිරං සාසනසොභිනී.

යාව බුද්ධොති නාමම්පි–සම්බුද්ධස්ස පකාසති,
තාවෙ'ත්ථ උපසම්පන්නා–පෙසලා හොන්තු භික්ඛවො.

ශාසන ශොභිනී සීමාකථාව නිමි.

---

එත්තාවතාව:—

නිකායන්තරලද්ධිකෙ වීනයන්ධරමානිනො,
ථෙරියා'චරියා සබ්බෙ ජයන්ති පරවාදිනො.

නායං ථෙරියමාදාය විසුංගාමවිනිච්ඡයං,
විනයෙව නයමොගය්හ රචයන්තෙන සාධුකං.

පුඤ්ඤං උපචිතං තෙන පරවාදප්පමද්දනො,
පරිමද්දිතසඞ්ඛාරො නිබ්බාසිස්සං අනාසවො'ති.

## ගන්ථකාරානුසාසනං.

1. යො'භිඤ්ඤාතො ච බලවා, ධම්මා'ධම්මා'විචාරණෙ
අධම්මං කුරුතෙ යං තං, දිට්ඨාදිට්ඨානුගා ජනා.

2. සද්ධාය තස්මිං ගච්ඡන්ති, විසමෙ විසමෙසිනො
ජිඝච්ඡිතා'ව සමෙහාන්ති, පායසො'පායසොචකා.

3. යථා කිබ්බිසකාරී සො, සංවිග්ගො මිගලණ්ඩිකො,
සද්ධාය මාරදෙවස්ස, භිය්‍යො පාප'මසක්ඛිනී.

4. යථා විදස්ස හාතුස්ස, අනුයාතා මහාජනා
සඩාය කපිලස්සා'පි, අභවුං'පාය පූරකා.

5. තස්මා ලොකහිතං සාධු, පෙක්ඛමානො විචක්ඛණො,
අත්තත්ථඤ්ච පරත්ථඤ්ච, රක්ඛමානො'නුසාසයෙ.

6. චාපල්‍යං පරවම්භඤ්ච, අත්තුක්කංසඤ්ච සාහසං
මක්ඛං මානං පලාසඤ්ච, සාඨෙය්‍යං පරිවජ්ජයෙ.

7. "යසං ලද්ධාන දුම්මෙධො අනත්ථං චරති අත්තනො
අත්තනොච පරෙසඤ්ච හිංසාය පටිපජ්ජති."

8. "නෙව අනත්ථ කුසලෙන අත්ථචරියා සුඛාවහා
හාපෙති අත්ථං දුම්මෙධො, කොණ්ඩඤ්ඤෙව වාරුණිංයථා"

9. "මාවොච ඵරුසං කඤ්චි වුත්තා පටිවදෙය්‍යු තං
දුක්ඛා හි සාරම්භකථා පටිදණ්ඩාඵුසෙය්‍යුතං"

10. "පරවජ්ජානුපස්සිස්ස නිච්චං උජ්ඣාන සඤ්ඤිනො
ආසවා තස්ස වඩ්ඪන්ති, ආරා සො ආසවක්ඛයා"

11. "විවාදං භයතො දිස්වා අවිවාදඤ්ච ඛෙමතො
සමග්ගා සඛිලා හොථ, එසා බුද්ධා'නුසාසනී."

12. විනොදෙත්වාන සාරම්භං, ජනෙත්වා මුදුමානසං
බුද්ධො'වාදන්ති'මෙ සාධු, ධාරෙය්‍ය සපරත්ථිකො.

සිවමත්ථු.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු